sinhalaebooks.com




මෙම කෘතියෙහි සම්පූණර් අයිතිය සිතු ජයසිංහ සතුවේ.
කරුණාකර කතෘ අයිතිය සුරකින්න.
කියවීම පහසුව උදෙසා PDF ගොනුවක් ලෙස සකසන ලද්දේ - sinhalaebooks.com.

sinhalaebooks.com

"කොහෙද ඔය හැල්මේ දුවන්නේ සුද්දි කෙල්ලේ ඔහෙ නැවතියන්.. අනේ අම්මපා අතක් පයක් කඩා ගන්නේ නෑ කියලා ද මේකි. සුද්දීයේ....."

"ඉක්මනින් එන්නම් වෙද සීයේ. උක්කුන් මාමලාගෙ අඹ ගහේ අඹ පිරිලා. අච්චාරුවක් හදාගන්න අඹ ගෙඩි ටිකක් කඩාගෙන ඉක්මනින් එනෝ..."

"උඹ තනියෙන් ද ඔය ලඳු කැලෑ ගානේ රිංගන්නේ ඈ බන්.."

"නෑ නෑ හිච්චි මල්ලිලත් ඉන්නෝ.."

වෙද සීයාගේ ඇස් මායිමෙන් මිදුනු ආකශ්රා කඩුල්ල පැන බොරළු පාර දිගේ දිව යන්නට වූයේ අඹ කඩා ගැනීමට වඩා ගමේ කොල්ලෝ කෙල්ලෝ ටික එක්ක රංචු ගැසීමේ බලාපොරොත්තුවෙනි.
වයස අවුරුදු විසි දෙක යාන්තම් පිරීගෙන ආවත් ආකශ්රා තවමත් පුංචි එකියෙක් ගාණය. ආයුවෙර්ද වෛද්‍යවරියක් වීමේ බලාපොරොත්තුව ඇතිව ඉගෙනීම් කටයුතු වල යෙදෙන අතර බොහෝමක් විට තම සීයාගේ වෙද ගෙදර වෙද කටයුතු වලට උදව් පදව්වට යහමින් සැරසෙන ආකශ්රා ට වෙද සීයාම දාපු ආදරණීය නම "සුද්දී " දැන් මුළු ගම පුරාම සුප්‍රසිද්ධය.

සීයාගේ ඇස් මායිමෙන් බේරී පැන ගැනීම තරම් අසීරු කටයුත්තක් තවත් නැති තරම් ය. ඒ තරමට ආකශ්රා ව ඇහේ තියාන රකින්නට සීයා උත්සහ කරන්නේ සුද්දී යනු ඔහුගේ ප්‍රාණය සමාන අහිංසකී බැවිනි.

"අපේ ගමේ කාර් එකක්.."

කෙල්ල ඇවිදගෙන යද්දී ඉදිරියට එන මෝටර් රථය දෙස බලා හෙමින් සීරුවෙ තමාටම මුමුණාගත්තේ මේ ගමේ එය අහම්බයක් බැවිනි.
ගම්බද පරිසරයට මෝටර් රථයක් යනු අහම්බයකි.

"ඔව් නේ...කාර් එකක් තමා. මං හිතුවා හීනයක් කියලා"

කෙල්ල පාර දිගේම ඉදිරියට ඇදුනේ ඈතින් එන මෝටර් රථය දෙස බලමිනි.
බොරළු පාර දිගේ නොනැවතීම ඉදිරියට ඇදෙන මෝටර් රථය ගැන මහා ලොකු අවධානයකින් තොරව ආකශ්රා ඇයගේ පාඩුවේ ඉදිරියට ඇදුනේ හදවතින්ම පරිසරයේ සුන්දරත්වයට සම වැදෙමිනි.

නිල වර්ණයෙන් පාට ඇඳුනු සුන්දර නෙළුම්දෙණිය ගම්මානයේ ඒ සුන්දරත්වයට සුද්දී කොහොමත් ප්‍රිය කලේ පුංචි කාලයේ සිටම තිබුනු ලබැදියාව හා සුන්දරත්වය නිසාවෙනි.

sinhalaebooks.com

ගම සුන්දර කරන වැවත්, සාරවත් වූ කුඹුරු යායත් ගහ කොල තුරු ලතාවන්ගෙන් හැඩ ගැන්වුනු පරිසරයත් නෙළුම්දෙණියේ සුන්දරත්වය හරි හරියට කියාපාන්නේ මඟුලකට සැරසෙන මනාලියක් ලෙසිනි.

"මේ නංගි..."

ඉදිරියට ආ මෝටර් රථය තමා අසලින් නවතා රියදුරු අසුනේ සිටි තරුණයා , ආකශර්‍ා ට කතා කරද්දී ඇය පියවි සිහියට ආවේ මේ වෙද්දී ඇය සිටියේ වට පිටාවේ සුන්දරත්වය හා සමවැදී බැවිනි.
ආකශර්‍ා තරමක දඟකාරියකි.නමුදු ආදරණීය සිතැත්තියකි.

"මේ මටද"

"වෙන නංගිලා නෑ නේ මෙතන"

ඔහු තව දුරටත් ඇය හා වචන වලින් එල්ලෙද්දී ආකශර්‍ා උවමනාවෙන් මෝටර් රථය තුලට එබුනේ සැබෑ ලෙසම එය තුල හෝ ගැහැණු පුළුටක් බලාපොරොත්තුවෙනි.
ආසන වල තරුණයන් සිව් දෙනෙකි.

"නංගි නෙවෙයි මං සුද්දී..."

ආකශර්‍ා කිව්වේ ආඩම්බරයෙනි.

"අඩේ මේ බලපන්කෝ. මේකි. සුද්දි ලු මෙන්න. අප්පෝ හරි සුදු නේද බන්. තිදස් ඕයි මේ මෙන්න සුදු කෙල්ලො දැකලා නැත්නම් බලාගනින්.."

"අඩෝ එපා අකලංකයා..."

"හා හා උඹම එහෙනම් අහපන්කෝ..."

රියදුරු අසුනේ සිටි තරුණයා විහිලුවෙන් කියද්දී ඔහුට එහා අසුනේ සිටි තරුණයා ආකශර්‍ා දෙස බැලුවේ ඇයගෙන් යමක් දැන ගැනීමේ අරමුණිනි.
මෝටර් රථයේ සිටි තරුණයින් සිව් දෙනාගේ නෝක්කාඩු හා විහිලු තහළු නිසාවෙන් ආකශර්‍ා ගේ මුහුණ ජම්බු ගෙඩියක් මෙන් රක්ත පැහැ ගැන්වී තිබුනේ ලැජ්ජාව මෙන්ම කේන්තියද නිසාවෙනි..

"නංගී මේ ලඟද අර වෙද සීයා කෙනෙක් ඉන්නේ"

එක් තරුණයෙක් අසද්දී ආකශර්‍ා තත්පර කිහිපයක් නිහඬ වුනේ සිදුවෙන කිසිවක් අදහාගත නොහැකි නිසාවෙනි. ඔවුන් අසන්නේ තමන්ගේ සීයා ගැන යැයි මතක් වෙද්දී ආකශර්‍ාට විවිධාකාර අදහස් පහල වුනත් සීයා මුණ ගැහෙන්නට එන්නේ අනිවායර්යෙන් ම

sinhalaebooks.com

අසනීපයක් සඳහා බැවින් ආකශ්රා නිහඬ වුනේ ලෙඩත් සමග විහිලු අනවශ්‍ය බව අත්දැකීමෙත් දන්නා බැවිනි.
ඇයද අනාගත වෛද්‍යවරියකි. ඒ නිසාම ලෙඩ ගැන යම් දැනුමක් ඇයටද පවතී.

"ඔව් ඔහොමම ඉස්සරහට යන්නකෝ.අර පේන තුන් මං හන්දියෙන් දකුණට හැරුනාම දෙවනි ගෙදර.. ඒක තමා වෙද ගෙදර"

"හරි බොහොම ස්තූතියි. අපි ගිහින් එන්නම්"

ඔවුන්ට සමුදුන් ආකශ්රා ආයෙම ඉදිරියට ගමන් කරන්න වූයේ සිනහවක් ද මුවේ රඳවාගනිමිනි.

"ගිහින් එන්නම් කිව්වට ඉතින් යන්න වෙන්නැනේ. අනිවායර්යෙන් වෙද සීයා නවත්තගෙන නේ බෙහෙත් කරන්නේ. එහෙව් එකේ ඉතින් චණ්ඩි වගේ ගියාට එහෙ ඉන්නම ඕනෙ නෙ. හරි බලාගමුකො එහෙනම්."

තරුණයන් ගැන හිත හිතා ආකශ්රා ඉදිරියට පා තබන්නට විය. අරමුණ අඹ කැඩීමට වඩා කොල්ලෝ කෙල්ලන් එක්ක වැව් තාවුල්ලේ නැටීම වුනත් තාමත් කිසිම හාවක් හූවක් නැති නිසාදෝ ආකශ්රාගේ හිතටද මහත් වූ කම්මැලිකමක් දැනෙන්නට විය..

"සුද්දි අක්කේ...."

එක්වරම වැව් තාවුල්ල දෙසින් ඇසුනු හඬට අවධානය යොමු කරමින් ඒ දෙස බැලූ ආකශ්රා ක්ෂණික නැගුණු සුන්දර සිනහවෙන් ඒ දෙසට දිව ගියේ මිටින් හල කිරිල්ලක් ලෙසිනි.

"කෝ හිච්චි මල්ලී අනිත් අය"

"ඔක්කෝටම අද හවස ඉස්කෝලේ පන්තිලු සුද්දී අක්කේ"

"එතකොට ඔයා...හොරෙන් පැන්නද ඈ"

"නෑ අද මං ඉස්කෝලෙ ගියෙ නෑ. කට්ටිය ම නැතුව පාළුයි සුද්දි අක්කෙ. මාත් මේ ආපහු ගෙදර යන්න කියලා."

"හා ඉතින් එහෙනම් යමු. මටත් බෑ කට්ටියම නැතුව නම්."

දැනුනු කම්මැලිකම හා පාළුව නිසාවෙන් ඒ මොහොතේම ආපසු හැරුණු ආකශ්රා ආපසු නිවසට එන්නට බොරළු පාරට ගොඩ වුනේ කිසිදු අදහසකින් තොරවය.

දැන් ඉතින් ගෙදර යන්නත් එපැයි. අපරාදෙ බොහෝ ම අමාරුවෙන් වෙද සීයාගෙන් බේරිලා පැනගත්තෙ. ඔක්කෝටම හපන් දැන් අර නසරානි ටික වෙද ගෙදරට ගිහින් ඇති.අයියෝ

sinhalaebooks.com

මටත් වෙන දේවල් කොහොම මූණ දෙන්නද සමාජෙට. මොන නැකතින් අද මං නැගිට්ටද දෙවියනේ...

ආකශ්රා ඒ ගැන කල්පනා කර කර නිවසට ලං වුනු අතර සද්ද නොනැගෙන සේ කඩුල්ල පහත් කර වත්තට ඇතුළු වූයේ කාටත් නොදැනෙන ලෙසය. පාර අයිනේ නවතා තිබූ මෝටර් රථය දෙස ආයෙත් හැරී බලා වෙද ගෙදර දෙසත් බැලුවේ නසරානි සිව් දෙනා කොයි දෙසකද යන්න පැහැදිලි ව දැක බලා ගැනීමේ බලාපොරොත්තුවෙනි.

"සුද්දි කෙල්ලේ"

යාන්තම් මිදුලට සේන්දු වූවා පමණී.

සියලු නිහැඬියාවන් අතරින් වෙද සීයාගේ හඬ ඇසෙද්දී ආකශ්රා මිදුලේම ගල් වුනේ සීයා සමග කතා බහා කරමින් සිටි තරුණයන් දෙසද බලමිනි.
ඔවුන්ද එක් වරම ආකශ්රා දෙස අමුතු බැල්මක් හෙලද්දී රියදුරු අසුනේ සිටි තරුණයා හඬ අවදි කලේය..

"මේ අර අරයානේ"

"කවුද"

සීයා අසනු ආකශ්රා ටද ඇසිණි...

"මෙයාගෙන් තමා වෙද මහත්තයෝ අපි පාර අහගත්තේ"

"අහ්...මේ මගෙ මිණිබිරී නේ. මෙයා තමා වෙද කම් වලට මට උදව් කරන්නේ"

"ඉවරයි එහෙනම් අපේ තිදසයා"

ඉස්තෝප්පුවට පැමිණි ආකශ්රා ට පමණක් ඇසෙන්නට එක් අයෙක් කිව්වේ සිනහවෙමිනි..
බොහොම අමාරුවෙන් කට කොනට ආ සිනහව ආකශ්රා ද පාලනය කර ගනිමින් සීයා දෙස බැලුවේ ඊලඟ නිමේශයේ කුමක් වේද යන බලාපොරොත්තුවෙනි.

"සුද්දි කෙල්ලේ. මේ ලමයින්ට තේ ටිකක් ලෑස්ති කරපන් කෙල්ලේ. තාම මොකුත් දී ගන්න බැරි වුනා"

"හා සීයේ"

වෙද සීයා දෙසත් තරුණයන් දෙසත් මාරුවෙන් මාරුවට බැලූ ආකශ්රා ගේ තුලට දිව ගියේ හිතට දැනුනු ලැජ්ජාවද සමඟිනි...

" වැඩිහිටි කව්රුත් ආවේ නැද්ද දරුවෝ"

sinhalaebooks.com

"නෑ වෙද මහත්තයෝ. එහෙම කවුරුම හරි ඕනෙද ?"

"ඕනෙම කියනවා නෙවෙයි. ආවොත් තේ වඩා හොඳ. අනික ඉතින් මේවා මේ උදේ හවහ ඇවිත් ගිහින් කරන්න පුලුවන් වෙදකම් නෙවෙයි තේ දරුවෝ. එහෙම කරන්න බැරි කමක් නෑ. ඒත් ඉතින් දුර වැඩී. ඒ හින්ද ටික දොහක් මෙහෙ නැවතිලා හිටියනම් තමා හොඳ.ඕවා ඉතින් තේරුම් කොරලා දෙන්න වැඩිහිටි කවුරුහරි ආවා නම් තමා හොඳ කියලා මං මේ කියන්නේ. ආ හා හා ඒකට කාරියක් නෑ දැන්. කෝ එමු බලන්න ලෙඩා මෙහාට"

වෙද මහත්තයාගේ අනුදැනුම මත තිසත් අසුන්ගෙන සිටි ආසනයෙන් නැඟී සිට බංකුවක් මත අසුන් ගද්දී අකලංක ඇතුළු අනෙක් දෙදෙනා ඒ සියල්ල දෙස උවමනාවෙන් බලා හිදින්නට විය.

කාලයක් පුරා තිසත්ට ඇති අධික හිසේ කැක්කුම හේතුවෙන් මෙවැනි ප්‍රතිකාරයක් සඳහා අවධානය යොමු කරන්නට ප්‍රධානම අඩිතාලම අකංලක දැමූවත් තිදස්ගේ නිවසින් ලැබෙනේ එතරම් යහපත් ප්‍රතිචාරයක් නොවුනත් , අසීරුවෙන් ලබාගත් කැමැත්ත එක්ක මේ සඳහා දින වේලාවන් යොදා ගත්තේ තරුණයන් විසින් මය.
බටහිර බෙහෙතෙන් සුවයක් නොවූ බැවින් අවසානම උත්සහය ලෙස මේ පියවර තැබූවත් මේ ගමන ගැන තිදස්ගේ නිවසින් මහා ලොකු කැමැත්තක් නොවුනු බැවින් යහළුවන් පමණක් මේ ගමනට එක් වූයේ තිදස් විදින වේදනාව හේතුවෙනි.

"සීයේ තේ.."

"අහ්.. ඔන්න ඔය දරුවන්ට ඕක දීලා මෙන්න මෙහෙට වරෙන්කෝ කෙල්ලේ..."

ගෙනා තේ බන්දේසිය තරුණයින් ට පිලිගැන්වූ ආකශර්‍ා සීයාගේ දැනුම් දීම මත ඔහු අසලට ගියේ ඊලඟට මොන දෙයක් කරන්න සිද්ධ වේදැයි දහස් වාරයක් සිතමිනි.

"මං යනවා කසාද මුට්ටය තබ්බාගන්න. මේ දරුවටයි එයාගෙ යාළුවෙක් නවතිනවා නම් එයාටයි අර කාමරේ හදලා දීපන් සුද්දියෙ. අහ් තව දෙයක්. මේ දරුවගෙ ඔලුවට අර තෙල් බෙහෙත් බෝතලෙන් ටිකක් දලා අත ගාන්න. අදට ඔහොම හිටපුදෙන් හෙට ඉදලා බෙහෙත් පටන් ගමු.

"හා සීයේ"

හෝරාවක් ගෙවීගෙන යද්දි ආ තරුණයින් ව ආපසු පිටව ගිය අතර තිදස්ගේ උවමනාවට අකංලක පමණක් නැවතුනේ තිදස්ගේද බලවත් ඉල්ලීම නිසාවෙනි.
ඉස්තෝප්පුවේ රැඳී සිටි තරුණයින් දෙදෙනාව මහ හැරි ආකශර්‍ා වෙද සීයාගේ අනුදැනුම මත ඔවුනට කාමරයක් සූදනම් කිරීමට වෙද ගෙදර කාමරයක් වෙත සේන්දු වූයේ අසිහියෙන් මෙණි.

sinhalaebooks.com

නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන් වෙද ගෙදරට අරුමයක් නොවුනත් තිදස්ගේ පැමිණීම එක්ක ආකශර්‍රාට අමුත්තක් දැනෙන්නට විය. ඒ කුමක්ද යන්න දහස් වතාවක් සිතුවත් තවමත් තේරුම් ගන්න බැරි හැඟීම එක්ක ආකශර්‍රා කාමරය සූදානම් කරන්නට විය.

"සුද්දී.."

පිටුපස හැරී සයනය සකස් කරමින් සිටි ආකශර්‍රාගේ අවධානය බිඳිමින් ඇසුනු නුහුරු හඬට ගැහැණු හිත ගැස්සී යද්දී යාන්තම් ඇස් කොනින් ඒ දිහාවට ඔළුව හරවා බැලුවේ ඒ හඬ පිරිමි හඬක් බැවිනි.

" ම් මේ ඔයා. ත්තාම කාමරේ හදලා අස් කරලා ඉවර නැතේ. තව චුට්ටක් එලියෙන් ඉන්නවද"

ආකශර්‍රා කිව්වේ ඔහුගේ මුහුණ දෙස කෙලින්වත් නොබලාය.
ඒ ඔහුය.

තිදස්..

ආකශර්‍රාව එක දසුනකින් වෙහෙසකට පත් කරන්නට තරම් සමත් වූ ඒ පිරිමි මුහුණ ඇය ඉදිරියේ දිස් වෙද්දී ආකශර්‍රාව හැගෙන්නට වූයේ හේතුවක් වත් නැතුවමය.

" චූටි වෙද නෝනා. සීයා කිව්වා නේද මගෙ ඔලුවට බෙහෙත් තෙල් දාන්න කියලා. මං මේ ඒක කියන්න ආවෙ.."

ගාණකටවත් නොගෙන තිදස් කියද්දී ආකශර්‍රා අමාරුවෙන් උත්සාහ කලේ වචන ගැටගසා ගන්නටය.

"අහ් හරි. ම් මේ මං කාමරේ හදලම එන්නම්කෝ."

මෙයාට මෙච්චර හයියක් ආවේ කොහොමද අහන්නෙවත් නැතුව කාමරේට එන්න. අනික කෙල්ලෙක් කාමරේ ඇතුලේ ඉද්දි. කොයි දන්නෑ අනිත් පෝරි සාදයෝ ටික.
බලාගෙනත් ඉන්නවා නේ තව හිතාවෙවී මෙතෙන්ට වෙලා. ආස ඇති මට කියලා ඔලුවට තෙල් දාලා අත ගාව ගන්න.
ඇත්තටම අපේ වෙද සීයටත් මොනවා වෙනවද මන්ද එක පාරටම. මෙහෙම ඒවා මටම භාර දීලා යන්නේ.

ආකශර්‍රා තනිවම සිතන්නට විය.

"මේ..කෝ අර පාරෙදි අපිට සද්දෙ දාම්ම හිතුවක්කාර කෙල්ල. ඇයි දන්නෑ සද්දෙ වහලා."

sinhalaebooks.com

තිදස් උත්සහ කලේ ආකශ්රා සමග සංවාදයේ යෙදීමට වුවත් ඔහුව මග හැරීමේ දැඩි උත්සහයක ඇය යෙදෙන්නට විය.

"ඔහොම ඉන්න. මං තෙල් දන්න අරගෙන එන්නම්."

ආකශ්රා උත්තර නොබැඳම කාමරෙන් එලියට ආවේ තිදස් සමඟ හිත් නෝක්කාඩුවෙනි.

කළු පාටට දිලෙසෙන ඉන ගාවට දිග කිතුල් රැනක් මෙන් කඩාහැලෙන කේශ කලාපය,
ඇඹූ පිලිමක් සේ දිදුලන අපූරුම රූ සපුව,
ලා රත් පැහැ ගැන්වුනු නා දළු වන් දෙතොල,
කතා කරන ඇස්,
ඊටත් වඩා හිත වශී කරන හඬ,

සැබවින්ම ආකශර්නයකි.

වචන පරිසමාප්ත අර්ථයෙන්ම ඇය ආකශර්ාය.

තිදස් මේ සියලු හැඟීම් දැනීම් හා සිතුවිලි එක්ක ආකශ්රාගේ පංච කල්‍යාණයේ අතරමං වෙද්දී ඇය කාමරයෙන් පිටව ගියේ තිදස් හට හදවතින් නෝක්කාඩු කියමිනි.

"මොනවට කාමරේට ආවද මේ මනුස්සයා. අනේ මන්ද ඇයි අනේ ඔච්චර ඉවසන්න බැරිද කාමරේ හදලා දෙනකල්. ලැජ්ජාවක් කියලා එකක් නැද්ද දන්නෑ"

විසිත්ත කාමරයට විත් බෙහෙත් සේප්පුවේ බෙහෙත් බෝතලය හොයන ගමන් ආකශ්රා තිදස්ට බැන වදින්නට වූයේ තනිවමය..

"අපේ තිදසයට නේද නංගී ඔය කුටු කුටු ගාලා බනින්නේ"

ආකශ්රා එක් වරම හැරී බැලුවේ ඒ හඬ ආපු දිහාවය.

ඒ ඔහුය.
රියදුරු අසුනේ සිටි තරුණයා ඔහුය...

"ඔයා..මෙතන. එතකොට ඔයා ගියෙ නැද්ද. තව කී දෙනෙක් නැවතුනාද අහ්. මේක පුදුම වැඩක් වුනානෙ දැන් යන යන තැන මෙයාලා.මට නිදහසේ දැන් වෙද ගෙදර ඇවිදින්නවත් බැරිද"

"හෝ හෝ කෑ ගහන්න එපා පුංචි වෙද නෝනා.මං විතරයි ඉන්නෙ අනිත් උන් දෙන්නා ගියා"

"ඉතින් ඔයානෙ ඩ්‍රයිවර්"

sinhalaebooks.com

"හරි ඉතින් අනිත් උන්ටත් ඩ්‍රයිව් කරන්න බෑ කියලා කවුරුත් කිව්වෙ නෑ නේ"

"හ්ම්...තව ටිකක් ඔහොම ඉන්න. අරයට බෙහෙත් කරලා ඉවර වුනාමම කාමරේට එන්න"

"අහ් හා හා..හරි හරි ඔයා බෙහෙත් කරගන්නකො. මොකටද නිකන් අපි ප්‍රශ්නයක් වෙන්නේ නේද"

"මොකක්...."

"නෑ මේ මොකුත් නෑ"

අකලංක දෙස ගස්සා බැලූ ආකශ්රා එතනින් මෑත් වී නැවතත් ආගන්තුක රෝගින් වෙනුවෙන් වෙන් වූ කාමරය වෙත පියවර තබන්නට වූයේ සිතහසෙමිනි.

තිදස් ලඟ ගොළු වූ ආකශ්රා අකලංක ලඟ ගිරව්යක් වැනිය.
තිදස් ලඟ සීතල වූ ගල් වූ ආකශ්රා අකලංක ලඟ දඟකාරය.

ඒ ඇයිද යන්න ඇයටම වූයේ ප්‍රශ්නයකි.

තිදස් හා ඇය අතර මොකක්දෝ සම්බන්දයක් තිබෙන සේයාවක් ඇයට දැනෙන්නට විය. එය ආත්මීය සම්බන්දයක් වැනිය.
නමුදු ප්‍රේමයක් හෝ ඊට සමාන දෙයක් නොවන බව ආකශ්රාට හොදටම විශ්වාසය..

තිදස් දකින වාරයක් පාසා ආකශ්රාව ගැස්සී යන්නේ ඇයි දැයි ඇයටම ප්‍රශ්නයකි.

මං කවදාවත් මෙයාව දැකලා නෑ. ඒත් ඇයි මේ මනුස්සයා දකිද්දී මට මාවම පාලනය කරගන්න බැරි. ඇයි මෙයාව දකිද්දී මාව සීතල වෙලා යන්නේ. දෙවියනේ මොකක්ද මේ වෙන්නේ..

කාමරය යන අතරතුර ආකශ්රා කල්පනා කල අතර ඇයටවත් නොදැනී ඇය කාමරයට එද්දී තිදස් හිටියේ සයනය මත අසුන් ගෙන ජනේලයෙන් ඉවත බලාගෙනය..

"බෙහෙත් දැමුද"

තිදස්ගේ දැහැන බිදින්නට ආකශ්රා ට හැකිවිය.

"හ්ම්ම්....."

ඔහුගෙන් ලැබුනේ කෙටි පිලිතුරකි.

sinhalaebooks.com

ඔහුගේ අවසරය එක්ක සයනය අසලට ගිය ආකශ්රා බෙහෙත් බෝතලයෙන් බෙහෙත් තම අල්ල මතට ගෙන බෙහෙත් බෝතලය පසෙකින් තැබුවේ තිදස්ගේ වෙනස් වුනු මුහුණ දෙසද උවමනාවෙන් බලමිනි.
"ආකශ්රා"

"මම්මම්ම්...."

ආකශ්රාගේ හිස් පිරිමැදීම එක්ක දැනුනු සනීපය නිසාම තිදස් කතා කරන්න ගත්තේ දෑස් පියාගනිමිනි. සැබවින්ම එය පුදුමාකාර සනීපයකි. මෙපමණ කාලයක් පුරාවට කලා වූ කිසිදු සත්කාරයකින් නොලද අපූරුම සනීපයක් හා සුවපත් බවත් තිදස්ගේ හිසට මෙන්ම හිතටත් දැනෙන්නට විය. ආකශ්රාගේ එක ස්පශර්යකින් ලද ඒ සැනසීම එක්ක තිදස් කතා කරන්නට වූයේ වචන වලින් පවා ඔහුට සැනසීමක් බැවිනි

" ඔයා මීට කලින් මාව දැකලා හරි කතා කරලා හරි තියනවා ද ආකශ්රා. මට ඔයාව සැහෙන්න හුරුපුරුදු ගතියක් දැනෙනවනේ. ඒත් ඒ කොහෙ කොහොම හුරු පුරුද්දක් ද කියලා මට තේරෙන්නෑ. ඒත් අනේ මන්ද"

"ම් මොක්කක්..."

සැබවින්ම ආකශ්රාව ගැස්සී ගියේය.
ඒ ඇයට දැනෙන්නා වූ ඒ හැඟීම ඔහුටද දැනෙන්නට වූ නිසාවෙනි. නමුදු ඒ ගැන කතා කිරීමට උවමනාවක් හෝ ආසාවක් ඇයට නොතිබුනේ ඒ තුලින් යටි හිත ඇවිස්සෙන්නට පටන් ගන්නා බැවිනි

"හ්ම් ඔව්. ඇත්තටම කිව්වේ"

"මගදි එකපාරටම දැක්ක හින්ද වෙන්න ඇති. නැත්නම් ඉතින් මේ නෙළුම්දෙණියෙන් පිට මං කොහෙවත් ගිහින් නැනේ තිදස්. අනික ඉතින් ඔයා වුනත් මේ පැත්තේ ඇවිත් ඇතියි කියලා මං නම් හිතන්නේ නෑ. ඕවා හිතන්න එපා මේ අසනීප එක්ක. අනික ඕනවට වඩා කල්පනා කරන එක ඔයාගෙ ඔලුවට හොඳ නෑ. අහ් තව දෙයක්. අද ඔලුවට බෙහෙත් දාපු හින්ද නාන්න එපා. හරිද."

"හ්ම්ම්ම්.. හා චූටි වෙද නෝනා."

ආකශ්රා උත්සහ කලේ කතාව මග හැරීමටය.

"යාළුවා එළියෙ. දෙන්නත් එක්ක ඇඟ සෝදගෙන ඇඳුම් මාරු කරගන්න. වෙද සීයා හවස කතා කරයි. කොහොමත් හෙට ඉඳලා බෙහෙත් පටන් ගන්නවානේ"

දැඩි උවමනාවෙන් කාමරෙන් එළියට ආ ආකශ්රා දිව ගියේ ඇයගේ කාමරයටය. වෙද ගෙදර නවාතැන් ගන්නා රෝගීන් වෙනුවෙන් සකස් වූ වෙනම කොටසකින් සමන්විත වන අතර ඒ

sinhalaebooks.com

කොටස කාමර කිහිපයකින් කුඩා විසිත්ත කාමරයකින් හා ඉස්තෝප්පු කොටසකින් සැඳුම් ලත් අතර එය පාරම්පරිකව වෙදකම පවත්වාගෙන ආ ගොඩනැගිල්ලක් බව ආකශර්‍ාද දැන ගත්තේ වෙද සීයාගෙනි. එයට මීටර් සීයක් පමණ එපිටින් වූ ආකශර්‍ාත් ඇයගේ මවත් පියාත් එකම නැගණිය දහම්සාත් වෙද සීයාත් වෙසෙන තරමක් විශාල නිවස ආකශර්‍ාගේ එකම සැනසීමය.
තිදස්ගේ වචන වලින් දැනුනු විඩාව නිසාම ඔහුව මග හැර සුලඟක වේගයෙන් දිව ආ ආකශර්‍ා ඒ පිම්මෙන්ම සයනයේ වැතිරුනේ ගතට මහන්සියක් නැතත් හිතට මහන්සි බැවිනි.

"මොකද සුද්දියේ මේ. ඇඟට වත් අමාරුවක් ද"

"නෑ අම්මේ ඔලුව පොඩ්ඩක් කැක්කුමයි වගේ"

දුවගෙන ආ සුද්දිගේ වෙනස නිසාම කමනී ඇසුවේ එතරම් වෙනසක් සාමාන්‍යයෙන් සුද්දීගෙන් නොදකින බැවිනි.

"හාන්සි වෙලා හිටින්කො මං බොන්න මොනවාහරි තම්බන්නම්. අර කොල්ලෝ කුරුට්ටෝ එක්ක වැව් ගානෙයි ලඳු කැලෑ ගාණෙයි රිංගන්න එපා කිව්වට අහන එකක් යෑ. අනික ගිණි මද්‍යහනේ ඕවගෙ යන්න එපා. හවසට ඔලුවෙ කැක්කුම අල්ලන්නේ එත්ස්කොට"

"අද සෙල්ලම් කරන්න ගියෙ නෑ මං. ඔක්කෝටම ඉස්කෝලේ හවස පන්තිලු. මාත් ආපහු වෙද ගෙදරට ආවා. අනේ මේ සීයත් ඔක්කෝම අම්මගෙ කනේ තියනවා නේ"

"නංගි ගෙදර ආවෙත් නෑ තාම පන්ති හිත්ද වෙන්න ඇති. හා හා ටිකක් ඇලවෙයන්කො මං මොනවාහරි හදනකල්."

කමනී එතනින් එහාට වුනේ ආකශර්‍ා ගේ හැටි දන්නා බැවිනි. ඕනැවට වඩා ආකශර්‍ාගේ ලෙඩ ගැන සැලකිලිමත් වුවහොත් නැති ලෙඩත් ඇඟට ගෙන වැඩියෙන් ලෙඩ පෙන්නන්නට ඇය හපනියෙකි.
වෘත්තීයෙන් හෙදියක් වූ ආකශර්‍ාගේ මව තම දියණියන් දෙදෙනා ප්‍රාණ සමව රකිනු ලබන්නේ ඊටත් එහා ලෝකයක් ඇයට නොමැති බැවිනි.
ආකශර්‍ාගේ තරමක දඟකාර බව විටෙක කමනීට හිසරදයකි.
කොයි මොහොතක අනතුරකට මුහුණ දේ දෝයි බිය නිතරම ඇය වටා ම රැඳී පැවතුනත් විටෙක ඒ දඟකාර බව සියල්ලන්ගේම සතුටටද හේතුවක් වෙන්නේ ඒ තරමට ආකශර්‍ා ට සියල්ලෝම ප්‍රේම කරනා නිසාවෙනි.

"කමනියෝ...සුද්දි කෙල්ල ආවද"

සුද්දී ඇදේ හාන්සි වී කල්පනා ලෝකයේ අතරමං වී මොහොතක් ගත වෙත්ම වෙද සීයාගේ හඬ ඇසෙන්නට විය.

ඒ ඔහුගේ පුරුද්දය.

sinhalaebooks.com

සුද්දී ඔහුගේ දෑස් මානයෙන් මිදෙන්නේ යම් මොහොතකද ඊට තත්පර කිහිපයකට පසු ඔහු සුද්දීව සොයන්නේ පැය ගාණකින් නොදුටු අයෙකු ලෙසටය. ඒ තරමය වෙද සීයා සුද්දීව රැක්කේ ඇහේ තියාගෙනය.

"ඔව් අප්පච්චි. ඔලුවෙ කැක්කුමක් කියලා කෙල්ල ටිකක් හාන්සි වුනා"

"අනේ අප්පේ හරි ශෝක් වෙද නෝනා. මදැයි මං එක වෙදෙක් ට ලෙඩෙක් ව භාර දීලා ආවා"

කුටු කුටු ගාමින් වෙද සීයා වෙද ගෙදර දිහාවට හීන් අඩි තියනවා ආකශ්රාත් බලා සිටියේ කාමරේ ජ්නේලය මදක් අරිමිනි. වෙද ගෙදර පැත්තට ජනේලය වූ කාමරය තමා වෙනුවෙන් ම ආකශ්රා තෝරා ගත්තේ දැනුම් තේරුම් ඇති කාලයේ සිටමය.
ඒ ඇයගේ කැමැත්ත හේතුවෙනි. ඒ එක්කම ඇය ටිකෙන් ටික වැඩෙත්ම ආයුවෙර්ද වෙදකම ගැන වැඩි නැඹුරුතාවයක් දක්වන්නට වූයේ එය පරම්පරාවෙන් ම ලද උරුමයක් බැවිනි.

"කොහොමද කොල්ලන්ට මෙහෙ ටිකක් සුවපහසු මදි වගේද. ම්ම්ම්. කරන්න දෙයක් නෑ හොද වෙන්න ඕනෙනම් ඉතින් මෙහෙම ඉන්න වෙනවා ටික දොහක් යනකල්."

තිදස් හා අකලංක ගේ කතා බහට බාධා පමුණුවමින් කුටියට ආ වෙද සීයා කිව්වේ තරමක් ගැඹුරු හඬිනි.
ඝනව වැඩුනු සුදු රැවුලත් කෙස් නැති හිසත් ඔහුව අපූරු වෙදකුගේ ස්වරූපයක් පෙන්නුම් කලේය.
මහා ලොකුවට සැර පරුස බවක් නැත්තත් තිදස් හා අකලංක ඔහුගේ පෙනුමට බියකට වඩා ගෞරවයක් දක්වන්නට විය.

"එහෙම නෑ වෙද මහත්තයෝ. මීටත් වඩා සුවපහසුවක් මොකක්ද ඉතින්. හරි ලස්සනයි මේ පරිසරය"

"ඔව් දරුවෝ. මේ ගම් හරි ලස්සනයි. නුවර ටවුමෙනුත් හැතැප්ම ගාණක් ඇතුලටනේ. මේ ලමයි නුවර ටවුමෙම කිව්වා නේද"

"ඔව් වෙද මහත්තයෝ. සමහරවිට අහලත් ඇති දිසානායක කියලා බිස්නස් මන් කෙනෙක් ඉන්නවා. ඒ අපේ තාත්තා. තාත්තිලාට බිස්නස් වැඩ නේ. එන්න වත් වෙලාවක් නෑ මේවට"

තිදස් කිව්වේ තරමක් හිත් අමනාපයෙනි. තාත්තා හා අම්මාගේ කිසි උනන්දුවක් මේ පිලිබඳව නොතිබීම ගැන ඔහු හිටියේ තරමය කලකිරීමකිනි.

"අනේ මං නම් ඕවා දන්නෑ කොල්ලෝ. අපි මේ ගම් වලින් එලි බහින එකක් යෑ. ඔන්න ඔහේ අහල පහල ගම් හතර සීමාව දන්නවා මිසක් එතනින් එහාට රටක් රාජ්‍යක් ගැන

sinhalaebooks.com

මහා ඉහලින් දන්නෑ. හැබැයි ඉතින් වෙදකමට එන අය නම් ඕවා මේවා ගම් ගැන කියලා යනවා. එකක් කියලා මතක තියාගන්නයෑ. මේ ඇහුවා මේ අමතක කලා"

"ඔව් නේද වෙද මහත්තයෝ"

"අපේ වෙද නෝනා කියන්න ඇතිනේ කරන්න ඕනෙ විදිය ගැන. හෙට උදේ ම වැඩ පටන් ගමු. පුංචි වෙද නෝනටත් ඕන් ඔලුවෙ කැක්කුමක් කියලා නින්දකට ලෑස්ති "

"අනේ එහෙමද. ඔව් අපිට කිව්වා."

"හරි එහෙනම් මං යන්නම්. දැන් ටිකක් මහන්සි ඇර ගන්නකෝ."

වෙනස් නොවූ ගැඹුරු හඬින් පැවසූ වෙද සීයා කාමරයෙන් පිටත්ව යෑමෙන් අනතුරුව තිදස් හා අකලංක ආයෙම සයනයේ අසුන් ගත්තේ නතර කල කතාව පටන් ගැනීමේ අරමුණිනි දැන් තිදස් ගේ ඔලුව හිටියටත් වඩා විකාරය. ඒ විකාර වීමට හේතුව ආකශ්‍රා බව තිදස් වගේම අකලංකත් දනී.

"මං නම් කියන්නේ ආත්ම බැඳීම් මගුලක් නෙවෙයි බන්. උඹ ඒකිට ලව්"

"පිස්සුද අකලංකයා උඹට. දැක්ක ගමන් ලව් කරන්න. අනික බන් අපි මේ කෙල්ලො නැති පලාතක ඉඳලා ආවායෑ.උඹටත් පිස්සු හැදීගෙන එනවනේ"

"තිදසා මේ අහපන්. කෙල්ලො නම් හිටියා ඒක ඇත්ත. හැබැයි බන් මේකිව දැක්ක ගමන් ඒ කෙල්ලො ඔක්කෝම තිකන් ම තිකන් හාල් කැලි වගේ කියලා හිතෙන්නෙ නැද්ද. ඔටෝ සුදු වුනු ඒ කෙල්ලො වගේද යකෝ මේකි. බොරු ඕන්නෑ මං නම් ටිකක් උවමනාවෙන් බැලුවා"

"අකලංක මේ.. විකාර කරන්න එපා"

"අන්න අන්න ආන්න බලපන් ඉතින්. මං ඒකි දිහා බැලුවා කියද්දිත් උඹට ඩෝං යනවා. හිතට සුදු හුණු ගාන්න එපා බොක්ක. දිය වෙනවා. වෙන මගුලක් මෙතෙන්ට නෑ ඒකි දැක්ක වෙලාවෙ ඉඳලා උඹ ඒකිට ලව්. එච්චරයි."

"අඩේ ඒත් මෙයා මං මීට කලින් දන්නවා කියලා තේරෙනවානේ"

"එහෙනම් ඉතින් ගිය ආත්මෙත් මේකිට උඹ ලව් කරන්න ඇති වෙන ඉටි ගෙටියක් නෑ. හරි ඒ කතාව ඇති. වරෙන් ඇඟ පොඩ්ඩක් හෝදගන්න යන්න."

"හ්ම්ම්ම්....අරකිටත් ඔලුව රදයක් කිව්වා නේද "

"ඔය මං කිව්වේ. උඹට දැන් ආපු ලෙඩේට නෙවෙයි බෙහෙත් කරන්න වෙන්නේ. ලව් මේනියාවට. මෙහෙ වරෙන් යන්න"

sinhalaebooks.com

තිදස්ව සයනයෙන් නැඟිට්ටවාගත් අකලංක ඔහු සමඟින් කුටියෙන් පිටවී වෙද ගෙදර පිටිපස ඇති දොළ පාර දිහාවට ගමන් ගන්නට වූයේ ඇඟට දැනෙන සියුම් තෙහෙට්ටුව නිවාගැනීමේ බලාපොරොත්තුවෙන් වුවත් ආකශ්රා ගේ සිතුවිල්ල තිදස්ගේ හිතට දිගින් දිගටම වද දෙන්නට විය..
"අලුතෙන් වෙද ගෙදරට ආපු පුතාලා දෙන්නෙක් ගැන අප්පච්චි කිව්වේ ඒ ඔයාලා වෙන්න ඇති"

එක් වරම පිටු පසින් ඇහුණු නුපුරුදු හඬ එක්ක තිගැස්සුණු තිදස් වගේම අකලංකත් ආපහු හැසී බැලුවේ සත්තකින්ම ඒ කවුරුන්ද යන වගයි.

ඇයගේ රුව නුපුරුදුය.
මේ ගෙවුනු හෝරා කිහිපය පුරාවට දුටු රූප අතර ඇයගේ රුව නොතිබූ බව සක් සුදක් සේ පැහැදිලිය. නමුදු ඇය මේ ගෙදර ප්‍රධාන තැනැත්තියක් බවට තහවුරු කරගන්නට වැඩි වේදනාවක් නොගියේ ඇයගේ කතා බහ සමඟිනි.

"ඔව්. අපි තමයි"

තරුණයින් දෙදෙනා ඇය දෙස හෙලුවේ මදක් ප්‍රශ්නාර්ථ බැල්මකි.

"මුහුණ අමුතු කලේ මං කවුද කියලා දන්නෙ නැති හින්ද වෙන්න ඇති නේද. මං ඉතින් වෙද මහත්තයාගේ ලේලි. එහෙම නැත්නම් මේ පුංචි වෙද නෝනගේ අම්මා. හරි දොල පැත්තට ගිහින් නාගෙන එහෙම එන්නකෝ. පස්සේ කතා කරන්න බැරියැ"

කමනි කිව්වේ සිනා මුසු මුහුණෙනි.

ආකශ්රා වෙතින් දුටු ඒ සුන්දරත්වය ඒ ප්‍රිය මනාප පෙනුම ඇය වෙතින් ද තරුණයින් ට පෙනී ගියේ ඇයගේ කතා විලාසය හේතුවෙනි.

"අඩෝ තිදසය. උඹේ නැන්දම්මා නේද ?"

"කෑ ගහන්න එපා යකෝ ඇහෙයි ඒ මනුස්සයා ට. ආව දවසෙම ආපහු හරවලා යවනවට පට්ට ආසයි වගේ නේද. අනේ යකෝ කටවහගෙන හිටපන් නැත්නම් බෙහෙත් කෙසේ වෙතත් ගුටි නම් කන්න වෙයි"

බොහෝ අසීරුවෙන් වුවත් අකලංකව පාලනය කරගත් තිදස් , කමනීට නෑසෙන ගානට කතා කරමින් ඉදිරියට ඇදෙන්නට වූයේ සිසිල් දිය පහරේ පහස දුර තියාම විඳින ගමන් ය.

"අහ් මේ. ඒක නෙවෙයි දරුවො. අහන්න බැරි වුනානේ නම වත්."

sinhalaebooks.com

තරුණයින් දෙදෙනාගේ ගමන වලක්වමින් ආයෙම ඇය වචන හසුරවන්නට විය. ඇයගේ වචන නොසලකා හැරිය නොහැකි බැවින් මුවඟ සිනාවෙන් ආපසු හැරුනු ඔවුන් ඇයට හෙලුවේ තරමක සෙනෙහෙබර බැල්මකි.

"මං අකලංක. මේ තිදස්. බෙහෙත් කරන්නෙ නම් මෙයාට තමා"

තිදස්ට පෙර අකලංක ඉස්සර විය.

ඒ අකලංකගේ ස්වරූපය බව තිදස් ද හොඳ හැටි දනී. බඟ තෝරන කාලයේ සිටම ඇරඹී ඒ මිතුදම දැන් සහෝදරකමක් වී හමාරය. ඒ සහෝදරකම වචන වලට හරවන්නට තරම් හැකියාවක් ඔවුන් දෙදෙනාටම නැති තරම් ය.
තිදස් මදක් හෝ සංවර වුවත් අකලංක සැහැල්ලු පුද්ගලයෙකි. ඕනෑම මොහොතක ඕනෑම තැනක ඕනෑම අයුරකින් කටයුතු කිරීමට තරම් අපූරු හැකියාවක් ඔහු සතුව පවතී. ඊටත් එහා වචනවලින් පුද්ගලයෙකු තමා වෙත නැඹුරු කර ගැනීමට තරම් අකලංක ගේ වචන ප්‍රබලය.

"පුතාලා කොහෙද? "

කමනී ඇසුවේ ඔවුන් ගැන විස්තර දැනගැනීමේ බලාපොරොත්තුවෙනි.

"නුවර.. නුවර ටවුන් එකේමයි."

"ඔව්...මිස්ටර් දිසානායකගේ පුතානෙ මෙයා. වැඩි සද්දයක් නැති වුනාට නාහය අහන්නෑ ආන්ටි."

"මිස්ටර් දිසානායක කිව්වේ."

කමනී ඇසුවේ තරමක ප්‍රශ්නාර්ථයක් හිතේ රඳවාගනිමිනි.
ඇයට ඒ නම හුරුපුරුදු ගතියක් දැනෙන්නට විය.
ඒ නිසාම ඒ ගැන අසා දැනගැනීමට තරම් උවමනාවක් ඇයගේ හිතට ආවේ විටින් විට තිදස්ගේ මුහුණ දෙසද බලමිනි.

"තේනුක දිසානායක. බිස්නස් මන් කෙනෙක්."

"ඔහ්.."

"ආන්ටි දන්නවා ද අපේ තාත්තා ව"

"නෑ න් නෑ මං දන්නෑ. ඒ වෙන දිසානායක කෙනෙක්.මං නුවර හොස්පිටල් එකේ නෙ වැඩ කලේ. එතකොට ඉතින් කට්ටිය එනවා යනවනෙ පුතා. ඔහොම දිසානායක නමක් මට

sinhalaebooks.com

හොඳට හුරු පුරුදුයි. ඒකයි මං ඇහුවේ. අනික ඉතින් දිසානායක කියලා එක්කෙනෙක් නෙවෙයි නේ ඉන්නේ නේද පුතා"

"හ්ම් ඔව් ආන්ටි."

"හරි නාගෙන එන්නකො. මං මේ දූව පොඩ්ඩක් බලලා එන්නම්. ඔලුවෙ කැක්කුමක් කියලා නිදගත්තා"

කමතිට සමුදුන් තරුණයින් දෙදෙනා ඒ කතා බහෙන් ම දොල දිහාවට ඇදුනේ පුදුමාකාර සැහැල්ලුවකිනි.

නිල් පැහැ ගැන්වුනු ජල දහරාව කරා හිත ගියේ එක් ක්ෂණයකිනි. ඒ තරමට ඒ සුන්දරත්වය පිරිමි හිතට අමන්දානන්දයක් ගෙන එන්නට විය. නගරයේ හිරවුනු ජීවිතය එක්ක මෙවැනි නිදහස් ජීවිතයක් ඔවුනට ගෙන ආවේ අපූරුම හැඟීමකි.
ඒ නිසාම එක් ක්ෂණයකින් තරුණයින් දෙදෙනා ඇඟ ලා තිබූ ඇඳුම් අයින් කර වතුර පහසින් ගතට සිසිලක් එක් කර ගන්නට සූදානම් විය.

"උඹට නාන්න එපා කියලා පුංචි වෙද නෝනා කිව්වා"

"මාත් මේ ඒක තමා බන් කල්පනා කලේ. වතුර ටික දැක්කාම නාන්නමයි හිතෙන්නේ බන්. ශිට්"

"හෙට අර හෝන්තුවගෙන් බැනුම් අහන්න ඕනෙනම් නාපන්. හැබැයි මං නෑ"

"මේ එහෙම කතා කරන්න ඔට්ටු නෑ හරි."

"අම්මේ හා හා. තිදස් ගේ ආදරණීය ප්‍රියම්භිකාව. පුංචි වෙද නෝනා. අනේ මේ ඇඟ හෝදගනින්."

කතාවෙන් කතාවෙන් දිය කඩිත්ත වෙත බැස ගත් තිදස් හා අකලංක රිසි සේ දිය පහස ලබද්දී,
ඔවුන් හා කතා බහෙන් බසු එතනින් ඈත් ව ගිය කමතී ඒ පිම්මේම නිවසට දිව යද්දී ආකශ්‍රා ඉස්තෝප්පුවේ පුටුවකට බර වී පොතක් බලමින් හිටියේ වෙන කිසිදු අවධානයකින් තොරවය.

ගතෙහි දැවටෙන සිසිල් සුළං රැලි එකිනෙක අමුතුම ලෝකයක් සුද්දී වටා මවද්දී හිත ගිය පොතේ පිටු අතර මොහොතකට තනි වුනු ආකශ්‍රා හිතෙහි චිත්ත රූප මැවෙනා ලෙසට පොතට නැඹුරු වී සිටියාය. ඒ හැඟීම කෙතරම් සුන්දරද යත් පොතකට ප්‍රේම කරනා අයුරු දන්නේ පොත් හා ජීවිතය බැඳි අයවලුන් පමණකි.

sinhalaebooks.com

නිදහසක් ලැබුනු සෑම මොහොතකම සුද්දීගේ එකම විනෝදාංශය පොත් කියවීම නිසාම හීතියට දැනෙන මද පවනේ සිසිලස විඳිමින් තිහඩව පොතකට සම වැදී සිටියේ තිවස දෙසට එන කමතී ගැනවත් නොසලකමිනි.

"ඔලුවෙ කැක්කුමක් කියලා නිදාගත්තු එකී දැන් මේ පොතකට ඔලුව ඔබාගෙන. ඇස් වෙහෙසන්න එපා ලමයෝ ඔලුවෙ කැක්කුම නම් ටිකක් නිදාගනිත්කෝ"

ආකශර්ාට සැර කරමින් ඉස්තෝප්පුවට සේන්දු වුනු කමතී ඒ පිම්මේම ඉස්තෝප්පුවේ හාන්සි පුටුවේ අසුන් ගත්තේ වෙනමම කල්පනාවකිනි.
ඒ කිසිදක ඇයගෙන් දිස් නොවූ බැරෑරුම් කල්පනාවක් නිසාම පොත දිහාවට යොමු වී තිබූ බැල්මෙන් මදකට මිදුනු ආකශර්ා අම්මා දිහා බැලුවේ ඒ තරමට ඇය සිටියේ කල්පනවක බැවිනි.

"මොකද අම්මේ මේ අහස පොලොව ගැට ගහන්න වගේ කල්පනා කරන්නේ. මොකද සීයා බැන්නාවත් ද. ඒත් ඔහොම කල්පනා කරන්නෙ නැනේ අම්මේ"

"අර බෙහෙත් කරන්න ඇවිත් ඉන්න ලමයි දෙන්නා එක්ක එහෙම වැඩියෙ ඇඟි හොඳයියට යනවා නෙවෙයි ඔන්න. මං නොකිව්වා කියන්න එපා සුද්දී. එහෙම වුනොත් යන්න දෙන්නෑ වෙද ගෙදර පැත්ත පලාතකවත්"

එක් වරම කමතී කියවගෙන ගියේ කේන්තියකින් මෙනි.

ආකශර්ාට දැනුනේ පුදුමයකි. සමවැදී සිටි පොතද පසෙකින් තැබූ ආකශර්ා අම්මා දිහාවට හැරුනේ හිතේ සැකයනි.

මෙහෙම කේන්තියක් ?

මෙහෙම හැසිරීමක් ?

ඇයි ඉතින් අනික මට කෑ ගහන්නේ ?

වෙද ගෙදර පැත්තෙ මං නොදන්න මොනවාහරි වුනාවත් ද ?

ආකශර්ාගේ හිතට විවිධාකාර ප්‍රශ්න පැන නඟින්නට විය.

සමහරවිට අම්මා එක්ක විහිලුවක් වත් කරන්න ඇති කොල්ලෝ දෙන්නා. නැත්නම් ඉතින් කවදාවත් අම්මා ඔහොම කියන්නෙ නෑනේ. අනික ලෙඩකට බෙහෙත් කරන්න එන කවුරුත් ගැන අම්මා ඔහොම කතා කරලා නෑ

"ඇයි අම්මේ මේ එක පාරටම"

sinhalaebooks.com

ආකශර්‍ා ඇසුවේ හිතට දැනුනු ප්‍රශ්නය නිසාමය.

"උඹට පණ්ඩිත කම් වලින් වැඩක් නැතේ. ඕනවට වඩා ඇයි හොදැයියවල් ඕනෑ ඔය මිනිස්සු එක්ක. බෙහෙත් කරන්න ආවානම් ඒවා කරගෙන ගිය දෙන්. එතනින් එහාට කතාවක් ඕන්නෑ. එහෙම වුනොත් මට සිද්ධ වෙනවා වෙද ගෙදර වැඩත් නවත්තන්න."

"අම්මේ..."

"කතා එපා"

"හ්ම් හා අම්මේ."

ආකශර්‍ා ට දැනුනේ ප්‍රශ්නයක් වුනත් මේ ඒ ප්‍රශ්න ගැන අම්මාගෙන් ඇසිය යුතු වෙලාවක් නොවන බැවින් ඇය නිහඬ වූයේ හාරා හාරා ප්‍රශ්න කිරීම මඟින් ප්‍රශ්නය දුර දිග යන නිසාවෙනි.
ඒත් ආයෙම පොත දිහා බලන්න තරම් ආකශර්‍ාගේ මනසද තිරවුල් නොවීය.

අම්මා එයාලව දන්නවා වත් ද. ?
මෙතන මොනවාහරි මං නොදන්න දෙයක් තියනවා වගේ.
ඒත් අම්මා කොහොමද එයාලව දන්නේ.
හා කමක් නෑ හොයමුකෝ.

කමනීට එතැන ඉන්න හැර ඉස්තෝප්පුවේ අසුනින් නැඟී සිටි ආකශර්‍ා තව දුරටත් කතා නොකර නිහඬව ගේ ඇතුලට පියවර නැඟුවේ හතර වටින් පැටලීගෙන එන නූල් බෝලය තවත් පැටලෙන්නට පෙර ලිහා දැමීමට කොනක් ගැන කල්පනා කරමිනි.
තිදස්ගේ පැමිණීමෙන් දින කිහිපයක් ගත වෙත්ම යම්තාක් දුරකට ඔහුගේ හිසට සහනයක් දැනෙන්නට වූයේ වෙද ගෙදර වෙද සත්කාරද සමඟිනි. සියල්ල හරි ලෙසට හරි වෙලාවට සිදු වූ නිසාම කියන දේ හරි හැටි අවබෝධ කොට ගෙන ඒ අනුව කටයුතු කරන්නට තිදස්ද පටන් ගෙන තිබුනේ ඉක්මනින් සුව වීම අත්‍යවශ්‍ය බැවිනි. බෙහෙත් කටයුතු අවසන්ව දිනක් එලියේ බංකුවක වාඩි වී සිටින අතරතුර තිදස්ගේ දුරකථනය නාද වූ නිසාම තිදස් දුරකථනය රැගෙන මදක් එහාට ගියේ අකලංක ව බංකුව මත තනි කරමිනි.

"කවුද ?"

තිදස්ගේ පිටව යෑමෙන් පසු එතැනට පැමිණි ආකශර්‍ා ඇසුවේ අකලංකගෙනි..
ආකශර්‍ා ඇසුවේ තිදස් දුරකථන සංවාදයේ යෙදෙන්නේ කා සමඟද යන්න බව වග ඔහුට හොද හැටි තේරුණි.

"දන්නෑ"

"හුම්...දන්නෙම නෑ ඔයා"

sinhalaebooks.com

ආකශර්‍ා නෝක්කාඩුවෙන් මෙන් කියන්නට විය.

"ඉතිං ගිහින් අහන්නකෝ. මට මොකද ඌ කාත් එක්ක කතා කලත්"

ආකශර්‍ා රැගෙන ආ තේ බත්දේසිය මත වූ තේ කෝප්පයක් අතට ගනිමින් අකලංක කිව්වේ කට කොනේ වූ සිනාවද සමගිනි.
තිදස් ආකශර්‍ා ගැනද
ආකශර්‍ා තිදස් ගැනද,
දැන් අවදානය යොමු කරනවා වැඩි බව අකලංක ට තේරුණත් ඒ සියල්ල නොතේරුණ ගානට ඉන්නවා ඇරෙන්නට ඔහුට වෙන කිසිවක් තිබුනේද නැත.
ඒ එක්කම මේ ආකශර්‍ාව මදක් ඇවිස්සීමට හොඳම අවස්ථාව යැයි සිතූ අකලංක ආයෙම ඔළුව උස්සා ඇය දෙස බලද්දීත් ආකශර්‍ා ගේ ඇස් තිබුනේ ඔවුන්ට මදක් ඈතින් දුරකථන සංවාදයේ යෙදෙන තිදස් ලඟය.

ආකශර්‍ා ලඟ තිබුනේ අපූරු සුන්දරත්වයකි. විටෙක ඒ සුන්දරත්වයට අකංලකගේ හිතද ගැස්සී නොගියාම නොවේ. නමුත් ඒ සියල්ල යටපත් කරගෙන සිනාවෙන් හැසිරෙන්න තරම් ඔහු ඔහුගේ පිරිමි හිත පාලනය කර ගත්තේ තිදස් වෙනුවෙනි.
ඔහු නිතරම හිතට දැනෙන්න දුන්නේ ආකශර්‍ා ගැන තිදස් බලාපොරොත්තු තබා සිටින බවයි.

"මොනවද සුද්දී ඔච්චර ඌ දිහා බලන්නේ. ඌ ඉතින් මලක් කඩනවා ඇති. මොකද ඉතින් ඌට කියලා පෞද්ගලික ජීවිතයක් නැති වෙන්න විදියක් නැනේ. කෙල්ලෙක් ඉන්න ඕනි වයසනේ. අනික ඉතින් හැන්ඩියනේ"

"මොකක්...."

"නෑ ඉතින් ඌ ශුවර් කෙල්ල එක්ක ලව් කරන්නේ ඔය. පේන්නෙ නැද්ද මූණේ හිනාව. අනේ ඇස් වහක් නම් වදින්න එපා දෙවියනේ ඒ පැණි හිනාවට.."

අකලංක , කෙල්ලව ඇවිස්සීමේ බලාපොරොත්තුවෙන් එහෙම කියද්දී සත්තකින්ම ආකශර්‍ාව ඇවිලී යන්නට විය.
සම්පූණර්‍යෙන්ම ඇයගේ මුහුණේ ඇති වූයේ සෑහෙන්න ලොකු වෙනසකි.

"පිස්සුද මන්ද, එයාට කොහෙන්ද කෙල්ලෝ."

"ඇයි. එයාට කෙල්ලෙක් ඉන්න බැරිද"

"එයා දවසක් කිව්වා එහෙම කෙනෙක් නෑ කියලා එයාට. ඔයා බොරු කියන්නේ"

sinhalaebooks.com

"අයියෝ....පිට මිනිස්සුන්ට ඕවා කියනවද අනේ. මං නෙ දන්නෙ මගෙ යාළුවා ගැන. ඔය ඌ කතා කරන්නෙ කෙල්ල එක්ක තමා බන්."

"හා ඉතින් මට මොකද"

ආකශ්රා ගේ අතේ වූ තේ බන්දේසිය තාමත් අතේ මය. එය ගැනවත් ඇයට එතරම් තැකීමක් නොවීය. තාමත් ඇයගේ හිත තිදස් ලඟය. මිනිත්තු කිහිපයක් පුරා පැවති දුරකථන සංවාදය අවසන්ව තිදස්, ආකශ්රා හා අකලංක අසලට පැමිණියේ මුවේ සිනහවක් සමඟිනි.

"මොකෝ බන් කෙල්ල කියන්නෙ. උඹව බලන්න මෙහෙ එන්න ඕනෙ කියනවද"

තිදස් හා ආකශ්රා දෙස මාරුවෙන් මාරුවට බලමින් අකලංක කිව්වේ තිදස්ට ඇසකින් ඉඟි කරමිනි.

"හෙට එනවලු බන්. "

"කවුද හෙට එන්නේ"

තිදස්ගේ උත්තරයට ප්‍රශ්නයක් යොමු කලේ අතේ වූ තේ කෝප්පය ඔහු දෙසට දිගු කරන ගමන් ය.

"කවුද ඉතින් මුගෙ කෙල්ල තමා"

අකලංක තාමත් උත්සහ කලේ ආකශ්රා ව ඇවිස්සීමටය.

"අයියෝ මුට පිස්සු ආකශ්රා. මට කොහෙන්ද කෙල්ලෙක්. හෙට අපේ අම්මයි තාත්තායි එනවලු මෙහෙ. අම්මා කතා කලේ ඒක කියන්න. එයාලටත් මෙහෙ එන්න ඕනි කියන්නේ."

ඒ එක්කම ආකශ්රාගේ මුවේ සිනහවක් ඇඳුනේ ඇයටත් නොදැනීමය. හේතුවක් නොදනී. නමුත් තිදස් දැකීමට ඇය මහත් වූ ප්‍රියතාවයක් දක්වයි.

"යකෝ මේකිට නෙ සතුට"

ආකශ්රා , අකලංක හා තිදස් විවිධ දේවල් එකින් එක කතා කරමින් සිනාසෙන්නට වූයේ වසර ගණනාවක් තිස්සේ දන්නා අඳුනන අය ලෙසටය.
ගෙවුනු දින කිහිපය පුරා ආකශ්රාගේ ප්‍රතිකාර නිසාම තරුණයින් දෙදෙනාට ආකශ්රාව හොඳ හැටි ආශ්‍රය කරන්නට තරම් අවස්ථාවක් ලැබුනත් ඔවුන් හා ආශ්‍රය ගැන ආකශ්රා ගේ මව එතරම් පැහැදීමකින් නොසිටිය නමුත් සාත්තුව නිසාම ඇය කිසිවක් නොකියා සිටියේ මේ සියල්ල වෙද සීයාගේ අනුදැනුම යටතේ සිදු වෙන බැවිනි.

sinhalaebooks.com

තරුණියන් දෙදෙනාම තේ පානය කර අවසන් වන තුරුම ආකශර්ාද ඔවුන් සමග සතුට බෙදාගත්තේ ඒ තරම් ඔවුන් ඇයට සෙනෙහෙබර වූ බැවිනි.
ඒ කෙසේ වෙතත් ආකශර්ා ඉදිරියේ තරුණ හිත් දෙකම ගැස්සුනත් තිදස් ඇයට ප්‍රේම කරණා බැව් දන්නා නිසාම අකලංක ඒ සියලු සිතුවිලි යටපත් කර ගත්තේ තම මිතුරා වෙනුවෙනි.

"ආකශර්ා...."

සිතහවෙමින් සිටි කෙල්ල ගැස්සුනේ එක්වරම ඇසුනු හඬටය.
ඒ හඬ හුරු පුරුදුය. ඒ කවුද යන වගද හොඳ හැටි දනී.
නමුත් ආකශර්ා ට දැනුනේ බියකි.

සාමාන්‍යයෙන් අම්මා ඇයට නම කියා අමතන්නේ කේන්ති ගත් විට පමණී. එහෙත් අම්මාගේ කේන්ති ගැනීම අසාමාන්‍ය දෙයකි.
එක් වරම ඇසුනු අම්මාගේ හඬට ආකශර්ාව සත්තකින්ම ගොළු විය..

"අම්මා...."

බත්දේසිය මත වූ තේ කෝප්ප දෙකද පරිස්සමින් රඳවා ගනිමින් ආපසු හැරුනේ හඬ ආ දිහාවටය..

"මෙතන කැකිරි පලන්න තියාගත්තෙ වැඩ නැද්ද වෙන. ඔය ඉන්න කෙනා විතරක් නෙවෙයි නේ ලෙඩෙක්ට ඉන්නෙ. එක්කෝ වෙද ගෙදර වැඩක් කරන්න නැත්නම් ගෙදර ගිහින් වැඩක් කරන්න. ලමිස්සියක් ගේ ඉස්සරහ ඔහොම හැසිරෙද්දි හරිද අහ්. සීයා දැක්කොත් ආයෙ එන්න නෙවෙයි වෙද ගෙදර පැත්තේ"

අම්මා කියද්දී ආකශර්ා නිහඬව වෙද ගේ ඇතුලට යන්නට පියවර තැබුවේ අම්මාවද පසු කරමිනි.

"මොනවද ඔච්චර හිනාවෙන්න තරම් කියෙව්වේ"

කමනී ඇසුවේ ආකශර්ා ට පමණක් ඇසෙන ලෙසය.

"හෙට තිදස්ගේ අම්මයි තාත්තායි එනවලු අම්මේ එයාව බලන්න. ඒක කතා කලේ. එයා ඒ ගැන සැහෙන්න සතුටින් ඉන්නේ"

"මොකක්."

"ඔව් අම්මේ. හැබැයි ඉන්න එකක් නෑ යයි."

sinhalaebooks.com

"උඹට ඒ පණ්ඩිතකම් වලින් වැඩක් නැහේ. දුවපන් ගෙදර. අනුන්ගෙ පෞද්ගලික දේවල් නෙවෙයි වෙද ගෙදර වැඩ බලාගෙන ඉන්න බැරිනම් ගෙදරට වෙලා ඉන්නවා"

"හා ඉතින්."

ආකශරා එතනින් එහාට මොකුත් නොකියා ගේ ඇතුලට ගියෙ අම්මා ඉන්නේ කේන්තියෙන් බව තේරුම් ගත් නිසාවෙනි.
ආකශරා යන දෙස බලා සිටි තරුණියන් දෙදෙනා වුනු දේවත් හිතාගන්න බැරුව තවමත් ඒ දෙස බලා සිටියේ කමනී දෙසද පුදුමයෙන් බලමිනි.

"දෙවියනේ මොනවාද මේ වෙන්නේ. තිදස්ගෙ අම්මයි තාත්තා යි එනවා. මොකක්ද මං කරන්නේ. මෙච්චර කාලයක් හැමදේම හොඳට වුනා. ඔව් මේ තිදස් කියන දිසානායක ඔව් ඒ එයාලා තමයි. ඒ දිසානායක පවුල තමයි. හැමදේම දැන් වෙන්නෙ නරකට. මෙච්චර කාලයක් පරිස්සම් කරපු රහස්. එතකොට ඒ දේවල් එලි වෙයිද. න් නෑ එහෙම වෙන්නෑ. ඔව්. එහෙම වෙන්න විදියක් නෑ"

එතන වූ ඇඳි පුටුවෙන් වාඩිවෙන ගමන් කමනී කල්පනා කරන්න වූයේ හිතට දැඩි ලෙස වද දෙන්නට වූ කාරණය සම්බන්දයෙනි.
"ආන්ටී..."

ඉස්තෝප්පුවේ අසුන් ගෙන උන් කමනීට ආදරණීය සිනහවකින් සංග්‍රහ කරමින් අකලංක හා තිදස් වෙද නිවස ඇතුලට යද්දී කමනී ආයෙ ආයෙම තිදස් දිහා උවමනාවෙන් බලා සිටියේ කිසිදු අදහසකින් තොරවය.
තිදස් හා අකලංක කෙසේ ඇය හා සංවාදයේ යෙදුනත් ඇයගේ හිත තුල තලියන්නට වූ එක් කාරණයක් විය.
ඒ ආකශරා ය..

මේ සියල්ල ගැන කමනී හැරුනු කොට දන්නා එකම තැනැත්තියක් විය. ඒ ඇයගේ හොඳම මිතුරියයි. රෝහලේ කටයුතු කල වසර ගණනාවක් පුරාවට කමනී හා සේවයේ යෙදුනු මධාරා හැර මේ සියල්ල වෙන කිසිවෙකුත් නොදන්නා වගට ඇයට තද විශ්වාසයක් පැවතුණි.

ඒ නිසාම කමනී වෙද ගෙදර ඉස්තෝප්පුවේ පුටුවෙන් නැඟී සිට දිව ගියේ ඇයගේ නිවස දිහාවටය.
ඒ දිව ගිය ඇය දුරකථනය අතට ගෙන තම යෙහෙළිය ගේ අංකය ඇමතු ඇය ටිකක් බියකින් හා කුතුහලයකින් රැඳී සිටියේ එහා පසින් ඇසෙන කටහඬ වෙනුවෙනි.

"හෙලෝ මධාරා මාර ප්‍රශ්නයක් වෙලා තියෙන්නේ මධාරා මට තේරෙන්නෑ මොකක්ද කරන්න ඕනෙ කියලා සම්පූණර්යෙන් ම ඔලුව අවුල් වෙලා තියෙන්නේ කෙල්ලේ මට නම් පිස්සු වගේ"

sinhalaebooks.com

ක්ෂණික ප්‍රතිචාරයක් ලැබුනු පසු කමනී කියවගෙන යන්නට විය.

"මොකද කමනි මේ. ඇයි මේ එක පාරටම මොකක්ද වුනේ"

කලබලයෙන් කියවගෙන යන කමනීව සංසුන් කිරීමේ බලාපොරොත්තුවෙන් මධාරා කියද්දී දුරකථනය අතැතිව එතනම වූ ආසනයෙන් අසුන් ගත්තේ වට පිට ගැනද සැලකිල්ලක් දක්වමිනි.

ආකශ්රා තාම ගෙදර නැවිත් බව පැහැදිලිය.
ඇය වෙද ගෙදරය.
ආකශ්රා ගේ නැගණිය දහම්සා සුවපහසු නින්දකය.
ආකශ්රාගේ පියා රැකියාව නිමවී තාමත් ගෙදර පැමිණ සිටියේද නැත.

ඒ නිසාම සන්සුන් වූ කමනී බොහෝම ඉවසීමෙන් සිද්ධිය පැහැදිලි කරන්න වූයේ හිතට දැනෙන බර සැහැල්ලු කර ගත හැකි එකම මධාරා බැවිනි.

"කමනී ඇයි මොකක්ද වුනේ"

"හැමදේම ඉවරයක් වෙන්න යන්නේ කියලා හිතෙනවා මධාරා. එහෙම වුනොත් මට බැරි වෙයි ඒ දේවල් දරාගන්න නම්."

"තේරෙන්න කියන්නකෝ."

"තේනුක දිසානායක මතකද. එතකොට එයාගෙ වයිෆ් මතකද මධාරා. මෙච්චර කාලෙකට ඔයයි මායි විතරක් දැනගෙන හිටිය ඒ රහස මතකයිද ඔයාට"

"හ්ම්ම් ආකශ්රා නේ"

"ඔව් ආකශ්රා තමයි. ඒත් ඒ හැමදේම ඉක්මනින් ලොකු වෙනසක් වෙයි කියලා හිතෙනවා දෙවියනේ."

කමනී ඇස් අගට ඉනූ කඳුලු අත්ලෙන් පිස දමමින් කියන්නට වූයේ ඒ වේදනාව නිසාවෙනි.
ඒ දියණියක් වෙනුවෙන් මවකට ඉනූ කඳුළු වේ.
මව් සෙනෙහස හදවත හාරා පාරා කිඳ බැස ලේ , ඇට , ඇට මිදුළු හරහා දිව යද්දී මුළු සවර්ාංගයම පණ නැතිව යන්නාක් මෙන් කමනීට දැනෙන්නට විය.

ඇයගේ හිතට දැනුනේ එකම පැනයකි.

"ආකශ්රා මට නැති වෙයිද"

කමනී, මධාරාගෙන් ඇසුවේ හිතට වද දෙන එකම පැනයද එය බැවිනි.

sinhalaebooks.com

"තේරෙන්න කියන්න පුලුවන් ද. අවුරුදු විසි දෙකක් අපි දෙන්නා විතරක් දැනගෙන මෙච්චර පරිස්සම් කරපු රහස ඇයි එලියට එයි කියලා බය වෙන්නේ කමනී. ඔයාගෙ හිතේ ඇදුනු බොරු මනස්ගාතයක් විතරයි කෙල්ලේ ඕක"

"නෑ එයාලා ඇවිත් ගෙදරටම ඇවිත්.මගෙ කෙල්ලව අරන් යන්න ගෙදරටම ඇවිත් "

"කවුද මිස්ටර් දිසානායකලා.එයාලා කොහොමද ඇත්ත දන්නේ"

මධාරා කුතුහලයකින් යුතුව ඇසුවේ ඇත්තටම මේ තරමට කමනීගේ වෙනසට හේතුව දැනගැනීමේ උවමනාව නිසාවෙනි.
ආකශ්රා ට කෙතරම් ආදරේ ද වග මධාරා ද හොඳ හැටි දන්නා කරුණකි.

"මධාරා. ඒ ඉපදුනු පිරිමි දරුවා බෙහෙත් කරන්න වෙද ගෙදර ඇවිත්. හෙට එනවලු ඒ දරුවා බලන්න අම්මයි තාත්තායි."

"ඉතින්..."

"ආකශ්රාව අරන් යයි."

"ඒ ඇයි."

"ඉතින් ආකශ්රා එයාලගෙනේ"

"අයියෝ කමනී. මේ අහන්න කෙල්ල. ඔයාගේ ඔලුව මුලින්ම නිදහස් කරගන්නකෝ. ඔයා හිතන කිසිම දෙයක් මෙතන වෙලා නෑ. ආකශ්රා ඔයාට නැති වෙන්නෙත් නෑ. හැබැයි ඔයා ඔහොම වෙනසක් පෙන්නුවොත් එයාලාට සැකයක් හිතිලා ඔයාගෙ වෙනස පස්සෙන් පන්නයි. ඒ හින්ද රිලැක්ස් වෙලා ඉන්න"

"ඒත් මධාරා"

" ළමයි මාරු කරපු එක දන්නේ මං විතරයි කමනී ඒ ගැන බය වෙන්න එපා. මගෙ යාළුවා වෙනුවෙන් වෙන කරන්න දෙයක් තිබ්බෙ නැති නිසයි මං එදා ඒ දේ කලේ. උඹේ පලවෙනි දරුවා ඉපදෙද්දිම ම මැරිලා කියලා කොහොමද මං උඹට කියන්නේ. ඒ හින්දයි මං එහෙම කලේ. මිසිස් දිසානායකට ඉපදුනේ කෙල්ලෙකුයි කොල්ලෙකුයි. ඉතින් එක දරුවෙක් හරි ඉන්නවා නේ කියලා එයාලා හිත හදාගනී කියලයි එදා මැරිලා හිටිය උඹේ කෙල්ලව එතනින් තියලා ඒ පුංචි එකීව උඹේ ලඟින් ගෙනල්ලා තිබ්බේ. උඹත් නොකියා ඉන්න හිටියේ. ඒත් පස්සෙ හරි ඒක උඹට කිව්වේ මටත් ඒක හිතට වදයක් හින්ද"

"ඒත් ඒ ඩොක්ටර් , අනිත් නසර්ලා"

sinhalaebooks.com

"ඒ හැමදේම මං හරියට කලානේ ඇයි මේ කලබල. කිසි දේකට බය වෙන්න දෙයක් මෙතන වෙලා නෑ"

"මධාරා මගෙ කෙල්ල"

"සැක හිතෙන්න හැසිරුනොත් ඔයාට ආකශර්‍ා සදහටම නැති වෙයි කමනී. දැන් ඔය බෙහෙත් කරන්න ඇවිත් ඉන්නේ ආකශර්‍ාගේ නිවුන් සහෝදරයා කියලා විශ්වාසයිද"

"තිදස් කියන විදිහට එහෙම තමා"

"ඒ කොල්ලට වුනත් ලොකු වෙනසක් පෙන්නන්න එපා. ආකශර්‍ා ගේ ආරක්ෂාව ගැන මුලින්ම හිතන්න"

මධාරා කිව්වේ කමනීගෙ හිත සැනසීමේ අදහසිනි.

එදා කමනී ගේ මුල් දරු උපත මළ දරු උපතක් වෙද්දී වෙන කල හැකි යමක් නොමැති නිසාවෙන් මධාරා දරුවන් මාරු කරන්නේ කමනීගේ සතුට වෙනුවෙනි.
තිදස්ගේ නිවුන් සහෝදරිය එදා මළ දරුවෙකු වන්නේ ඒ මාරු කිරීම නිසාවෙනි. අවසානයේ තිදස්ගේ සැබෑම නිවුන් සහෝදරිය ආකශර්‍ා වෙද්දී දෛවය මේ විදිහට සිදු වීම නිසාම කමනී ගැස්සී යන්නේ ආකශර්‍ාව නැති වේදෝ යන බිය නිසාවෙනි.

"හ්ම්ම්ම්...."

කමනී නිහඬ විය.

කෙසේ හෝ අවසානයේ හිතට යම් සහනයක් සමඟ දුරකථනය විසන්ධි කල කමනී පිටුවේ හාන්සි වෙමින් කල්පනා කරන්නට වූයේ මේ සිදුවෙන සිදුවීම් ගැනය.

සත්තකින්ම එදා තිදස් සමඟ දුටු මළ දැරිවිය දුටු විට ඇයගේ මවගේ පපුවද ඇවිලී යන්නට ඇති බව සැබෑවක් ය. නමුත් තිදස් වෙනුවෙන් හෝ ඇය හිත හදගන්නට ඇතැයි නොඅනුමානය.
මවකගෙන් දරුවෙකු වෙන් කිරීම එතරම් යහපතක් නොවේ.
ඒ නිසාමදෝ මන්ද කමනිගේ හිතට වේදනාවක් වෙන්ම වරදකාරී හැඟීමක් ද දැනෙන්නට විය.

මං ආකශර්‍ා ව එයාගෙන් අම්මගෙන් ඈත් කලාද.
නෑ එයාට තිදස් හරි ඉන්නවා නේ...

කමනී කල්පනා කරන්නට විය.

කෙසේ හෝ වේවා ආකශර්‍ා වෙනුවෙන් ඇයගේ රක්ත රුධිරය සුදු කිරි බවට හැරුනි.

sinhalaebooks.com

වසර විසි දෙකක් පුරාවට කිසි වෙනසක් නොකර ඇයව රැක ගත්තාය.
ඉතින් කුසින් නොවැදුවත් කමනී ආකශර්ාට මවක් විය.
ඒ නිසාම දැන් ආකශර්ාව වෙන් කිරීම තරම් හැකියාවක් ඇයට නොවුනි.
ඇයද මවකි,
ආකශර්ා වෙනුවෙන් මෙපමණ කාලයක් පුරාවට වෙහෙසුන
ඇයද මවකි
ආකශර්ාව ඇහේ තියාගෙන රැක ගත්තු.

කමනී කල්පනා කලේ ඒ ගැනමය..

"අම්මේ"

කමනීගේ කල්පනා ලෝකය බිදිමින් ආකශර්ා දිව ආවේ වෙද ගෙදර දිහා සිටය.

"සුදිදියේ.ඇයි වෙද ගෙදර වැඩ නැද්ද දෝණියේ"

"තව ටිකකින් ආයෙ යනවා අම්මේ"

එලෙස කියූ ආකශර්ා කමනීගේ උකුලේ හිස තබා බිමින් වාඩි වෙද්දී උතුරා යන මව් සෙනෙහසින් කමනී ඇයගේ හිස අත ගෑවේ දෛවයේ සරදමට හෝ වේවා යට ගියා වූ ඒ අතීතය කිසිදු හේතුවක් නිසා ආයෙම ගොඩ නොඒවායි ප්‍රාථර්නාව සමගිනි.
පසුදු උදෑසන තිදස්ගේ පැහැදිලි වෙනසක් දක්නට විය. ඒ දෙමාපියන්ගේ පැමිණීම නිසා බව වෙද ගෙදර සියල්ලෝම දැනගෙන සිටියේ ඔහු ඒ තරම් සිනාවෙන් වෙන කෙදිනකවත් නොසිටි බැවිනි. දැන් තිදස් වෙද ගෙදරට පැමිණ දින දහයකුත් ගෙවී ගොස් අවසන් ය.ඒ දින දහය ඇතුලත තිදස් අකලංක හා ආකශර්ා කතා බහට කෙතරම් එක් වූවත් පෞද්ගලික තොරතුරු ගැන මහා ලොකු කතා බහක් නොවීය.

"තිදස්ට වෙන කවුද ඉන්නේ"

ආකශර්ා ඇසුවේ හිසට බෙහෙත් තෙල් දමන ගමන් ය.

"අම්මයි තාත්තා යි මායි"

"වෙන සහෝදර සහෝදරියෝ නැද්ද"

ආකශර්ා ඇසුවේ මහා ලොකු තැකීමකින් තොරවය.තිදස්ට සත්කාර කරන සෑම විටම ඒ අසලින්ම අකංලක ද රැඳීම පුරුද්දකි. බොහෝ විට අකංලක ආකශර්ා දෙස උනන්දුවෙන් බලා සිටියා ඇරෙන්නට තිදස්ගේ රෝග සත්කාර ගැන අවධානයක් නොවීය.

"හිටියා. දැන් නෑ"

sinhalaebooks.com

හඬෙහි වෙනසක් නොකර තිදස් කියද්දි ආකශරා ඒ කතාව දෙස අවධානය යොමු කලේ තිදස් කියූ කතාව හරි හැටි තේරුම් නොගිය බැවිනි. ඒත් තිදස් ගේ මුහුණෙහි කිසිම වෙනසක් නොවීය.

"ඒ කිව්වේ."

ආකශරා අසද්දීත් තිදස් හිටියේ දෑස් පියාගෙනය.

"එයා නැති වෙලාලු සුද්දි. ඉපදෙද්දිම. මගෙ නිවුන් සහෝදරී. තත්පර ගාණකට බාල නංගී. එයා ඉපදෙද්දිම නැති වෙලාලු හිටියේ කියලා අම්මා තමා කිව්වේ. වෙන කවුරුත් නෑ මට ඉන්නෙ ඉතින් මං විතරයි

තිදස් කියද්දී ආකශරාගේ හිත ගැස්සී ගියේ ඒ කියූ දේවල් නිසාය. තිදස්ට ඒ ගැන මහා ලොකු වේදනාවක් හෝ සැලකීමක් නොවීම ගැන ආකශරාට පුදුම හිතුනත් සමහරවිට ඒ පුංචි සන්දියේම සිදු වූ සිදු වීමක් නිසා ඒ ගැන සැලකිල්ලක් නොමැති බව ඇයම සිතන්නට විය. කෙසේ හෝ කතා බහා එක්ක ආකශරාගේ රෝගී සාත්තුව නිම වී සිනහවෙන් විනාඩි කිහිපයක් ගෙවද්දී එක් වරම වෙද ගෙදර කඩුල්ල ඉස්සර මෝටර් රථයක් නතර කලේ ආකශරාගෙ හිත මදක් ගස්සමිනි.
නමුත් තිදස් වත් අකලංක වත් ලොකු වෙනසක් නොපෙන්නුවේ ඒ වාහනය ඔවුන්ට හුරු පුරුදු බැවිනි.

"අම්මා..."

තිදස් බංකුවෙන් නැඟී සිටියේ ඒ ඔහු මේ ලොව ප්‍රිය කරන රූපය ඔහුගේ ඇස් මානයේ වූ නිසාවෙනි. අම්මා හා තාත්තා කෙතරම් කාර්‍යබහුල වුනත් තිදස්ව විටෙක මග හැරුනත් තිදස් ඔවුන්ට අසීමාන්තිකව ප්‍රේම කරන්නට විය.
ඒ නිසාම ඉස්තෝප්පුවේ සිට කඩුල්ල දිහාවට දිව යන්නට වූයේ ආදරණීය මව හා පියා පිළි ගැනීමේ බලාපොරොත්තුවෙනි.

"පුතා. කොහොමද දූන්."

"හොඳයි තාත්තා දූන් සැහෙන්න."

"ඒ කියන්නේ මේ වෙදකම අල්ලලා ගිහින් වගේ. ඒක නෙවෙයි කවුද අර කෙල්ල."

දුර තියාම අම්මා අහද්දී තිදස් බැලුවේ වෙද ගෙදර දිහාවය. ආකශරාද එක එල්ලේ ඒ දෙස බලා සිටිනවා තිදස් දුටු අතර එනමුදු වෙනදා නොදුටු මහා අමුතු ශෝයාවක් ආකශරාගේ මුහුණෙන් දිස් විය..
ඇය සිටින්නේ යම් අපහසුතාවයකින් යන වග ඔහුට මෙන්ම ආකශරා අසල සිටින අකලංකටද තේරී ගියේ ආකශරා සිටියේ තරමක් සුදු මැලි වී බැවිනි.

sinhalaebooks.com

"ඒ වෙද මහත්තයාගේ මිනිබිරී අම්මේ. ආයුවෙර්ද වෙදකම ඉගෙන ගන්න ලමයෙක්. එයා තමා මේ ගොඩක් අයට බෙහෙත් කරන්නේ. හරිම හොදයි එන්නකෝ අම්මටත් අදුන්වලා දෙන්න"

"හා හා ඔය ගම් වල කෙල්ලෝ එක්ක එච්චර ලං වෙලා අදුරගන්න යන්න එපා. ඔය කෙල්ලෝ බලන්නෙම සල්ලි කාරයෙක්ගේ ඇගේ එල්ලෙන්න. මෙන්න මෙහාට වෙලා ඉන්න පුතා"

"මොනවද දේදුනු කියන්නෙ. ඒ වෙද ගෙදර වෙදකම් කරන කෙනෙක්. ඔක්කෝම ඔය විකාර ඉස්සර කර ගන්න එපා. යන්න වෙයි අදම පුතාටත්"

"තාත්තයි පුතයි ඕන දෙයක් කරගන්න"

තිදස් අම්මා හා තාත්තා සමග කඩුල්ල පැන වෙද නිවස දිහාවට පියවර තබද්දී ආකශ්රා දෑඩි උනන්දුවෙන් ඒ දෙස බලා හිදින්නය විය. ඒ කෙසේ හෝ වේවා ඔවුන්ව දැකීමත් එක්ක ආකශ්රාගේ ඇස් නිලංකාර වුනේ ඇයටත් නොදැනීය.
නමුත් ආකශ්රාගේ ගතෙහි හා මුවෙහි වූ වෙනස අකලංක ට හොදටම තේරුම් ගියේ ඔහු ආකශ්රා අසලම වූ නිසාවෙනි.

"සුද්දී ඇයි මේ. ඔයා අසනීපෙන් වත් ද. ඔයාට දඩියත් දාලානේ"

අකලංක කියද්දීත් සුද්දී හිටියේ තරමක අපසුතාවයෙනි.

"අකලංක මොකක්ද මට මේ වෙන්නේ.මාව එක පාරටම කැරකෙනවා නේ අකලංක. ඇයි මේ"

ආකශ්රාට කියන්න පුලුවන් වුනේ එපමණකි.
ආකශ්රාව එතැන ඇදගෙන වැටුනේ නිමේශයකිනි.

ඒ ඇයි යන්න එතැන සිටි සියල්ලන්ටම ප්‍රශ්නයක් වුනත් එක්වරම එයට හේතුව ආකශ්රා හා තිදස්ගේ මව අතර වූ සබැඳියාව නිසා බව කවුරුත්ම දැනගෙන හිටියේ නැත.

"ආකශ්රා..."

තිදස් දිව එන විටත් අකලංක ඇයව දෝතින් රැගෙන වෙද නිවස තුල වූ සයනයක් මත සුද්දීව හාන්සි කිරීමට පියවර ගත්තේ ක්ෂණික ක්‍රියාත්මක වීම මතය. ඒ එක්කම අකලංක වෙද සීයාට මේ සියල්ල දැනුම් දුන්නේ මෙය අහබු සිදුවීමක් බැවිනි. ආකශ්රා ගේ සෞඛ්‍ය තත්වයේ කිසිම ප්‍රශ්නයක් නොතිබුනු බැවින් සීයාටද මෙය තරමක ප්‍රශ්නයක් විය..

"මොකක්ද මේ දරුවට වුනේ."

sinhalaebooks.com

තිදස්ගේ පියා ඇසුවේ ආකශරා දෙස දැඩි උනන්දුවෙන් බලමිනි.

"එක දිගට කෙල්ල මේ ටිකේම වැඩ කලානේ. මං හිතන්නේ ඇගේ තෙහෙට්ටුව. කෙල්ලගෙ අම්මා එයි. දැන් සිහිය ආවනේ. මහත්තුරු යමු ඉස්සරහට. අපි ගිහින් කතා කරමුකෝ."

වෙද සීයා තිදස්ගේ මව පියා හා තරුණියින් දෙදෙනා කැඳවාගෙන කුටියෙන් එලියට යද්දී ආකශරාගේ මව පැමිණියේ මදක් කලබලයෙනි.

"මොකක්ද තාත්තේ කෙල්ලට වුනේ"

"ඇගේ තෙහෙට්ටුව වෙන්න ඇති. වෙන කිසිම ලෙඩක් නෑ. කෙල්ලට බොන්න මොනවාහරි දීලා තිදස් ලමයගෙ දෙමාපියන්ටත් බොන්න මොනවාහරි ලෑස්ති කරන්න කමනියෝ. ඒකෙන් මේකෙත් මේ මහත්තුරුත් කලබල වුනා ඕන්."

ඒ එක්කම කමනී උනන්දුවෙන් බැලුවේ දිසානායක යුවල දෙසය. අවුරුදු විසි දෙකකට පසු ඔවුන්ට දුටු නිසාදෝ හදුනාගැනීමට තරම් මහා ලොකු මතකයක් ඒ රූ තුල නොවීය. නමුදු මේ සිදුවීම් එක්ක ආකශරා හා සම්බන්ද පවුල එය යැයි දැක් හොද හැටි පැහැදිලිය. කමනී වෙනසක් නොපෙන්වා ඔවුන් දෙස බලා යන්තම් හිනාවක් පෑවේ ආකශරා දෙසද ඇස් කොනින් බලමිනි.

ඇය තාමත් සයනයේ වැතිරුණු ලෙසටමය. ඇයගේ දෑස් වල තිබුනේ විඩාබර ගතියකි.

"මොකද රත්තරන් වුනේ මයෙ අම්මට"

"දන්නෑ අම්මේ මොනවා වුනාද කියලා. ඔලුව පැලෙන්න තරම් රිදෙනවා අම්මේ. මට බොන්න මොනවාහරි ඕනේ"

ආකශරාගේ ඉල්ලීම නිසා කමනී ඇයගේ හිස පිරිමැද නැඟී සිටියේ ඇයට පානය සඳහා මොනවා හෝ සකසා ගෙන පැමිණීමටය.
විනාඩි කිහිපයක් තුල ආකශරාගේ සත්කාර අවසන් කල කමනී තිදස් ගේ මව හා පියා සිටින වෙද ගෙදර ඉස්තෝප්පුව දිහාවට පියවර නැගුවේ තරමක තිගැස්මකිනි. දැන් ඇයට ඇත්තේ අහිමි වීමේ බිය පමණී.
එද සිතා හෝ නොසිතා ඒ සිදු කල වරද අද හිතෙහි අසීමාන්තික බියක් ඇති කිරීමට සමත් වීම ගැන දැන් ඇයටම දැනෙන්නේ මහා අමුතු හැඟීමකි. ඒත් ආකශරාව අහිමි කරගන්නට තරම් සිතුවිල්ලක් ද ඇයට නොවිය.

සත්කාර අවසානයේ ආකශරා සිටින කුටියෙන් මව පිටත් වී යාමෙන් පසු ඇය කල්පනා කලේ මේ ඇය සිටිනේ කොහෙද යන්නය.
ඒ තිදස් හා අකලංක වෙනුවෙන් වෙන් කල කාමරය විය. තාමත් හිතට දැනෙන්නේ මහා විඩාබර ගතියකි. ඒ ඇයිද යන්න ඇයටම ප්‍රශ්නයක් විය.

sinhalaebooks.com

මුලින්ම තිදස් මාව මහන්සි කලා. දැන් එයාගෙ අම්මලා. ඇයි මට මෙහෙම දැනෙන්නේ. ඇයි එයාලා එක්ක මොනවාහරි සම්බන්දයක් මට තියනවා කියලා දැනෙන්නේ. මොකක්ද මට මේ දැනෙන අපහසුතාවය.

ආකශ්රා හිතුවේ සත්තකින්ම ඇයට දැනෙන අපසුතාවය නිසාවෙනි.

තව තවත් කල්පනා කිරීම තුලින් ඇති වෙන්නේ හිතේ මහන්සිය පමණක්ම බැවින් ආකශ්රා දෑස් පියාගත්තේ මද නින්දක් ලබා ගැනීමේ අරමුණිනි.

කමනී අමුත්තන් සඳහා සංග්‍රාය රැගෙන ඉස්තෝප්පුවට එද්දීත් ඔවුන් සිටියේ දීඝර් කතාබහකය.

"අප්පච්චී. තේ...."

කතා බහට බාධා කරමින් කමනී කතා කරද්දී වෙද සීයා ඇය දෙස බැලුවේ සිනහ මුසු මුහුණෙනි.

"අහ් ඔන්න ඔතනින් තියාපන්කෝ කෙල්ලේ. මහත්තුරු අරන් බොයි. "

වෙද සීයා කියද්දී කමනී ගෙනා සංග්‍රහය පසෙකින් තබා ඇස් කොනින් ඔවුන් දෙස බලන්නට විය.

"මේ අර දුවගෙ අම්මද"

එක් වරම තිදස්ගේ මව අසද්දී කමනී ගැස්සී ගියේ හිතේ තලියන බිය නිසාවෙනි.

"අප්පච්චී. තේ...."

කතා බහට බාධා කරමින් කමනී කතා කරද්දී වෙද සීයා ඇය දෙස බැලුවේ සිනහ මුසු මුහුණෙනි.

"අහ් ඔන්න ඔතනින් තියාපන්කෝ කෙල්ලේ. මහත්තුරු අරන් බොයි. "

වෙද සීයා කියද්දී කමනී ගෙනා සංග්‍රහය පසෙකින් තබා ඇස් කොනින් ඔවුන් දෙස බලන්නට විය.

"මේ අර දුවගෙ අම්මද"

එක් වරම තිදස්ගේ මව අසද්දී කමනී ගැස්සී ගියේ හිතේ තලියන බිය නිසාවෙනි.

"ඔව් නෝනේ. මගෙ ලේලි. අපේ සුද්දි කෙල්ලගේ අම්මා. මෙයත් නසර් කෙනෙක්. "

sinhalaebooks.com

"දුවට මොකක්ද එක පාරටම වුනේ. දැන් තත්වෙ කොහොමද. ටිකක් එයා ගැන බලන්න වෙයි."

සියල්ලෝම කතා බහේ යෙදෙන අතරතුර සංග්‍රාහයෙන් පසු කමනී වෙද නිවස තුලට ගියේ ආකශර්ාව බලාපොරොත්තුවෙනි. ඇයට සුව සේ නිදන්නට ඉඩ සලසා පැමිණියා මුත් කමනීගේ හිතට බොහෝ සිතුවිලි විටින් විට වද දෙන්නට වූ නිසාවෙන් ඇය නිතරම උත්සහ කලේ සුද්දී ලඟම කාලය ගත කිරීමටය. කෙසේ හෝ වේවා මේ තත්වය එක්ක සුද්දීට වෙද ගෙදර නින්ද යෑම ගැනද කමනී මදක් හිත් තැවුලෙන් පසු වුන මුත් වෙනසක් නොපෙන්වා ඉන්නට නිතරම උත්සාහ කලේ ආකශර්ා වෙනුවෙනි..

"කෙල්ලට නිදගන්න ගෙදර යන්න කිව්වා නම් මටත් මෙතන ඉන්නෙ නැතුව ගෙදර යන්න තිබ්බා. කෙල්ලත් මෙහෙම නිද ගත්තානේ."

කමනී තනිවම කල්පනා කරමින් කාමරය වෙත හිස පෙව්වේ ආකශර්ාගේ සුව දුක් විචාලීමටය.

ඇය සුවසේ නින්දකය. ඒ මුහුණේ මහත්සියක සේයාවක් ඇඳී තිබුණද අමුතුම හිනාවක් කමනීටද දක්නට ලැබිනි. මේ මොහොතේ ඇයට අවශ්‍ය මානසික හා ශාරීරික සුවය භුක්ති විදිමින් සයනයේ සැතපී සැපට නිදන ආකශර්ා ගේ නින්දට බාධාවක් නොකර කමනී ආයෙම ආපසු හැරෙද්දී බලාපොරොත්තු නොවුනු ලෙස දුටු වෙද සීයාගේ රුව හේතුවෙන් කමනීව ගැස්සී ගියේ දැන් හිත ඇත්තේද බියෙන් හා සැකයෙන් නිසාවෙනි.

"අප්පච්චී."

"හැම තිස්සේම ඕකට එබී එබී කෙල්ලගෙ තනි රකින්න ඕන්නෑ බන්. ගෙදර ගිහින් තියන වැඩක් කරගනින්. පුංචි එකියෙක් නෙවෙයි නේ. අනික මේ වහලේ යට සුද්දී කෙල්ලගෙ මොනවා පරිස්සම් කරන්න ද කමනියෝ. උඹ මොනවාහරි හිතේ සැකේකින් වත් ඉන්නවා දෝ කියලා මට හිතෙනවා වෙලාවකට"

"අප්පච්චිටත් පිස්සු හැදීගෙන එනවද අප්පච්චි. මං මොනවට මේ කෙල්ල ගැන සැක කරන්න ද. අනික ඉතින් ගෙදර ඉන්නවාට වඩා සුද්දී ඉන්නෙ වෙද ගෙදර නේ"

"ආන්න ඒක තමා මාත් උඹට කියන්නේ.එහෙනම් මෙතෙන්ට වෙලා කෙල්ල නිදගෙන ඉන්න කාමරේ මුර කරන්න දෙයක් නෑ ගෙදර ගිහින් තියෙන වැඩක් කොරපන්. අහ් මේ මේ මහත්තුරුන්ට දවල්ට කන්න මොනවාහරි උයන්න ඕනෙ බන්. මං මේ තකහනියක් අතනින් නැගිට්ටේ උඹ ගෙදර යන්න ඒක කියන්න."

"මොනවද අප්පච්චි උයන්න ඕනෑ"

"ගමෙ ගොඩේ දෙයක් උයපන්. ටවුන් වල එව්වා කාලම දැන් ඇති වෙලත් ඇතිනේ"

sinhalaebooks.com

"පොලොස් ගෙඩියක් තිබ්බා ඒක උයලා, මෑ මාළුවක් උයලා , තිබ්බොටු මැල්ලුමක් මලවලා ඊයේ හීන් වැස්සට වත්ත පල්ලෙහා පිපිලා තිබ්බ බිම් මල් ටික උයලා ගත්තාම ඇති වෙයිද අප්පච්චි."

"හ්ම්ම්. හීන් අප්පුට කියපන් වැව් තාවුල්ල ගිහින් මාළු වැව් මාළු ලැල්ලෙන් මාළු දෙන්නෙකුත් අරන් එන්න කියලා. ඒ ටික උයලා පපඩමකුයි මිරිස් කරලකුයි බැදලා ගත්තාම මදැයි."

"හා අප්පච්චි. මං මැණික නංගිටත් එන්න කියන්නම් පොඩ්ඩක් උදව්වට. දැන් ඉතින් දවල් කෑමටත් ලඟ එකේ ඉක්මනින් උයාගන්න ලේසි නේ එතකොට"

"හ්ම් හ්ම් හනික ගිහින් මොනවාහරි තම්බපන්."

කමනීට රාජකාරිය පැවරූ වෙද සීයා ආපසු ඉස්තෝප්පුව දිහාවට එද්දී කමනී නිවසට දුවගෙන ගියේ දවල් කෑම වේල සකස් කල යුතු නිසාවෙනි.

මේ වෙද සීයාගේ විදිය බව වෙද ගෙදර සියල්ලෝම දන්නා කරුණකි. වෙද ගෙදරට එන යන සියලු ආගන්තුකයින්ට අඩුවක් නැතුව සැලකීමට කිසිදක වෙද සීයා පසු බට නොවන්නේ ඔහු තුල වූ අති විශිෂ්ඨ ආගන්තුක සත්කාර ගුණය නිසාවෙනි.
ඒ නිසාම තිදස්ගේ දෙමාපියන්ටද සැලකීමේ කටයුතු කමනීට භාර කලේ ඇයගේ අත් ගුණය හොඳ යැයි සියල්ලෝම දන්නා බැවිනි.

දේදුනු ගේ මුහුණ දැන් මතක් සිසිල් විය. එද්දී ඇය තුල මදක් නුරුස්සනා ගතියක් තිබුණත් වෙද සීයාගේ කතා බහ එක්ක දැන් ඇයද මදක් සිසිල් වීම ගැන තිදස්ට දැනුනේ සතුටකි.

"ලස්සන වැවක් තිබ්බා වෙද මහත්තයෝ එද්දී මේ ලඟම. ආසාවේ බෑ දැක්කාම. "

"වෙද ගෙදර පිටිපස්සෙ ලස්සන දොළ පාරකුත් තියනවා තාත්තා. ඒකෙන් තමා නාන්නේ"

තිදස් තාත්තා ගේ කතාවට අඩු වැඩි එක් කලේය.

"එහේ වගේ නාන්න කාමර හදලා නෑනේ මහත්තයෝ ඉතින් මෙහෙ. වෙද ගෙදර අය නාන්නේ ඔින්න ඔය දොළ පාරෙන් තමා. ගමේ ගොඩක් උන්දැලෑ නම් ඉතින් වැවට ගිහින් නාගෙන එනවා."

"බාත් රූම් වලට වඩා කොච්චර හොදයි ද වෙද සීයේ එහෙම"

තිදස් කිව්වේ සැහැල්ලුවෙනි.

sinhalaebooks.com

දැන් ඔහු තුළ අසනීපෙ සේයාවේ අල්ප මාත්‍රයක් වත් දිස් නොවීය. ඊටත් වඩා ඔහු තුළ වූ අමුතු සතුට හා සැහැල්ලුව වැඩි වී පෙනෙන්නට වීම නිසාවෙන් දිසානායක දෙමහල්ලෝ ඒ දෙස වැඩි උවමනාවෙන් ඔහුට අවධානය යොමු කරන්නට විය.

"මත්තුරුන්ට හදිස්සි නැත්නම් අද හෙට ඉඳලාම යන්න. ගමේ ටිකක් ඇවිදලාම යන්න බැරියැ ඉතින්. නිදහසේ මේ ගම පැත්තේ පොඩි රවුමක් දලා යමු. ඇවිත් දවස් ගාණක් ගෙවිනත් අපේ කොල්ලෝ දෙන්නටත් බැරි වුනා ගම බලන්න යන්න ඔන්."

"මං නම් හිතුවා දෙන්නා බෙහෙත් කෙසේ වෙතත් රවුම් ගහලා නම් ඇති කියලා"

"මොන රවුම් ද ආන්ටි අර පුංචි වෙද නෝනා එක්ක. පුදුම පරිස්සම් කිරිල්ලක් ඒක. අනේ අම්මේ දෙයියනේ ඩොක්ටර් කෙනෙක් වුනු දට ඉතින් බලාගන්න පුලුවන් වෙයි"

අකලංක කිව්වේ ආකශර්‍ා ගැනය.
සැබවින්ම ඇය රෝගින් ගැන දැක් වූයේ පුදුමාකාර අවධානයකි.

"ඔව් ඉතින් බෙහෙත් කරන්න මිසක් නටන්න ආවේ නැනේ"

දිසානායක මහතා කියද්දී තරුණයින් දෙදෙනා නිහඬ විය.
සියල්ලෝම එකිනෙකාගේ කතා අතර අතරමං වෙද්දී එක් වරම අකලංක ට යම් දෙයක් මතක් වීමත් එක්ක එතැනින් නික්මීමට දැඩි උවමනාවක් විය.

"නිදසා... කට්ටිය කතා කරයි වරෙන්කෝ යන්න."

අකලංක නිදස්ගේ කනට කර කියද්දී නිදස් ඔලුව උස්සා බැලුවේ හදිස්සියෙ ම අකලංකට සිද්ධ වූ වෙනස පිළිබඳවය.
සැබැවටම අකලංකගේ හිතට වද දුන් එක කාරණයක් විටා.
ඒ ආකශර්ාය.

"ඇයි බන්..."

"වරෙන්කෝ යන්න."

තරුණයන් දෙදෙනාගේ කුටු කුටුව එසේ දිග්ගැස්සෙද්දී දිසානායක යුවල සහා වෙද සීයා වැට කඩුල්ල දිහාවට පියවර මනින්නට වූයේ ඒ සුන්දරත්වය විඳිමිනි.
සැබෑ ලෙසම ඔවුන් සිටියේ ගමට ආකශර්ය වී යැයි විටෙම නිදස්ටම දැනෙන්නට විය..

"කොහෙ යන්නද බන් කියවන්නේ. යකෝ බලපන්කෝ තාත්තයි අම්මයි ඔන්න අද මෙහෙ නැවතිලාමයි යන්නෙ ඈ. මාර විදිහට මෙහෙ හිතට අල්ලලා ගිහින් නේ. මේ යන විදිහට මේ පැත්තෙ පදිංචි වෙයිද කියන්නත් බෑ ඔන්න"

sinhalaebooks.com

"සමහරවිට උඹට කසාදයක් කරලා දෙන්නත් බැරි නෑ මේ පැත්තෙන්."

"අනේ පලයන් යන්න අකලංක."

"ඇයි බත් පුංචි වෙද නෝනා. බෙහෙත් කරලා ඉවර වෙලා කැන්දගෙන යන්න නෙවෙයි ද කල්පනාව. අඟ් හරි ඒවගෙත් වැඩක් නෑ සුද්දිට මොකද කියලා බලන්න මං මේ යමු කිව්වේ."

"හ්ම් යමු..."

තරුණයින් දෙදෙනා වෙද ගෙදර ඒ කාමරයට පිවිසීම සඳහා යන්න නැගිට්ටේ ආකශ්රාගේ සුවදුක් අහා දැන ගැනීමට අවැසි නිසාය.
ඒත් සිදු වූයේ බලාපොරොත්තු නොවුනු දෙයකි.
එක් වරම තිදස්ට තාත්තා කතා කලේ ඔවුන්ගේ ඒ බලාපොරොත්තු බිඳ දමමිනි.

"අඩෝ බලපන්කෝ ඉතින්. තාත්තා කතා කරද්දි ඇහුන්නෑ වගේ ඉන්න බෑනේ. උඹ ගිහින් බලපන්කෝ සුද්දිව. මං එන්නම් ඇයි කියලා බලලා."

"හා ගිහින් බලලා වරෙන්කෝ එහෙනම්.

දිසානායක මහතාගේ ආමන්ත්‍රණය නිසා අකලංකගෙන් මිදී තිදස් ඔවුන් දිහාවට ගියත් අකලංක , ආකශ්රා ව බලාපොරොත්තුවෙන් කාමරය වෙද පියවර තබන්නට විය.

අකලංක මේ කරන්නේ තම සිත රවටා ගැනීමකි. ඔහුගේ හිතට සුද්දී ලඟ නැවතී හමාරය. නමුදු දැන් කරන්න දෙයක් නැත.
තිදස්ගේ ආදරයට තුන්වැනියෙක් ලෙස අකලංක මැදිහත් වුවහොත් එය මිතුරාට කරන ද්‍රෝහි කමකි. තිදස් ආකශ්රාට ප්‍රේම කරනා බැව් දැන දැනම ඔවුන් අතරට ඒමට ඔහුට සිත් නොවීය.

"ඒත් මට ආකශ්රා ට කොහොමද කියලා බලන්න ඕනේ"

අකලංක කුටියට ඇතුළු වෙද්දීත් ආකශ්රා හිටියේ මද නින්දකය. ඔහු මොහොතක් ඇය දෙස බලා සිටියේ ඇය තුළ වූ සුන්දරත්වය දෙසය.

"කොච්චර කෙල්ලො දැකලා තියනවා ද. ඒත් මේ කෙල්ලගෙ තියන ඒ අමුතු ගතිගුණ ඒ ලස්සන. අනේ මන්ද. උඹ මාරම පින් පාටයි සුද්දියේ.සමහරවිට උඹට මේ ගහ කොළ වලින් ලැබෙන ආශිවර්ාදය වෙන්න ඇති."

අකලංක සයනට අසලට එද්දී නින්දේ වුවත් ඒ මුවේ වූ සිහින් සිනහව දැක මදක් බලා සිටියේ අමාරුවෙන් වුනත් ප්‍රේමය යටපත් කරගෙනය.

sinhalaebooks.com

"සැනසිල්ලේ නිදි. වෙද ගෙදර කාගෙත් ආදරේ සුද්දි කෙල්ල"

අකලංක හිමින් සීරුවේ ආකශර්‍රාගෙ හිස පිරි මදින්නට විය.
සිහින් කෙස් රැලි ඇඟිලි තුඩු දුවටෙද්දී අකලංක ඒ හැඟීම එක්ක මොහොතකට තනි වුනේ ආකශර්‍රාගේ මුව දෙස බලාගෙනය.

"කොච්චර බලාගෙන හිටියත් උඹ මගෙ නෙවෙයි නේ මැණික"

අකලංක තනියෙන් ම කල්පනා කරන්නට විය.

අකලංක ගේ සිහින් පිරි මැදීම නිසාදෝ මන්ද එක් වරම ආකශර්‍රා නෙත් විවර කලේ ඒ ස්පශර්ය ඇයට නුහුරු නිසාවෙනි.

" ස් සුද්දි. දැන් කොහොමද කෙල්ල..."

"අකලංක. ඔයා ඔයා මෙතන... ක් කෝ තිදස්"

නින්දෙන් පිබිදුනු ආකශර්‍රා සියල්ලට ප්‍රථම තිදස් ගැන විමසද්දී හිතට දැනුනු සිහින් වේදනාව එක්ක පුංචි හිනාවකින් ආකශර්‍රා ට සංග්‍රහ කල අකලංක ඇයට දිය යුතු උත්තරයක් ගැන කල්පනා කරමින් අසල වූ පුටුවකින් වාඩි වුනේ කිසිදු අදහසකින් තොරවය.

" ස් සුද්දි. දැන් කොහොමද කෙල්ල..."

"අකලංක. ඔයා ඔයා මෙතන... ක් කෝ තිදස්"

නින්දෙන් පිබිදුනු ආකශර්‍රා සියල්ලට ප්‍රථම තිදස් ගැන විමසද්දී හිතට දැනුනු සිහින් වේදනාව එක්ක පුංචි හිනාවකින් ආකශර්‍රා ට සංග්‍රහ කල අකලංක ඇයට දිය යුතු උත්තරයක් ගැන කල්පනා කරමින් අසල වූ පුටුවකින් වාඩි වුනේ කිසිදු අදහසකින් තොරවය.

"තිදස්. අභ් තිදස් එයි. එයා තාත්තා කතා කරලා ටිකක් ඒ පැත්තට ගිහින් එන්න ගියා කෙල්ලේ. ඉක්මනින් එයි. කොහොමද කියන්නකෝ ඔයාට දැන්."

"අනේ එහෙම අසනීපයක් කියන්න තරම් අමාරුවක් නෑ අයියෙ. කැරකිල්ලක් වගේ ආවා එච්චරයි මතක."

ආකශර්‍රා කිව්වේ ඇඳ වියලට හේත්තු වෙන ගමන් ය.

ඒ ඇස් වල තාමත් වෙහෙසකර තත්වය පහව ගොස් නැති බව අකලංකට හොඳටම පෙනී ගියේ ඒ තරමය ඇය අමාරුවෙන් සිටි නිසාවෙනි.
වෙනදා පිපුණු මලක් මෙන් සිනාසුනු ආකශර්‍රා අද මදක් මැලවී ගොස් ය.
අහිංසක කැලෑ මල...

sinhalaebooks.com

අකලංක මොහොතක් ඇය දෙසම බලා හිඳින්නට විය.

"යමු නේද අයියේ එළියට. මෙහෙම ඇඳට වෙලා ඉන්නත් බෑනේ."

"හෝ හෝ මේ මොකද මේ. කොහෙ යන්නද දැන් ඔය දඟලන්නෙ ආකශරා. තාම හොඳටම හොඳ නෑනේ ඔහොම විවේක ගන්න ටිකක්."

"අයියෝ මට ඇති අසනීපයක් නෑ අකලංක. පුලුවන් නම් මට වතුර චුට්ටක් දෙන්නකෝ බොන්න. ඔය මේසේ උඩ තියනවා නේද වීදුරුවක්."

ආකශරා සයනයෙන් බැසීමට උත්සාහ කරමින් කියද්දී අකංලක අසල මේසය මත වූ වතුර වීදුරුව ගෙන ඔහු එයින් වතුර ස්වල්පයක් සුද්දීට පෙව්වේ පුදුමාකාර ආදරයෙනි.

සැබවින්ම ඇය සිත නිවන භාවනාවක් වැනිය.

අකංලක ඇයට ඇති තරමින් වතුර පානය කිරීමට ඉඩ හැරියේය.

"යන්න ඕනෙ මට එළියට"

"සුද්දී...."

"අනේ යන්න ඕනේ"

"හා යමු. ටිකක් හුලං වදින්න එළියට බහින එකත් හොඳයි. හැබැයි ඕනවට වඩා මහන්සි වෙන්නයි කල්පනා කරන්නයි තියාගන්න ඔට්ටු නෑ ඔන්න ආයෙ අසනීප වෙයි එහෙම වුනොත්"

අකලංක කියද්දී ආකශරා උවමනාවෙන් ඔහු දෙස බැලුවාය.

"ඉතින් අනේ මං හිතලා අසනීප වුනේ නෑනේ අනික ඉතින් මං කල්පනා කරන්නෙත් නෑ මහන්සි වෙන්නෙත් නෑ"

"අනේ....මෙන්න කල්පනා කරන්නෙම නැති එක්කෙනා. මං ඕන තරම් දකිනවා ගේ ඉස්සරහ වාඩි වෙලා කල්පනා කර කර ඉන්නවා. මොනවාද දන්නෑ පුංචි වෙද නෝනට කල්පනා කරන්න තියෙන්නේ ඔච්චරටම"

"අහ්.......ඔයා මොකද මං කරන කියන දේවල් දිහා බලන් ඉන්නේ."

ආකශරා කියද්දී අකලංක ඉබේම නිහඬ විය.

sinhalaebooks.com

"හිතලා බලනවයැ. බැලෙනවනේ. හිත උඹව ඉල්ලද්දී ඇස් හොයන්නේ උඹවනෙ. ඉතින් මං ඒක නවත්තන්නෙ කොහොමද"

අකලංක හිතන්නට විය.
සැබවින්ම හිත දැන් ආකශ්රාව ඉල්ලන්නට පටන් ගෙන හමාරය. ඇස් ද දැන් ආකශ්රාව සොයන්නට පටන් ගෙන තිබිණි.
ඒ නිසාම දැන් අකලංක ගේ හිතෙහි ඇති මූලිකම සිතුවිල්ල "සුද්දී" පමණි.

"මොකද වණ්ඩියා සද්දෙ වහලා. යමුද"

ආකශ්රා නැගී සිටිමින් කියද්දී අකලංක ගේ දෑත් ඉබේම දික් වූයේ ඇයව අල්වා ගැනීමටය.

"තනියෙත් යන්න පුලුවන් අයියෝ. අල්ලගෙන ඇවිදින්න තරම් අමාරුවක් නෑ"

සුද්දී කියද්දී අකලංක සිනාවකින් සංග්‍රහ කලා පමණි.

"ආකශ්රා, මං කොහොමද කියන්නේ මං උඹට ආදරේ කරන්න පටන් අරන් කියලා. මට බෑ ඒක කියන්න. තිදස් උඹට ආදරෙයි කියලා දැන දැනම මට බෑ මගෙ යාළුවට ද්‍රෝහියෙක් වෙන්න. ඒත් එහෙමයි කියලා මං කොහොමද උඹේ මූණ දැක දැක මේ ආදරේ හිතේ හිර කරගෙන ඉන්නේ සුද්දියේ"

කාමරයේ සිට එලියට යන ආකශ්රා පිටුපසින් ගමන් කරමින් අකලංක සිතන්නට විය.

මෙහි ඇත්තේ එකම ප්‍රශ්නයක් පමණි. ඒ තිදස් සුද්දී ආදරේ බවය.

"යමුද පොඩි රවුමක් දාලා එන්න"

එලියට එද්දීම තිදස් ඇහුවේ අකලංක දෙස බලමිනි.

"සීයේ මාත් යන්නද"

ආකශ්රා ඇසුවේ වෙද සීයාගෙන් අවසර බලාපොරොත්තුවෙනි. අනවසරයෙන් සුද්දී ට මේ වැට කඩොල්ල පැනීම තහනම් ය. කිසිදම තහනම් නීති කඩ කරන් නැත. ඒ නිසාම ආකශ්රාට සීයාගේ අවසරය අවැසි විය.

"හා ගිහින් වරෙන්. මහත්තුරුත් ඉන්නවානේ හැබැයි පරිස්සමින්. ඔලුවෙ කැක්කුමක් වත් එයි අයෙ කැරකැවිල්ලට වගේ ආවොත් ඉවරයි නේ"

සීයාගේ උපදෙස් මත තරුණයින් දෙදෙනා හා දෙමාපියන් සමග වැට කඩුල්ල පැන වැව් තාවුල්ල දිහාවට ගමන් ඇරඹීයේ මිටින් හල කිරිල්ලියක් විලසිනි.

sinhalaebooks.com

ඉද හිට ලැබෙන නිදහස එක්ක කොලූ කෙලි රූන එක්ක කෙලි සෙල්ලමට එක් වූවා මිස සුද්දී වෙද ගෙදරින් එලි බහින්නේ කලාතුරකිනි.
ඉතින් එවැනි තත්වයක මෙවැනි අවස්ථාවක් ලැබීම ගැන හිත යටින් සතුටක් දැණිනි.

ඔවුන් පිටත් වී යාමෙන් අනතුරුව වෙද නිවස තුල මහා හයියෙන් කෑ ගසමින් කමනී දිව ආවේ මිදුලේ සක්මන් කරමින් සිටි වෙද සීයා සොයාගෙනය..

"මොකද කෙල්ලේ යටි ගිරියෙන් කෑ ගහන්නෙ. අහල පහල මිනිස්සු හිතයි මෙතන මිනියක් මරනවා කියලා. මොනවා වෙනවද බත් උඹට දැන් එක පාරටම. ලඟකදි ඉදලා මොන යකෙක් ගහලද මන්ද ඇත්තටම. ඔක්කෝටම කලින් උඹට බෙහෙත් කරලා ඉන්න වෙයි වගේ හැමදේම පැත්තකට දලා"

"අප්පච්චී සුද්දී.....සුද්දී කෝ අප්පච්චි. ඈදේ නෑනේ. කෝ අර ආපු අය. එයාලා ආපහු ගෙදර ගියාද. සුද්දිත් එයාලා එක්ක එහෙ ගියාද අප්පච්චි."

"ඒ මහත්තුරු ගෙදර ගියාද නැද්ද කියලා පොඩ්ඩක් ඇස් ඇරලා බලපන්කෝ. ගෙදර යන්නෙ වාහනේ මට දීලද. ආන් වාහනේ. ගෙදර ගියෙ නෑ ඇවිදින්න ගියෙ. අනික ඉතින් සුද්දී ඒ මහත්තුරු එක්ක එහෙ යන්න අපේ සුද්දි ඒ මහත්තුරුන්ගෙ දරුවෙක් යෑ. උඹට පිස්සු කමනියෝ."

"කෝ එහෙනම් කෙල්ල. නිදාගෙන හිටිය කෙල්ල කොහෙවත් නෑ වෙද ගෙදර "

"කට්ටිය එක්ක පොඩ්ඩක් ඇවිදින්න ගියා. මැරෙන්නෙ නැතුව හිටපන් කෙල්ලට ඉහෙන් බහින රෝගයක් නෑ උඹලා මෙතන නැටුවට. "

"ඇවිදින්න ගියා...ම් මේ අපේ සුද්දී. ක්ක් කාත් එක්කද අප්පච්චි.කාත් එක්කද"

කමනී ඇසුවේ කලබලයෙනි.
තිදස් ගෙන් ඈත් කරන්න හැදුවත් ඇය තිදස් හා යහමින් කතා බහ කරන්නීය.
දැන් දිසානායක යුවල.,
ඔවුන්ද ඇයට ලන්වෙති.

කමනීගේ ඔලුව දැන් යකාගේ කම්මලක් සේය.

"මගෙ කෙල්ල මට නැති වෙනවා මෙහෙම ගියොත්....."

කමනී කල්පනා කරමින් එහෙ මෙහේ අත ඇස් කරකවන්නට වූයේ ආකශරාව සොයන්නට මෙනි..

"මැරෙන්න කෑ ගහන්න දෙයක් නෑ ඒකි ගිය විදිහට ම පරිස්සමින් ආපහු එයි. බය වෙන්න දෙයක් නෑ උඹ ගිහින් උඹේ වැඩක් බලාගනින්. මගෙ යකා අවුස්සන්නෙ නැතුව. මොකෝ

sinhalaebooks.com

ඒකිට මේ ගම නුහුරු තැනක් යැ..එක එක කාලෙට උඹලගෙත් වෙස් පෙරලෙනවා කමතියෝ"

කලබලයෙන් සිටි කමතීට මදක් සැරෙන් උත්තර සැපයූ වෙද සීයා ආයෙම ඇය දෙස බලා වෙද නිවස දිහාවට පියවර මැන්නේ කමතීට හිතින් බැන වදිමිනි.
"ආකශ්රා ආස නැද්ද ටවුන් එකට යන්න"

දිසානායක මහතා කියද්දී සියල්ලෝම ඒ දෙස උවමනාවෙන් බැලුවේ පුදුමයෙනි. සැබෑවටම එය පුදුමයකි. ඔහුට එක්වරම හිතට නැඟුනු සිතිවිල්ල සියල්ලටම පුදුමයක් වුනත් කිසිවක් නොකියා දිසානායකට ඇහුම්කන් දීමට පමණක් තීරණය කලේ ප්‍රශ්නයක් වේ යැයි සැකයෙනි.

"ඇයි මහත්තයෝ එහෙම ඇහුවේ"

"මහත්තයෝ කියන්න දෙයක් නෑ දරුවෝ අංකල් කියන්න"

"අංකල් නෙවෙයි තාත්තේ, මාමා. "

තිදස් කිව්වේ ආකශ්රාව අපහසුතාවයට පත් නොකරය. ආකශ්රා යනු ගමේ යුවතියකි. ඇයට හුරු ගමේ ගහ කොල ඇළ දොළ කතා බහා ය. ඇය ආදරේ කරන්නේද ඒ ලෙංගතුකමටය. එය තිදස් හා අකලංකද තේරුම් අරන් තිබුණි.

"කවුරු හරි කමක් නෑ. ඔය දරුවා ආස නැද්ද ටවුන් එකට ගිහින් හොඳට ඔය දැනුම දියුණු කර ගන්න. කැමති නම් මට පුලුවන් උදව් කරන්න. සල්ලි ප්‍රශ්නයක් කර ගන්න එපා. වෙද සීයාගේ ගතිගුණ දැක්කාම මට හිතුනා මගෙනුත් මොනවාහරි උදව්වක් කරන්න ඕනේ කියලා"

"එහෙනම් තාත්තා අපි එක්කගෙන යමු සුද්දීව එහේ. එතකොට අපිට පුලුවන් නේ මෙයාට තව ඉගෙනගන්නත් උදව් කරන්න. නේද අම්මා"

"මං දන්නෑ ලමයෝ ඕවා. තාත්තලා පුතාලා ඕන දෙයක් කරගන්න. මං ඕවට උත්තර දෙන්නෑ"

දේදුනු කියද්දී ආකශ්රාගේ හිත ගැස්සිනි. ඇය තාමත් සිටින්නේ වැඩි හිත් හොදකින් නොවන බව විශ්වාසය.

"ඒක මං වෙද සීයා එක්ක කතා කරන්නම්කෝ. දැන් යමු කට්ටිය වැව පැත්තට"

දිසානායක කියද්දී ආකශ්රා දීප්තිමත් වූ දෑස් දල්වා ඔහු දෙස බලන්නට විය.
තිදස් හා අකලංක මිස්ටර් දිසානායකගේ යෝජනාවට කැමැත්තක් දැක් වූවත් ඒ බවක් නොපෙන්වා ඉන්නට වග බලාගත්තේ ඔහුගේ හිතට සැකයක් උපදී යැයි බිය නිසාවෙනි.

sinhalaebooks.com

ඉන් අනතුරුව සියල්ලෝම වැව් තාවුල්ලට දිහාවට ගමන් ගත්තත් නිදස් හා අකලංක මාරුවෙන් මාරුවට ආකශ්රා දෙසට නෙත් යොමන්නට විය.
වැව් තාවුල්ල දෙසට ගමන් ඇරඹී සියලු දෙනා දිගින් දිගටම කතා බහේ යෙදෙන ට වූ අතර ආකෂ්රාගෙන් ගමේ විස්තර අසන්නට වූයේ දැඩි ආශාවෙනි.
ආකශ්රා ද ගමේ විස්තර සියල්ලන්ටම පවසමින් පුදුම ආශාවකින් වැව දෙසට ගමන් කරන්නට විය.

" නෙළුම් මලක් කඩා ගන්න බැරිද ආකෂ්රා. ආසයි වැවේ පැනලා නාන්න එකම එක පාරක් හරි මාරම ලස්සනයි නේද ?"

" නාන්න කලින් ලෙඩ හොඳ කරගෙන ඉන්න ළමයා ඉක්මනට ගෙදර යන්න කියලා කිසිම ආසාවක් නැද්ද. මං මේ ඔයා ගෙදර එනකන් කියලා කොච්චර අමාරුවෙන්ද බලාගෙන ඉන්නේ . ගෙදර ඉන්න එකම එකත් ගෙදර නැති උනහම ඒ විදින වේදනාව දන්නේ අම්මෙක් විතරයිනේ"

" අයියෝ හරි අම්මා ආසාව කිව්වා විතරයි නේ ඉතින්. මං නාන්න ගියේ නෑ නේ."

" ගණන් ගන්න එපා පුතා කොහොමත් අම්මට මේ දවස් වල ටිකක් තරහ යනවා වැඩියි. සමහරවිට ඔයා ගෙදර නැති හින්ද වෙන්න ඇති. කමක් නෑ ඉක්මනට ලෙඩ හොඳ කරගෙන ඉමුකෝ. දැන් ඉතින් මෙතන කයිය ගහලා වැඩක් නෑ අපි යමුකෝ චුට්ටක් ඉස්සරහට ඇවිදලා බලන්න. ආකශ්රා, දරුවෝ නැද්ද දන්නේ නෑ මොනවා හරි ගහේ වැලේ ගඩා ගෙඩියක් කඩාගන්න"

මිස්ටර් දිසානායක අම්මා පුතු රණ්ඩුව නැවැත්වීමේ බලාපොරොත්තුවෙන් එසේ කිව්වේ ආකෂ්රා දෙස ආදරණීය බැල්මක් හෙළමිනි. ඒ සමගම ආකෂ්රාටද ඇතිවුණු ඒ ආසාව නිසාම ඇය ද මොනවා ගඩා ගෙඩියක් කඩා ගැනීමට එහෙ මෙහෙ බැලුවේ ළඟපාතක හෝ එසේ මොනවා හරි සොයා ගැනීමට ඇත්දැයි ඇති සැකය හිතේ රඳවා ගනිමිනි.

" අර පැත්තට යමු ඒ පැත්තට ගියොත් අපිට සමහර විට අඹ ගෙඩියක් එහෙම හොයාගන්න පුළුවන් වෙයි"

ආකශ්රා කිව්වෙ දැඩි උනන්දුවකිනි. සියල්ලටම වඩා ගමේ සුන්දරත්වය රස විදීමට මිස්ට දිසානායකට තිබුණේ පුදුමාකාර උනන්දුවකි. මීට පෙර නොවිඳි අත්දැකීමක් හරි අපූරුවට විඳිමින් ට දිසානායක එහෙට මෙහෙට ඇවිදින්නට වූයේ නිදහසට හා අකලංකට ද විවිධ සංඥා ලබා දෙමිනි.

" පුතා , තාත්තා නම් අපිත් එක්ක ගෙදර යන පාටක් නැති වෙයි වගේ. "

" අම්මා එහෙනම් මායි තාත්තයි මෙහේ නවතින්නද"

sinhalaebooks.com

" තාත්තටයි පුතාටයි ඉතින් කොහොමත් තියෙන්නෙ එකම ආසාවල් නෙ. ඉන්න ඕනේ නම් ඉන්න එකයි ඇත්තේ ඉතින් මට මොකද"

දේදුනු කිව්වේ තරමක් කේන්තියෙනි. දේදුනු ගේ තත්ත්වය කොහොමත් දන්නා නිසා තිදස් සහ මිස්ටර් දිසානායක මුහුණෙන් මුහුණ බලාගෙන සිහින් සිනහවක් පෑවේ දේදුනු නොපෙනෙන ලෙසිනි. මේ සියල්ල දෙස අකලංක සහ ආකෂරා බලා සිටියා මිස උත්තර බැඳීමට නොගියේ ඔවුන්ට ඒ ගැන කිසි සම්බන්ධයක් නො වුණු නිසාවෙනි.

කෙසේ වෙතත් යනෙන සෑම තැනකම අකලංකගේ දෑස් ද තිදස් දෑස් ද නිතර නිතර ම ආකශරා වෙත යොමු ව තිබුණේ එකිනෙකාට නොදැනෙන විලසිනි.
ආකෂරා බොහෝවිට නිශ්ශබ්ද වූවා මිස කිසි කෙනෙකු හා කතා කිරීමටවත් ඔවුන් හා උත්තර වැටීමට වත් ඔවුන් හා සිනාසීමට වත් නො ගියේ මේ මොහොතේ නිශ්ශබ්දව සිටීම හොඳ ම හොඳම විදිය බව ආකෂරාට හිතට දැනුනු දැනුන නිසාවෙනි .

" තාත්තා කොහොමත් මගේ ලෙඩේට බෙහෙත් කරල ඉවර වෙන්න තවත් සතියක් වත් යනවා. මාව එක්ක යන්න ඔයාලට එන්නම වෙයි කොහොමත් ඔයාලා අද යන්නෙ නෑ නේ හෙට නේ යන්නේ. "

"ඔව් පුතා කොහොමත් ඔයා එක්ක යන්න අපි එන්නම ඕනේ. අනිත් එක මම වෙද සීයත් එක්ක කතා කරන්න ඕනේ ආකශරාගේ වැඩේ ගැනත්."

" එ කිව්වෙ අංකල් මේ ආකෂර් ව නුවර එක්ක යනවා කියපු කතාව ඇත්ත ද "

" ඔව් අකලංක මං ඇත්තටම තමයි කිව්වේ අනික මේ දරුවා වෙදකම් වලටත් හොඳටම දක්ෂයිනේ මේ හින්ද මට හිතෙනවා නුවර ගියොත් එයාට මීට වඩා හොඳ දෙයක් ඉගෙන ගන්න පුළුවන් වෙයි කියලා. වෙද සීයගෙත් අකමැත්තක් නැති වෙයි අපි බලමුකෝ නේද කතා කරලා. ඉන්න තැනක් ගැන බයවෙන්න දෙයක් නැනෙ ඉතිං අපේ ගෙදර ඉන්න පුළුවන්නේ."

" ඒත් තාත්තේ ආකශරාගෙ අම්මා එහෙම කැමති වෙයිද දන්නෑ"

" සීය කැමැති වුණොත් ඉතිං අම්මා අකමැති වුණත් කරන්න දෙයක් නෑ නේ. අනෙක් ඉතිං ආකෂර් වුණත් අකැමැති මැති වෙයි කියලා මම නම් හිතන්නේ නෑ "

අහල තිබූ අඹ ගසකින් අඹ ගෙඩි කිහිපයකුත් කඩා ගෙන වැව් තාවුල්ල දිගේ ඇවිදගෙන යන සියල්ලෝම කතාබහ කළේ ආකෂරාගේ නුවර ගමන ගැනය . දේදුනු තරමක් ඒ කතාබහට අකමැති වුනත් වුණත් මිස්ටර් දිසානායකගේ තිබූ උනන්දුව නිසා තිදස් සහ අකලංක ද ඒ ගැන දිගින් දිගටම කතා කරන්නට යොමු වූයේ ඔවුන් ද ආකෂරාගේ නුවර ගමනට වැඩි මනාපයක් දපු බැවිනි. අහම්බෙන් මෙන් මෙවැනි තීරණයකට මිස්ට දිසානායක එළඹුනත් ඒ ගැන මහා ලොකු අකමැත්තක් ආකෂරා ගේ ද නොතිබුණේ වෙදකම ගැන ඉගෙන ගැනීමේ ලොකු ආසාවක් ආකෂරාගේ හිතේ පැළපදියම් වී තිබෙන නිසාවෙනි.

sinhalaebooks.com

" පරක්කු නොවී අපි යමු නේද වෙත ගෙදරට. මද්දහනේ ඉර එළියත් එක්ක තිරස් ට හොඳත් නෑ. තාම හොඳට හොදත් නෑනේ. අනිත් එක මෙයාගේ මේ ඔලුව කැක්කුමට ගොඩක් එළියෙ ඇවිදින්න හොඳ නැති වෙයි."

කතාබහ වෙනත් අතක් අතකට හරවමින් ආකෂර්ා ඔවුන් ව උනන්දු කරේ වෙද ගෙදරට යාමට ය.

උඹ නම් තනිකරම පිස්සුවක් ආකශර්ා. උඹ දිහා බලන් ඉඳලම මට දැන් හරි මහන්සියි. ඒත් ඒ හිතේ තියෙන කිසිම දෙයක් මට කියාගන්න බැරි උනහම දැන් මට හිතටත් මහන්සි. තිදස් නොහිටියා නම් මම මෙච්චර මේක උඹට කියන්න හිත හිතා ඉන්නෙ නෑ ආකශර්ා. මට බෑ තිදස් ගේ ආදරේට ද්‍රෝහීයෙක් වෙන්න. මං හොඳටම දන්නවා ඌ උඹට ආදරේ කියන්න. ඒත් උඹේ ඔය වචනවලින් උඹේ ඔය හැසිරීමෙන් මාව පිස්සු වට්ටද්දී මට තවත් මේ හැමදේම හිතේ හංගගෙන ඉන්න හයියක් නෑ ආකෂර්ා.

හිනා වෙවී කතා කරන ආකෂර්ා බලාගෙන අකලංක එහෙම හිතුවේ වෙන කරන්න දෙයක් නැති නිසාවෙනි.

කළු පාටට දිලෙසෙන ඉන ගාවට දිග කිතුල් රැනක් මෙන් කඩාහැලෙන කේශ කලාපය,
ඇඹූ පිළිමක් සේ දිදුලන අපූරුම රූ සපුව,
ලා රත් පැහැ ගැන්වුනු නා දළු වන් දෙතොල,
කතා කරන ඇස්,
ඊටත් වඩා හිත වශී කරන හඬ,

සැබවින්ම ආකශර්නයකි.

වචන පරිසමාප්ත අථර්යෙන්ම ඇය ආකශර්ාය.

" පුංචි වෙද නෝනා කියන කියන දේ අහන්න ඕන නේ. තාත්තා අපි යමු නේද එහනම්"

තිදස් කිව්වේය.

ආකශර්ාගේ ඉල්ලීමට සියල්ලෝම වෙද නිවස බලා ගමන් අරඹද්දී එක්වරම ඇතින් මතු වූ රුවත් සමඟ ආකශර්ාගේ ගමන මදක් පසු බැස්සේ කිසිම දෙයක් හිතා ගන්නට ඇයට බැරි වූ බැවිනි.

" සුපුන් අයියා "

ආකශර්ාගේ දෙතොලින් හිමින් සීරුවෙ ඇය මුමුණන්නට වූයේ ඒ රුව ඇය හොඳ හැටි හඳුනා ගත් බැවිනි.

sinhalaebooks.com

" ඇයි ආකෂරා"

ආකශරා ගේ වෙනස යන්තමින් තේරුණ නිසා තිදස් ඇසුවේ සැබෑවටම ඒ කුමන හේතුව නිසා දැයි දැන ගැනීමේ අවශ්‍යතාවයක් ඔහුටද තිබුණු බැවිනි. සුපුන් යනු වෙද ගෙදරට ආගන්තුකයකු නොවේ. ඉඳහිට වෙද ගෙදරට පැමිණෙන සුපුන් බොහෝ විය එහි පැමිණෙන්නේ ආකශරා හා කතා බස් කිරීමේ බලාපොරොත්තුවෙනි.
නමුත් ඔහුගේ පැමිණීමට වෙද සීයගෙ ඒ තරම් කැමැත්තක් නැති නිසාම ආකශරා ද ඔහු සමඟ කතා කිරීමට මැලි තාවයක් දැක්වූවාය.

" මොකුත් නෑ තිදස්"

" අර වෙද ගෙදර ගෙදරට නිතරම එන අයියා නේද මේ එන්නේ"

දුර තියාම ඔහු හඳුනාගත් අකලංක ද ආකෂරාට උත්තර බඳින්නට විය.

" සුද්දී නංගී කොහෙද යන්නේ"

" මේ මහත්තුරු එක්ක ගමේ පොඩ්ඩක් ඇවිදින්න ආවා සුපුන් අයියේ. ටවුන් වල මහත්තුරු හරි ආසයි නේ ගමේ ඇවිදින්න"

සුපුන්ව ගාණකට නොගෙන ආකශරා කීවාය.

"උඹට ඉතින් වටුන් වල මහත්තුරු එක්ක ඇවිද ඇවිද ඉන්න වෙලා තියෙනවා අපිත් එක්ක වෙදගෙදරට ආවත් කතා වචනයක් කතා කරන්න තමයි වෙලාව නැත්තෙ "

සුපුන් කිව්වෙ ඇනුම් පදයකි

කොහොමත් ඔහු හා වැඩි කතාවට යන එකට වෙද සීයා කැමැත්තක් නොදැක්වූයේ ඔහු ආකශරා ගැන වැඩි අවධානයක් යොමු කරනා බැවිනි.

" පිස්සුද මන්ද"

"හ්ම් බලාගමුකෝ. මං යනවා"

නෝක්කාඩුවට මෙන් වචන කියමින් සුපුන් පිටව ගියේ ආකෂරා දෙස රවා බලමිනි.
ඒ පිළිබඳව ආකාශා කිසිදු තැකීමකින් තොරව ඇයගේ ගමන ඇය යන්නට විය. ආකාශරා ඔහුව ගණන් නොගැනීම ගැන ද සුපුන්ට තිබුණේ දැඩි කේන්තියකි. ඒ කෙසේ වෙතත් සුපුන් පිටුවේ යෑමෙන් අනතුරුව ආකෂරා සියලු පිරිස ද කැටිව හෙට නිවස බලා පිටත් වූයේ දහවල් ආහාරයට ද වෙලාව ළං ව තිබූ නිසාවෙනි..
පිරිස වෙද ගෙදරට සේන්දු වන විටත් ආකශරාගේ මව වෙද ගෙදර ඉස්තෝප්පුවේ රැඳී සිටියේ තරමක් නොසන්සුන් තාවයකිනි.

sinhalaebooks.com

" කොහෙද ලමයෝ මෙච්චර වෙලා පරක්කු වුනේ"

කමනි දිව චිත් ආකෂර්ාට කියද්දී සියල්ලෝම ඇ දෙස පුදුමයෙන් බලන්නට විය...

" කොහෙද ලමයෝ මෙච්චර වෙලා පරක්කු වුනේ"

කමනි දිව චිත් ආකෂර්ාට කියද්දී සියල්ලෝම ඇ දෙස පුදුමයෙන් බලන්නට විය...

" එච්චර වෙලාවක් ගියේ නෑ නේ අම්මෙ ඉතින්. "

ආකෂර්ා නලවමින් කියන්නට විය. ඒත් එක්කම කමනි වෙද ගෙදර ඇතුලට ගියේ සියල්ලන්ට දිවා ආහාරය සඳහා ආරාධනයක් ලබා දෙමිනි
කමනීගේ ආරාධනය පිළිගත් සියල්ලෝම වෙද ගෙදරට පැමින සුලු පැමිණ සුළු මොහොතකට පසු ආකශර්ාගේ නිවසට සේන්දු වී උනේ දිවා ආහාරය ලබා ගැනීමේ බලාපොරොත්තුවෙනි.

" සැහෙන්න කාලෙකට පස්සේ ගමේ කෑම කන්න පුළුවන් වෙයි ඒ වගේ අද "

මිස්ටර් දිසානායක ආහාරවේලට ප්‍රථම සියල්ලෝම අමතා කියන්නට වූයේ පුදුමාකාර සතුටකිනි.
අනෙක් කතා බහ සියල්ල පසෙකට දැමූ සියලු දෙනා ආහාර ගැනීම සඳහා සූදානම් වූයේ එකිනෙක දෙස බලා සිනහ මුසු මුහුණකිනි.

" අහපංකෝ අකලංක. මට වෙලාවකට හිතෙනවා බං හිතේ තියෙන එක ආකශර්ාගේ අම්මට කියලා දන්න"

" මොකක්ද බං උඹ ආකෂර්ට කැමැතියි කියන එකද "

" නැතුව ඉතින් වෙන කියන්න දෙයක් නෑනේ බන්."

සියල්ලෝම කෑම මේසෙ වාඩි වන අතර දුර අකලංක සහ තිදස් මදක් මද වේලාවක් මිදුලේ රැඳී සිටිමින් කතා කරන්නට වූයේ ඔවුන්ගේ හිත් තුළ වූ ගැටලුව පිළිබඳව ය. සත්‍ය වශයෙන්ම තිදස්ට දැන් වුවමනා වූයේ ද ඔහුගේ හිතේ වූ දේ කමනි හා ආකශර්ා සමග කතාබහ කරමින් එයට පිළිතුරක් ලබා ගැනීමට ය.
ආකෂර්ා ගෙන් සෘජුවම පිළිතුරක් නොලැබෙන බව තිදස් දැනුණු නිසා ම ඔහුගේ තීරණය සෘජුවම ඇයගේ මව සමග කතා කිරීමට සිතු නිසා ඒ කාරණය පිළිබඳව අකලංක ට ද දැන් වූයේ තිදෙස් ගෙ හිතේ ආකෂර්ා ගැන වූ කාරණය ඔහුද දන්නා බැවිනි.

" උඹ මේ තීරණය ගත්ත ඉක්ම වැඩියි කියලා හිතෙන්නේ නැද්ද තිදස්"

sinhalaebooks.com

" අදම මේක කියලා ඉවරයක් කලාම සමහරවිට එයාලගෙ අම්ම අපේ අම්මලත් එක්ක කතා කරයි නේ අකලංක. ඒ හින්දයි මම හිතුවේ මේක අදම කියලා දනවා කියලා"

" මට හොඳයි කියලා හිතන දෙයක් කරපන් තිදස්. උඹේ ඕන ප්‍රශ්නයකට මම ඉන්නවා කියලා උඹ දන්නවනේ"

අකලංක කියන්නට වූයේ මදක් හිත් රිදීමක් ද සමගිනි.

ආකෂරා ,
ඔන්න ඔහේ මගේ හිතේ තියෙන හැඟීම, මගේ හිතේ තියෙන අදහස, මගේ හිතේ තියෙන ආදරේ, මේ හැමදේම මගේ හිතේ හිතේ ම තිබුනාවෙ.
මං උබට ආදරෙයි කියන එක උඹවත් දැනගන්න ඕනේ නෑ ආකෂරා. මගේ හොඳම යාලුවා වෙනුවෙන් මට පුළුවන් මගේ ආදරේ කැප කරන්න.

තිදස් ගෙ කතාබහ එක්ක අකලංක මොහොතක් තම හිත සමග වාද කරන්නට වූයේ ඔහුගේ හිතේ ද ආකශරා පිළිබඳව තිබූ අසීමාන්තික ආදරය තදින්ම වද දුන් නිසාවෙනි.

" පුතාලා දැන් ඇති නේද මිදුලට වෙලා කයිය ගැහුවා එමුද කෑම කන්න"

කමනී තරුණයින් දෙදෙනාට අඬ ගසන්නට වූයේ ඔවුන් දෙදෙනාගේ ප්‍රමාදය නිසාවෙනි.

" යමු බං බය වෙන්න එපා උඹේ ඔය ආකෂරගෙ ප්‍රශ්නය උබට බැරි නම් මම හරි කතා කරන්න මං කරන්නම් අංකල් එක්ක. මෙය අකලංක ඉන්නවා බං උඹ වෙනුවෙන් ඕන දේකට. යමු කෑම කාලා ඉමු. නැත්තං අංකල් වුණත් සැක හිතන්න පුළුවන් අපි දෙන්න මෙච්චර මේ තනියෙන් කයිය ගහන එක ගැන"

අකලංක තිදස් වත් කැඳවාගෙන කෑම කාමරය වෙත පිවිසෙන්න ට වූයේ සියල්ලන් සමග ආහාර ගැනීමේ බලාපොරොත්තුවෙනි. කමනී විසින් සකස් කරන ලද ආහාර හරි අපූරුවට සියල්ලන්ම රසවිඳ විඳිමින් සිටියේ අකලංකට සහ තිදස් ට ද පුදුමයක් එක්කරමිනි

" සුද්දිගෙ අම්මට රසට උයන්න පුළුවන් නේ . සුද්දී ටත් පුලුවන්ද රසට උයන්න"

" බැරි කමක් නෑ ඉතින් ඒත් අම්මා තරම්ම රසට යන්න බෑ"

ආකෂරා කියන්නට වූයේ තරමක් ලැජ්ජාවෙනි. කතාබහ අතරතුර සියල්ලෝ ම හිතට ද ගතටද ප්‍රමාණවත් වන ලෙස ආහාර ලබා ගත්තේ පුදුමාකාර සෙනෙහසකිනි. දිවා ආහාරයෙන් පසු අන් අන් අය පිටත්ව යද්දී අකලංක සහ තිදස නැවතුනේ උන්ගේ හිතේ උදේ ආකෂරා ආකෂරාගේ අම්මට කීමට දැඩි උවමනාවක් තිබුන නිසා වෙනි.

" ඇයි පුතේ"

sinhalaebooks.com

තාමත් මිදුලේ රැඳී සිටින අකලංක හා තිදස් දෙස බලමින් කමනි ඇසුවේ ප්‍රශ්නයක්ද හිතේ රඳවාගෙනය.

" සුද්දි ත් වෙද ගෙදරට ගියා නේද"

" ඔව් පුතේ මං හිතුවා ඔය දෙන්නත් ගිහින් ඇති කියලා"

" නෑ අපි දෙන්නා මේ නැවතුනේ චුට්ටක් ඉඳලා යන්න ඕනේ කියලා"

තිදස් කියද්දී අකලංක පුදුමයෙන් ඔහු දෙස බලන්නට විය

" ආයෙ එක්ක මිසක් මං හිතුව මේ මොනාහරි ප්‍රශ්න මොනා හරි ප්‍රශ්නයක් කියලා"

" අනේ මොන ප්‍රශ්නද නැන්දේ අපි ගිහින් එන්නම් කෝ"

තිදස් සියලු කතාබහ මග හැර නැවත වෙද ගෙදරට යන්න සූදානම් වෙද්දී අකලංකට පුදුමයක් දැනුනේ ඔහු කුමක් කරන්නට යනවා දැයි නොතේරුණු බැවිනි.
කමනී සිටින තැන ඒ පිළිබඳ විමසීමක් කළ නොහැකි බැවින් අකලංක ඔහු පසු පස ගමන් කරන්නට වූයේ කවුරුත් නොමැති ස්ථානයකදී ඒ පිළිබඳව විමසා සියලු ප්‍රශ්න නිරාකරණය කර ගැනීමේ බලාපොරොත්තුවෙනි. තත්පර කිහිපයක් නිහඬව ගමන් කල දෙදෙනාගේ නිහඬතාවය බිඳිමින් අකලංක කතා කරන්නට පටන් ගත්තේ ය.

" මොකක්ද බං උඹ ඒ කලේ මාවත් එක්ක අවුල් ගියා උඹ ඒ අය කරපු දේත් එක්ක"

" ඇයි ඒ බං"

"ඇයි කියලා අහන්න මනුස්සයෝ. උඹ දැන් සුද්දිගෙ අම්මට ඔක්කොම කියනවා කියලා නේද එතන නැවතුනේ. එහෙම නැවතිලා මේ මොකුත් නොදන්න ගානට ආපහු ආවේ."

" මහලොකුවට එහෙම කිව්වට බං එකපාරටම සුද්දි අම්මට එහෙම කියන්න තරම් හයියක් නෑ බන් මට"

" හා හා වරෙන් යන්න හදිසි වෙලා කොරොස් කටෙත් අත දගන්න බෑ නේ. තව ඕන තරම් දවස් තියෙනවා නේ. ඒ දවස්වලත් උඹට කියාගන්න බැරි වුනොත් මං හරි ඕක කියලා දන්නං බය නැතුව හිටපන්"

තිදස් ගෙ හිතට සහනයක් ලබාදෙමින් අකලංක එහෙම කිව්වේ ඔහුගේ බලාපොරොත්තු සියල්ල කෙසේ හෝ ඉෂ්ට කිරීමේ අදහසිනි. අවසානයේ තරුණයින් දෙදෙනා ආපසු වෙද ගෙදරට පැමිණෙන විට වෙද සීයා ත් සුද්දිත් තිදස්ගේ දෙමව්පියනුත් ලොකු කතා බහක සිටියේ තිදස්ගේ අසනීපය පිළිබඳව බව ඔවුන්ට ද වැටහී ගියේ නිරායාසයෙනි.

sinhalaebooks.com

" කොල්ලො දෙන්න මොකද පරක්කු "

" මොකුත් නෑ තාත්තා ටිකක් වෙලා ඉඳල එන්න හිතුනා. මේ ආකෂර්ා ගේ අර වැඩේ ගැන වෙද සීයත් එක්ක කතා කරාද. "

තිදස් ඇසුවේ ප්‍රශ්නයක්ද හිතේ රඳවා ගනිමිනි.
මේ මොහොතේ තිදස්ගෙ හිතේ නළියන එකම ප්‍රශ්නය ආකෂර්ා බව දැනගෙන හිටියෙ තිදස් ට අමතර ව අකලංක පමණි.

" ඒකත් මං මේ වෙද සීයට පොඩ්ඩක් පොඩ්ඩක් කියල තමයි තියෙන්නේ. සීයා කියනවානෙ ඉතින් ආකශර්ාගෙ අම්මගෙ කැමැත්තත් ඕන කියලා"

" ඔව් දරුවෝ හදිසි නොවී අපි තීරණයක් ගමුකො. කොහොමත් මේ දරුවාගේ අසනීපය හොඳ වෙලා තව ගෙදර යන්න ගොඩක් දවස් තියෙනවනේ"

වෙද සීයා කියද්දී තිදස් හා අකලංක මුහුණට මුහුණ බලා ගන්නට වූයේ හිතට දැනුනු පුංචි හෝ සතුටක් ද සමගිනි.
වෙද සීයාට හා දෙමාපියන්ට කතාබහ කරන්නට ඉඩ හැර තරුණයින් දෙදෙනා කඩුල්ල දිහාවට ගමන් කරද්දී සුද්දීද ඔවුන් පසුපස ආවේ වැඩිහිටියන්ගේ කතාබහට ඇය ද නොසුදුසු බව ඇයට තේරුම් ගිය නිසාවෙනි.

" සුද්දී නංගීගෙන් මං ප්‍රශ්නයක් අහන්නද"

අකලංක ද පුදුමයට පත්කරමින් කරමින් තිදස් එක්වරම සුද්දි දිහාවට හැරෙද්දී ඔහු ද ඒ දෙසට හැරුණේ තිදස් ඒ වර කුමක් කරන්නට යන ප්‍රශ්නයත් එක්ක ය.

" අයියෝ අහන්න අනේ මොකක්ද ප්‍රශ්නෙ."

"සුද්දිට කොල්ලෙක් එහෙම නැද්ද"

" මොකක්ද මේ එකපාරටම උඹ ඒ ඇහුව ප්‍රශ්නෙ"

අකලංක පුදුමයෙන් තිදස් දෙස බැලුවේය

" නෑ ඉතින් දැනගන්න ඇහුවේ අකමැති නම් නොකියා හිටියට කමක් නෑ"

"අකමැති වෙන්න දෙයක් නෑ අනේ ඔය කියන කෙනෙක් මට ඉඳලත් නෑ මට ඇත්තෙත් නෑ"

" අම්මෝ මෙයාගෙ සද්දේ"

තිදස් ඇසකින් ඉඟි මරා අකලංකට කිව්වේ ය.

sinhalaebooks.com

" එහෙම කෙනෙක්ට කැමති නැද්ද සුද්දි"

තිදස් දිගින් දිගටම සුද්දීගෙන් ප්‍රශ්න කරද්දී අකලංකට අමුත්තක් දැනෙන්නට විය. ඒ නිසාම ඒ කතාබහ , ඒ සංවාදය එතනින් නැවතිය යුතු යැයි අකලංකට සිතුණි. නැත්නම් සුද්දී ගේ සිතෙහි යම් පලුදු වීමක් ඇති වේ යැයි අකලංකට දැනෙන්නට විය.

" තිදස් අඩෝ ඕවා මේ කෙල්ලගෙන් අහන්න එපා බන්. අපිට පිස්සු කියලා හිතයි මෙකි"

අකලංක කියූ දේට සිනහවකින් පමණක් සංග්‍රහ කල ආකෂර්‍ා ඔවුන් දෙදෙනා ගෙන් මිදී නිවෙස දෙසට දිව යන්නට වූයේ තවත් එතන රැඳීමට තරම් ඇයට සිත් නොවූ නිසාවෙනි. තරුණයින් දෙදෙනා ගෙන් මිදී නිවස දෙසට දිව යන සුද්දී දෙස ඔවුන් දෙදෙනාම බලාගෙන සිටියේ ඊළඟට කුමක් ගැන කුමන ආකාරයෙන් කතා කළ යුතු යුතුදැයි ඔහුන්ට ද නො සිතුන නිසාවෙනි.

" ඔය කෙල්ලෙක් එක්ක ඕවා කතා කරන්න එපා බං පේන්නැද්ද ඒකි උඹ කියපු දේටත් බය වුනා. එක්කෝ කතා කරත් කමක් නෑ ඔය විදියට එක පාරටම කතා කරන්න එපා තිදස්. උඹට මං දැන් එක පාරකුත් කිව්වා හදිස්සි වෙලා කොරොස් කටෙන් අත දාගන්න බෑ කියලා."

"එහෙනම් මං මොකක්ද කරන්න ඕනෙ කියලා උඹම කියපන්කෝ."

තිදස් කියද්දී සිනහවක් පමණක් මුවේ රඳවාගත් අකලංක ඔහු දෙස බැලුවේ ඔහුට කෙසේ උත්තර දිය යුතු දැයි කල්පනා කරමිනි.

"එහෙනම් මං මොකක්ද කරන්න ඕනෙ කියලා උඹම කියපන්කෝ."

තිදස් කියද්දී සිනහවක් පමණක් මුවේ රඳවාගත් අකලංක ඔහු දෙස බැලුවේ ඔහුට කෙසේ උත්තර දිය යුතු දැයි කල්පනා කරමිනි.

" කෙල්ලගෙ අම්මත් එක්ක කතා කරපංකො ඒ ගැන. ඒක recspect බං."

අකලංක කිව්වේ තිදස් දෙස බලමිනි. කෙසේ හෝ තිදස් ගේ මේ ප්‍රශ්නය විසඳුව යුතු නිසාම අකලංක සඳහා උත්තරයක් සොයන්නට විය.

" දැන් නං උඹ කියන ඕනම දේකට මම කැමතියි."

" හරි එහෙනම් මේ කතාව මෙහෙම ඉවර කරගමු උඹ වරෙන් මාත් එක්ක යන්න ආකෂර් ගෙ අම්මා හම්බෙන්න "

sinhalaebooks.com

තවත් දුරටත් තිදස්ගේ හිතේ මම ප්‍රශ්න හිරකරගෙන තැබිය යුතු නිසා අවසානයේ අකලංක තීරණය කළේ ඔව් හා ගොස් ආකෂර්ා ගැන ඇයගේ මව හා සාකච්ඡා කිරීමටයි. තවදුරටත් කල්පනා නොකරන ආකෂර්ා ගේ නිවස දෙසට තරුණයින් දෙදෙනා පිය මැන්නේ අද එම ප්‍රශ්නය කෙසේ හෝ විසඳ ගැනීමේ අරමුණෙනි.

" මොකද දෙන්න ආයෙම මේ පැත්තෙ "

ඉස්තෝප්පුවේ ආකෂර්ා තරුණයින් දෙදෙනා දෙස බලා අසන්නට වූයේ හිතේ යම් චකිතයකිනි

" මට අම්මත් එක්ක වැදගත් දෙයක් කතා කරන්න ඕනේ. පුලුවන්නම් මට චුට්ටක් කතා කරන්න පුලුවන්ද"

" වාඩිවෙලා ඉන්නකො දෙන්නම. අම්මා මං හිතන්නේ කුස්සියේ ඉතුරු වැඩ ටික කරනවා. ඉන්නම කතා කරල එන්නම්."

ආකශර්ා පිටව යැමෙන් විනාඩි කිහිපයකට පසු කමනි ඔවුන් දෙදෙනා හමුවීමට පැමිණියේ තරමක සිනහවක් ද මුවග රඳවා ගනිමිනි.

" සුද්දි කිව්වා පුතාලා දෙන්නා ආයෙ මේ පැත්තට ඇවිල්ල කියල මාව හම්බෙන්න ඕනේ කතාවකුත් කිව්වා. මං මේ තකහනියේ දුවගෙන ආවේ මොකක් හරි හදිස්සියක් ද කියල දැනගන්න"

" හදිස්සියක් නම් නෙවෙයි නැන්දේ. ඒත් දෙයක් කතා කරගන්න තමයි ආවෙ නැන්දත් එක්ක කතා කරන්න ඕනේ "

මේ තියෙන ප්‍රශ්නත් එක්ක කමනී ගේ හිතටත් මොකක්දෝ අමුත්තක් දැනෙන්නට විය. ආකෂර්ා ගැන සඟවන රහස් කෙතරම් කාලයක් තමාට සඟවන්නට හැකිවේදැයි පැනය ඇයටම දැනෙන්නට වූයේ විටින් විට වෙනස් වන තිදස් ගේ හැසිරීම් රටාව නිසාවෙනි. බොහෝ දේ හිතට නැගුනත් ඒ සියල්ල අමාරුවෙන් පාලනය කර ගනිමින් මුව ගේ රැඳී තිබුනු සිනහවෙන්ම තරුණයින් දෙදෙනා දෙස බැලුවේ ඔවුන්ට වූ ප්‍රශ්නය කුමක්දැයි දැන ගැනීමේ උවමනාවෙනි

" මොකක්ද පුතා මේ මාත් එක්ක කතා කරන්න තියෙන ප්‍රශ්නේ. මං හිතන්නේ නැහැ ඒක පුතාගේ අසනීපෙ ගැන ප්‍රශ්නයක් කියලා.මොකද අසනීප ගැන ප්‍රශ්නයක් නම් ඒක එක්කෝ වෙද සීයා එක්ක කතා කරන්න ඕනේ එහෙම නැත්තං සුද්ද කතා කරන්න ඕනේ"

" මේක සුද්දි ගැන ප්‍රශ්නක්"

එක්වරම තිදස් කියද්දි කමණීගේ මුහුණේ වූ සිනහව අතුරුදහන් වූයේ සැණකිනි.

sinhalaebooks.com

දෙවියනේ , කෙල්ල ගැන ඇත්තම මෙයාලා දැනගෙන වද්ද. එහෙම වුනොත් හැම දේම ඉවරයි. අප්පච්චි මං ගැන මොනවා හිතයිද. මං මෙච්චර ලොකු වංචාවක් කරපු එකට මට කවදවත් අප්පච්චි තම් මෙච්චරයි දෙන එකක් නෑ.
නෑ එහෙම වෙන්න විදිහක් නෑ. මෙයාලා ඇත්ත දැනගන්න විදිහක් නෑ කොහොමටවත් එහෙම වෙන්න විදිහක් නෑ
මට මගේ සුද්දි ම නැති කරගන්න බෑ . මං දන්නවා එද එක ලොකු වැරැද්දක් මම කරේ ඒත් අවුරුදු විසිදෙකක් මම ඇහැක් වගේ බලාගත්ත මගේ කෙල්ලව මං කොහොමද වෙන කෙනෙක්ට දෙන්නෙ.

" නැන්දේ අපි වැරදි දෙයක්වත් කිව්වා ද"

කමනීගේ නිශ්ශබ්දතාවය හිතට ප්‍රශ්නයක් වුනු නිසාම අකලංක ඇසුවේ ඇයගෙන් පිළිතුරක් බලාපොරොත්තුවෙනි.

" න්න්න් න් නෑ නෑ නෑ පුතා. මම මේ කල්පනා කලේ අපේ සුද්දි කෙල්ලගෙන් මොනවා හරි වැරද්දක් වත් වුනාද කියලා "

" අනේ සුද්දීගෙන් කිසිම වැරැද්දක් අපිට වෙලා නෑ"

කමනී ගේ ප්‍රශ්නයට පිළිතුරු දෙමින් ඔහු කීවේය

" එහෙනම් මොකද මේ හදිසියේම මේ පැත්තෙ. මොනාද කතා කරන්න තියෙනවා කිව්වේ."

හිතේ ප්‍රශ්න රාශියක් සමගින් කමනී අසද්දී තරුණයින් දෙදෙනා මුහුණෙන් මුහුණ බලාගත්තේ ආරම්භය කෙලෙස සිදු කළ යුතු දැයි දෙගිඩියාවෙනි.

" කෙලින්ම කියන්නම්කෝ නැන්දේ .මේ දේ කියන්න ඕනි කියලා හිතුවෙ අපේ තාත්තාලත් මෙහෙ ඉන්න හින්ද. එතකොට පුලුවන් නේ එයාලා එක්කත් කතා කරන්න. මං සුද්දිට කැමති. "

" මොකක්. "

එක්වරම බලාපොරොත්තු නොවූ දෙයක් තිදස්ගේ මුවින් පිට වෙද්දී කමනී ඔවුන් දෙස පුදුමයෙන් බලන්න ට විය.
බලාපොරොත්තු නොවූ ලෙස තිදස්ගෙන් ලැබුනු ප්‍රතිචාරය සමග හිත වේදගෙන් හැගෙන්නට වූ නිසාම කමනී තිදස් දෙසත් අකලංක දෙසත් බලා ඉන් පසුව ප්‍රධාන දොරෙන් ගේ ඇතුලට දෑස් යොමු කලේ ආකශ්රා කොයි දැන් බලා ගැනීමටය.

" ඔව් මං ආකශ්ර් ට කැමති "

දැඩි ස්වරයකින් තිදස් කියද්දී අකලංකගේ හිත ට මොකද්දෝ අමුත්තක් දැනෙන්නට විය

sinhalaebooks.com

තම යාලුවා වෙනුවෙන් හිතේ ප්‍රේමය සඟවා ගත්ත ද විටින් විට වේදනා ගෙන දෙන ප්‍රේමය නිසාම අකලංක බිමට පහත් කරගෙන සිටි හිස ඔසවා තිදස් දෙසත් කමනී දෙසත් බලා හිතේ වූ සිතිවිලි යටපත් කරගත්තට උත්සාහ කලේය.

එහෙනම් උඹ මට සදහටම අහිමි වුනා සුද්දී.

අකලංක සිතුවේ එපමණකි..

කළ යුතු දෙයක් නොමැති නිසාම තිදස් ගෙ සතුට වෙනුවෙන් හිත හදගත් අකලංක ආයෙ ආයෙම කමනී දෙස බලමින් ඇයගේ ප්‍රතිචාර වලට කන් යොමීය.

" මොනවද දරුවෝ මේ කියවත්තේ. ඔය දරුවගේ ගෙදරින් මේවට කැමති වෙයිද"

සැක නොහිතෙන්නට කමනී ඇසුවා ය

ගෙදරින් කැමති වුනත් නැතත් මේක කොහොමත් වෙන්නෑ තිදස්

කමනී හිතින් හිතන්නට විය.

" අපේ ගෙදරින් කැමති කරගන්න එක මම බලා ගන්නම්. මට ඕනේ නැන්දගෙ කැමැත්ත විතරයි "

" නෑ මට කොහොමටවත් මේකට කැමැති වෙන්නේ විදිහක් නෑ "

නොසිතූ ලෙස කමණීගේ ස්වරය ප්‍රබල විය

" නැන්ද අකමැති වෙන්නේ හේතුව වෙද සීයා නම් මම මේක වෙද සීයා එක්ක කතා කරන්නම්."

" එකම දේ දහපාරක් පාරක් කියන්න බැනෙ මේකට කැමති නෑ."

කමනී කිව්වේ තිදස් ගේ මුහුණ දෙස දෙස වත් නොබලමිනි.
ඇයගේ මුහුණේ තිබුනේ කේන්තියක් ද බියක් ද යන්න ඇයටවත් නොදැණිනි. ඒ කෙසේ වෙතත් තිදස්ව මෙතනින්ම නවතා ලීමේ ලොකු උවමනාවක් ඇයට දැනෙන්නට විය.

ඇත්ත කියන්න බෑ ඇත්ත කිව්වොත් මට මගේ දුව නැති වෙනවා.
බොරු වුනත් මොකද්ද මෙයාට තවත් කියන්නේ..

දෙලොවක් අතර අතරමං වෙමින් කමනී හිතන්නට විය.

sinhalaebooks.com

"මොකක්ද අකමැති වෙන්න තියෙන හේතුව. මෙතන කිසි ප්‍රශ්නයක් නෑ නේ. මාත් එක්ක නම් කතා කරන්න බැරි මං දූත්ම තාත්තට කියන්නම් ඇවිත් කතා කරන්න කියලා."

" කවුරු ඇවිත් කතා කරත් මං කැමති නෑ මේකට"

කමනී කිව්වේ මවාගත් කේන්තියකිනි.

" හරි ඔයානෙ කැමති නැත්තේ. එහෙනම් මං වෙද සීයා එක්ක මේ ගැන කතා කරන්නම්."

එතනින් එහාට කිසිවක් නොකියා අකලංක ත් සමග ආයේ ම වෙද ගෙදර දිහාවට තිදස් ඇවිදගෙන ආවේ කමනී කතා කලත් තව දුරටත් ඇය ගේ වචන ගැන නොසලකා හරිමිනි
" තිදස් ඔහොම ඉන්න තිදස්"

වෙද නිවස දිහාවට පිය මණින තරුණයින් දෙදෙනා පිටුපස හඹා එමින් කමනී කෑගසන්නට වූයේ හිතේ වේදනාව හිතෙයි දෝංකාර දුන් නිසාවෙනි. ඒත් ඇයගේ වචන ගණනකට නොගත් තරුණයින් දෙදෙනා ම කෙලින්ම වෙද නිවස දිහාවට පිය මනින්නට විය.

" කොල්ලො දෙන්නා එහෙට මෙහෙට කොහෙ යනවද මන් දන්නෑ. එක තැනකට වෙලා ඉන්න බැරිද ටිකක් විතරයි නේ සනීප වුනේ තාම"

තරුණයින් දෙදෙනාගේ පැමිණීම දුටු දේදුනු ඔවුන් හමුවේ කියා සිටියේ ඔවුන් දෙදෙනා ගේ හැසිරීමේ යම් වෙනසක් දුටු නිසාය.
දිගින් දිගටම ඔවුන් පසුපස ආ කමනී ද අවසානයේ වෙද ගෙදර ඉස්තෝප්පුවේ නතර වෙද්දි ඇයගේ කලබල ස්වරූපය දුටු නිසාම සියලූ දෙනාම ඇය දෙස බලන්නට වූයේ විමතියෙනි.

" මොකද කමනියෝ මේ මොකක් හරි ප්‍රශ්නයක්ද. ඉහින් කනින් දඩිය පෙරාගෙන. යකෙක් දැක්කා වගේ මොනවද මේ වෙලා තියෙන්නේ උබට "

කමනී ගේ නොසන්සුන් හැසිරීම දුටු වෙද සීයා වාඩි වී සිටි අසුනෙන් නැගිට මෙන් ප්‍රශ්න කලේය. ඒ තනිකම හිතේ ගැස්ම වැඩි වෙද්දි කමණී ඉස්තෝප්පුවේ වාඩි වී සිටි සියල්ලෝ දෙසම මාරුවෙන් මාරුවට බලන්නට වූයේ ඒ තිබුන කලබල ලීලාවෙනි.

" අප්පච්චි මේ මේ මේ නෑ කිසි ප්‍රශ්නයක් නෙවෙයි මේ .........ඒත්."

" ප්‍රශ්නයක් නෙමෙයි නම් මොකක්ද බං මේ කියන්නේ."

" සීයේ ඒක මගේ ප්‍රශ්නයක්. ඒක මගේ හිතේ තියෙන ප්‍රශ්නයක්. කොටින්ම කියනවා නම් ඒක සුද්දි ගැන ප්‍රශ්නයක්. කමනි නැන්දගේ උත්තරයක් හම්බ නැති හෙණ තමයි මම සීයාව හොයාගෙන ආවේ."

sinhalaebooks.com

තිදස් කියාගෙන යද්දී සීයාත් සීයත් කමනීත් තිදස් ගේ දෙමව්පියනුත් අකලංකත් මාරුවෙන් මාරුවට පුදුමයෙන් ඔවුනොවුන් දෙස බැලුවේ මේ ප්‍රශ්නේ ගැන දන්නේ අකලංක සහ කමනි පමණක් බැවිනි.

" මොකද දරුවෝ සුද්දී ගැන ප්‍රශ්නයක් කීවේ"

සුද්දීගේ නම ඇසෙත්ම එක්වරම කලබල වූ වෙද සීයා ඔහුගෙන් විමසුවේ ඒ ගැන දැන ගැනීමේ දැඩි බලාපොරොත්තුවක් හිතේ වූ නිසාවෙනි.

" කෙල්ලගෙත් වැරැද්දක් නම් වුණේ නෑ. කතාව මෙච්චරයි මම කැමතියි සුද්දීව මැරි කරන්න"

තිදස් කියද්දඅපි යද්දී සියල්ලෝම පුදුමයෙන් ඔහු දෙස බලන්නට විය. එතන සිටි සියලු දෙන මොහොතකට නිශ්ශබ්ද වෙද්දී සියල්ලන්ට ප්‍රථම කමණී ගේ හඬ අවධි වූයේ අන් අයගේ තීරණ ගැන දැන ගැනීමට ප්‍රථම ය.

" මම දැන් එක පාරකුත් කිව්වා. මම කැමැති නෑ ඒකට. එහෙම දෙයක් කොහෙද වෙන්න බෑ ඔයාලගේ බෙහෙත් ගන්න නේ නේද. ඔයාලා ආවේ බෙහෙත් කරන්න නේ. ඒ හින්ද බෙහෙත් කලානම් ඒ වැඩ ටික ඉවර කරගෙන මෙතනින් යන එක තමයි හොඳම දේ නැත්තං තවදුරටත් කතා කලොත් මේක දුර දිග යන්නේ පරිස්සම් වෙන්න පුළුවන්."

" පුතා. මොනවද මේ ඔයා කරන වැඩ ඔයාට පිස්සුවක් වත් හැදිලා ද. හදිසි වෙලා තීරණ ගන්න එපා පුතා. ඔයා ඔහොම දෙයක් කලින් අපිට කියලා වත් තිබ්බද. නිකමට කියන්න තිබ්බා නේද මේ දේවල් මෙයාලට කියන්න කලින්."

ඒ සියලු කතා කථා මැද්දෙන් දේදුනු ගේ හඬ විතර වන්නට පටන් ගත්තේ ඇයගේ මුහුණ ඉරියව් පවා වෙනස් කරමිනි.
මේ ඇය කිසි ලෙසකත් බලාපොරොත්තු නොවූ දෙයකි. මේ සියලු දේ ගැන මහා ලොකු පැහැදීමක් ඇයට නැති නිසාම තිදස්ගේ තීරණය ගැන වැඩි කැමැත්තක් ද ඇය තුළ නොවීය. ඒ නිසාම සියල්ලට පෙර ඇයගේ තීරණය ඇය පවසන්නට සිතුවාය.

" දේදුනු ඔයා නිශ්ශබ්ද වෙන්න. පුතා දැන් පොඩි ළමයෙක් නෙවෙයි. අනික එයාගේ තීරණ ඔහොම එකපාර ප්‍රතික්ෂේප කරන්න තරම් ඔයාට මොකක්ද මේ වෙලා තියෙන්නේ. කරුණු කාරණා අහන්නේ නැතුව තීරණ ගන්න ලෑස්ති වෙන්න එපා දේදුනු. මුලින් ම එයා කියන දේ අහලා ඉන්න."

මිස්ටර් දිසානායක දේදුණුව නිශ්ශබ්ද කරවීය.

" හරි පුතා කියන්න දැන්"

sinhalaebooks.com

" තවත් කියන්න දෙයක් නෑ තාත්තා. මගේ තීරණය තමයි ඒ කිව්වේ දැන් තීරණයක් දෙන්න ඕනේ ඔයාලා"

" ඔයා කොච්චර කිව්වොත් මං මේකට කැමති නෑ"

කමනි ආයෙම මදක් සැලෙන්නට විය.

" කමනි.ඔයත් කට වහගන්න."

" අප්පච්චි කට වහගන කොහොමද. මෙහෙම මේ ගහෙන් ගෙඩිය නම් වගේ කොහොමද එහෙම කසාදයක් ආදරය ගැන තීරණය කරන්නේ. අනික සුද්දි කියන්නේ තාම පොඩි ළමයෙක්."

" කමනී."

වෙද සීයාගේ සැර පරුෂ දැනුම්දීම නිසාම කමනි නිශ්ශබ්ද වූවාය. ඉන් අනතුරුව සියල්ලෝ අතර විනාඩි කිහිපයක නිශ්ශබ්දතාවයක් පැවතුණු අතර ඒ නිශ්ශබ්දතාවයෙන් පසු මුලින්ම කතා කිරීමට ආරම්භ කරන ලද්දේ වෙද සීයයි. ඔහු ගේ කතාව දෙසට සියලුම ම දෙනා අවධානය යොමු කළා මිස ඔහු හා කතා කිරීමට වත් ඔහු වහා වචන හුවමාරුවේ යෙදීමටවත් නොගියේ සීයා වෙත වූ ගෞරවය හේතුවෙනි.

" පුතා. හැමෝම කියනව වගේ මේ දේවල් හදිසි වෙලා ගන්න ඕන තීරණ නෙවෙයි නේ . දැන් පුතාගේ හිතේ තියෙන අදහස අපි දන්නව නෙ. ඒ හින්ද මේ ගැන අපි හැමෝම මුලින්ම සාකච්ඡා කරල ඉන්නම්."

" එත්...සුද්දී.."

" අහා ඔව් මටත් දැන ගන්න දෙයක් තියෙනවා. මේ දේවල් ගැන සුද්දි දන්නවද"

" නෑ වෙද සීයෙ මං එයාට කිව්වේ නෑ මං මුලින්ම කතා කලේ ඔයාලත් එක්ක "

" හා හොඳයි. වෙලාව ආවහම හැමදේම හරියට වෙලාවට වෙයි. ඒ හින්ද ඔය දේවල් දැන් ම සුද්දිට දැනගන්න තියන්නත් එපා. ඔයාලා කතාබහ කරලා රණ්ඩු ඇතිකරගන්න ප්‍රශ්න ඇතිකරගන්න යන්නත් එපා.හැම දේම මං බලා ගන්නම්."

වෙද සීයා කියද්දි සියල්ලෝම නිශ්ශබ්ද විය.

" මං යනවා යන්න."

තිදස් මදක් අමනාපයෙන් එතනින් ඉවත්ව යන්න සූදානම් වෙද්දී අකලංක ඔහු හා එකතු වූයේ වැඩිහිටියන්ට එතන ඉඩ කඩ ලබා දෙමිනි.

sinhalaebooks.com

" උඹ ඕනවට වඩා කලබල වෙනවත් වැඩී නේ මචං. අනේ මන්ද ඉවසන් හිටපන්. වෙලාවකට හිතෙනවා උඹ කලබල වුනා වැඩිද කියලාත්."

" උඹටවත් මාව තේරුම් ගන්න බැරිද අකලංක"

මං තරම් උඹව තේරුම් ගත්ත යාළුවෙක් ඇති කියලා මං හිතන්නේ නෑ මචං වෙන නම්. උඹ සුද්දී ට ආදරේ කරන හින්දු මං ඒ ආදරේ හංගගෙන ඉන්න විදියවත් උඹ දන්නවා නම්. ඔහොම කියන එකක් නෑ බන් ඇත්තටම.

අකලංක හිතන්නට විය.

" මොකද සද්දයක් නැත්තේ අකලංක"

තිදස් අසන්නට විය.

" මොකුත් නෑ බන්. "

අකලංක ගේ උත්තරය කෙටි විය.

"තිදස්..."

තරුණයින් දෙදෙනාගේ අදහස් හුවමාරුවට බාධා කරමින් කමනී පැමිණියේ පෙර තිබූ කලබලයෙන් තොරවය.

" ම්ම්ම්ම්......"

" මට කියන්න දෙයක් තියනවා"

" මොනවා ගැනද"

"සුද්දී ගැන."

කමනී ඔවුන්ට කියද්දි පුදුමයකින් තොවුනත් තිදස් හිස ඔසවා බැලුවේ ඊලඟට කුමක් අසන්නට වේදැයි ප්‍රශ්නයද හිතේ රඳවා ගනිමිනි.

"තිදස්..."

තරුණයින් දෙදෙනාගේ අදහස් හුවමාරුවට බාධා කරමින් කමනී පැමිණියේ පෙර තිබූ කලබලයෙන් තොරවය.

sinhalaebooks.com

" ම්ම්ම්ම්......"

" මට කියන්න දෙයක් තියනවා"

" මොනවා ගැනද"

"සුද්දී ගැන."

කමනී ඔවුන්ට කියද්දි පුදුමයකින් තොවුනත් තිදස් හිස ඔසවා බැලුවේ ඊලඟට කුමක් අසන්නට වේදැයි ප්‍රශ්නයද හිතේ රඳවා ගනිමිනි.

තිදස් මෙන්ම අකලංක ද ඇය දෙස බලද්දී කමනීගේ දෑසේ කඳුළු බිඳු එකින් එක රුරා වැටුනු අතර තරුණයින් දෙදෙනා මුහුණෙන් මුහුණ බලා ගත්තේ පුදුමයෙනි.

" මොකද මේ "

" මේ මං කොහෙන්ද කියන්න පටන් ගන්නෙ කියලා කියල මටම තේරෙන්නෙ නෑ පුතේ"

" අඩන්ඩ තරම් දෙයක් මෙතන වෙලා නෑනේ. මං ඇහුවේ ඇහුවෙ සුද්දිව මට දෙන්න කැමතිද කියල විතරයි. මං සුද්දිට ආදරෙයි. ඒ නිසයි මං කෙලින්ම ඇවිල්ලා ඇහුවේ."

තිදස් කිව්වේ කඳුළු පිස දමින් ඔහු දෙස බලා සිටින කමනී සනසන බලාපොරොත්තුවෙනි. ඇයගේ දෑසින් වැටෙන කඳුළු වලට හේතුව හරි හැටි තේරුම් ගන්න බැරි නිසා ම තරුණයින් දෙදෙනා ආ බලා සිටියා මිස එතනින් එහාට කිසිවක් නොකියා සිටින්නට තීරණය කලේ කමනීගේ කඳුළු දකින්නට උවමනාවක් නොමැති බැවිනි.

" අහන්න පුතේ. මං මේක හංගාගෙන හිටියොත් ලොකු වැරද්දක් වෙන්න පුලුවන්. ලොකු වැරද්දක් වෙන්න පුලුවන්. මට බෑ ඒ දේ වෙන්න දෙන්න. කවදවත් මට බෑ ඔයාටයි සුද්දීටයි කැමති වෙන්න. මේ දරුවා ඇහුවා නම් මට මොනවාහරි කරන්න තිබුනා ඒත් ඔයාට කවදවත් එහෙම දේකට කැමති වෙන්න බෑ"

කමනී කියාගෙන යද්දී තිදස් පුදුමයෙන් බලාගෙන සිටියේ කිසිවක් අදහා ගත නොහැකි නිසාවෙනි. ඊටත් වඩා අකලංක ඇය කියූ දේ ගැන අවධානය යොමු කලේ ඔහුගේ හිතට හීතියට දැනුනු සතුටත් එක්කය.

" මොනවද කියවන්නෙ. ඇයි මොකක්ද මට අකමැති වෙන්න තියෙන හේතුව. ඒක විතරක් මට කියන්න. මට තේරෙන්නෑ ඔයාලා මේ මොනවද කියන්නේ කියලා. හැම එකෙන්ම එකින් එක ඔළුවට ප්‍රශ්නයක් යනවා මිසක් මේ ප්‍රශ්න එකක්වත් විසඳෙන දවසක් නැද්ද."

" තිදස් සන්සුන් වෙන්න අපි නැන්දගෙන් අහලම බලමු මොකද මේ මේවා ගැන හේතු කියලා"

sinhalaebooks.com

අකලංකගේ ඉල්ලීමට ඇති තිදස් නිහඬ වුණේ කමනීට ට අවස්ථාව ලබා දෙමිනි

" ඔයා කියන්න නැන්දේ ඇයි මොකක්ද හේතුව"

" හේතුවද? හරි ඔයාල ම කියන්නකෝ බලන්න මොන රටේ මොන ලෝකෙද අයියා තමන්ගේ නංගිවම බඳින්නේ. ආහ් ඔය දෙන්නම කියන්නකෝ බලන්න මොන ලෝකෙද එහෙම දෙයක් වුනේ"

" මොකක්. හරි ඉතින් ඒ කතාවේයි මේ කතාවේයි තියෙන සම්බන්ධ මොකියෙන "

" සම්බන්දෙ ද. සම්බන්දෙ තමයි ආකශ්රයි තිදසුයි අයියයි නංගී කියන එක. මෙච්චර කාලයක් මට කියාගන්න බැරුව හිටිය ඒ කතාව ඒක. මට මගේ කෙල්ලව නැති වෙයි කියලා මං හැමදේම හංගගෙන හිටියත් දැන් තේරෙනවා ඒ හංගගෙන ඉන්න එකෙන් සිද්ධ වෙන්නේ "

කමනී සියල්ල කිව්ව කියවගෙන යද්දි තරුණයන් දෙදෙනා විටෙක මූණෙන් මූණත් විටෙක ඇයගේ මුහුණ දෙස බලාගෙන සුළු වෙලාවක් නිහඬව හිටියේ ඇය කියන කිසිම දෙයක් හරියට තේරුම් ගන්නට නොහැකි නිසාවෙනි. ඊටත් වඩා ඒ කියන කිසිම දෙයක් පිළිබඳව විශ්වාසයක් වත් ඔවුන් තුළ නොවීය. කිසි දිනක කිසිම වෙලාවක බලාපොරොත්තු නොවූ දෙයක් ඔස්සේ කතාව ඇදීගෙන යද්දි යද්දි ඔහුන්ට පුදුමක් දැණිනි

" මොනවද මේ ඔයා කියවන්නේ. දැන් එතකොට කියන්නේ සුද්දි මායි අයියයි නංගියි කියන එකද. කිසිම පදනමක් නැතුව ඔයා කොහොමද එහෙම දෙයක් කියන්නේ. අනික මං එයාව දැක්කෙත් මෙහෙට ආවට පස්සෙ. මීට කලින් එයයි මායි අතර කිසිම සම්බන්ධයක් තිබෙන නැතේ. ඉතින් එහෙම තියෙද්දි ඔයා ඔයා කොහොමද කියන්නේ එයයි මායි අයියයි නංගි කියන එක"

" ඔව් ඔයා විශ්වාස නොකරයි. ඔයා නෙවෙයි මේ මුළු ලෝකයම මේ කතාව විශ්වාස නොකරයි. ඒත් කවුරු විශ්වාස කළත් නොකරත් එක තමයි ඇත්ත කතාව පුතේ."

කමනී කියාගෙන යද්දී තරුණයින් දෙදෙනාට ඔවුන් ඉන්න තැන අමතක වෙන තරමට ම මනස අවුල් විය. එතනින් එහාට කිව යුත්තේ කුමක්ද යන්න වත් ඔවුන්ට නො වැටහෙන තරමටම හිත අවුල් වීමත් එක්ක ඔවුන් නිහඬ වූයේ ඇයගේ කතාවට සවන් දෙන්නට පමණක් හිත හද ගනිමිනි.

" හරි එහෙනම් නැන්දේ ඔයා කියන්නකෝ සුද්දියි මූයි අතරේ තියෙන සම්බන්ධය මොකද්ද කියන එක."

තිදස් ට කතා කරගත නොහැකි නිසාම අකලංක ඇයට උත්තර බැන්දේ මේ කතාව නිරවුල් කර ගැනීමේ උවමනාවෙනි.

sinhalaebooks.com

" තිදස්ට තිවුන් නංගියෙක් හිටියා. ඒ නංගී ඉපදෙනකොටම මේ ලෝකේ අත ඇරලා ගිහින් ඉවරයි. මං හරි නේද"

කමනි කතාව පටන් ගද්දීම තරුණයින් දෙදෙනා ඇය දෙස විමතියෙන් බලන්නට වූයේ එවැනි කතාවක් ඔවුන් කිසිදක ඇය හා පවසා නැති බැවිනි. දිනක් සුද්දීට ඒ ගැන පැවසිය මුත් ඇය ඇයගේ මව හා එවැනි කතාවක් පවසා නැති බැව් ඔවුන්ට විශ්වාසය.
එසේ නම් කමනී මේ ගැන දන්නේ කෙසේද යන්න ඔවුන්ටම ප්‍රශ්නයක් විය.

" හරි ඔයා කොහොමද ඒ ගැන දන්නෙ. මං කවදාවත් ඔයත් එක්ක එහෙම කතාවක් කියලා නැතේ"

" ඔව් මං දන්නවා. එදා ඒ හොස්පිට්ල් එකේ ම මම ඇඩ්මිට් කරලා හිටියා මටත් දරුවා ලැබෙන්න"

" හ්ම් ඉතින්."

" අවාසනාවකට එදා මගේ පළවෙනි දරුවා මේ ලෝකෙට එද්දී ඒ දරුවා මාවයි මේ හැමදේමයි දාලා යන්න ගිහිල්ලා."

" එතකොට සුද්දී..."

" කරන්න දෙයක් තිබ්බේ නැහැ මම ඒ හොස්පිට්ල් එකේ නම් කෙනෙක්. ඒ හොස්පිට්ල් එකේ ඕන තරම් යාලුවෝ මට හිටියා. එදා ඒ මට හම්බුන මැරුණු දරුවාව ඔයාගේ අම්මා ළඟින් තියලා ඔයාගේ නංගිව මගේ ළඟට ගත්තෙ මට ඒ වෙලාවේ කරන්න වෙන දෙයක් තිබුනේ නැති නිසා"

" මොකක්....එතකොට සුද්දී..."

හිතට දැනුනු මොකද්ද හැඟීම එක්ක තිදස් ගොත ගසමින් කතා කරන්නට උත්සාහ කරද්දී අකලංක උත්සාහ කළේය ඔහුගේ ඒ හැසිරීම් සියල්ල පාලනය කිරීමටයි. එක්වරම ආරංචි වූ සියලු තොරතුරු එක්ක තරුණයින් දෙදෙනා ම ගැස්සි යද්දී කමනී දිගින් දිගටම කතා කරන්නට ගත්තේ දැන් ඔවුන් ඉදිරියේ ඇය සත්‍ය වමාරා ඇති නිසාවෙනි.

දැන් සියල්ල සිදුවී හමාරය
ඇය සියල්ල ඔවුන් ඉදිරියේ වමාරා හමාරය.
දෛවය සියල්ල තීරණය කර හමාරය.

කමනි තිබුණේය දැන් සිදුවෙන සියල්ල දෙස බලා සිටීමට පමණි.

" නැත්දේ මේ ඇත්තද"

sinhalaebooks.com

" ඔව් අකලංක මේ හැමදේම ඇත්ත. "

" කොහොමද එහෙම හරියටම කියන්නේ"

" ඒ දරුවා මාරු කරලා මම නිකන් හිටියෙ නැහැ. එදා ඒ අම්මයි තාත්තයි ගැන මං හැම විස්තරයක්ම හොයා ගත්තා. දිසානායක මහත්තයාගේ පුතා ඔයා කියලා දැන ගත්තු දවසේ ඉඳන් සුද්දිට ඔයාව ආශ්‍රය කරන්න ඉඩ නොදී මං ඈත් කළ තියන්න උත්සාහ කළේ මට මං කෙල්ලව නැති වෙයි කියලා බයට. ඈත් කරන්න හදන හැම වෙලාවකම සිද්ධ වුනේ ඔයාලා තවත් ළං වෙන එක විතරයි"

" එතකොට සුද්දි මගෙ නංගී."

" ඔව් පුතේ..ඔයාගෙ නංගී. ඒත්....ඒත් මට මට සමාවෙලා එක උදව්වක් කරන්න පුතේ. පින් සිද්ධ වෙයි මට උදව්වක් කරන්න පුතේ"

" ඒ මොකක්ද"

" මේ රහස ඔය දෙන්නා විතරක් දැන ගත්තහම ඇති පුතේ. මේ ගැන ඔයාලගේ අම්මල තාත්තල දැනගත්තොත් මට මගේ කෙල්ලව නැති වෙනවා.මට ඒ දේ කරන්න එපා පුතේ."

" මං කොහොමද එහෙම කරන්නෙ"

තිදස් කේන්තියෙන් මොර දෙන්නට විය. ඔහුට ඔහුව ම පාලනය කර ගන්නට බැරි තරමට ආවේගශීලී විය. එහෙ නිසාම මහ හයියෙන් ඔහු කෑ ගසන්නට වූයේ ඒ කේන්තිය එලෙස හෝ පිට කිරීමේ අරමුණිනි

" මචං සන්සුන් වෙයන්. උඹ මෙතන කෑගහලා නැති ප්‍රශ්න ඇති වෙන්න පුළුවන්.මේ දේවල් අනික අම්මල තාත්තල එක්ක පාර දැනගන්න ඕන නෑ තිදස්.ඒ නිසා වරෙන් යන්න මට උඹත් එක්ක නිදහසේ කතා කරන්න ඕනේ."

"අකලංක ප්ලීස්....ඒ මගෙ නංගී"

" හරි බං මං ඒක දන්නවා ඒ හින්ද තමයි කියන්නේ කලබල වෙන්න එපා කියලා වරෙන්කො යන්න."

" කලබල නොවී උඹ මට මොකක්ද කරන්නේ කියන්නේ. මේ මිනිස්සු මෙච්චර වංචාවක් කරලා තියෙද්දී තවත් ඉවසගෙන ඉන්න ද කියන්නේ. මගේ අම්මා අවුරුදු විසි දෙකක් තිස්සෙ හිතාගෙන ඉන්නේ එයාට ඉපදුන දුව මැරුණා කියලා ඒ දුව ජීවතුන් අතර නැහැයි කියලා."

sinhalaebooks.com

" මචං ප්ලීස් මේ දේවල් කලබල වෙලා විසඳන්න පුළුවන් ප්‍රශ්න නෙමෙයි මචං. මේ ඉන්නෙත් අම්මෙක් ඒ ඉන්නෙත් අම්මෙක්. උඹ මං කියනවට මං වෙනුවෙන් ඉවසපන් එක පාරක් අපි දෙන්නා කතා කරලා මේ ප්‍රශ්න විසඳගමු. "

අකලංක ඔහුව පාලනය කරන්නට උත්සහ දරමින් වචන හසුරවන්නට වූ අතර තවත් එතන රැඳෙන්නට නොහැකියාව නිසාම කමනී නිවෙස දිහාවට ගමන් කරන්නට වූයේ තවමත් අඩු නැතුව දෑස් තුළින් ගලන කඳුළු අත්ලෙන් පිස ද ගන්නා ගමන් ය.

මට උඹ නැතුව ඉන්න බෑ තමයි රත්තරන්. ඒත් මං මේ දේවල් හංගගෙන හිටියොත් වෙන්න ලොකු වැරැද්දක්. මට සමාවෙයන් මං උබට වැරැද්දක් කලා නම්. මං පවුකාර ගෑනියෙක්. උඹ ඉපදුනු ගමන් උඹව උඹේ අම්මගෙන් මං උදුර ගත්තා ආකශ්රා. මට සමාවෙයන් රත්තරන් මේ හැමදේටම මට සමාවෙයන්.

නිවස දිහාවට දුවගෙන ආපු කමනී ඉස්තෝප්පුවේ පුටුවකින් වාඩි වී වාරු ගන්නා ගමන් කල්පනා කරන්නට වූයේ දැන් ඇයට කල්පනා කරනවා ඇරෙන්න වෙන කිසිවක් ඉතුරු නොවී නො වී ඇති බැවිනි.

" අම්මේ මොකද මේ. ඇයි මේ ඇස් වල කඳුළු. ඇයි මොකක්ද වුනේ කියන්න අම්මේ ඇයි ඔයා කවදවත් නැතුව අඩන්නේ මේ. මොනවාද වුනේ කියන්නකෝ"

ඉස්තෝප්පුවේ පුටුව මතට වී ඇඩූ කඳුළින් සුසුම් ලමින් සිටි කමනීට සමීප වෙමින් ආකශ්රා ඇසුවාය. ඇය මදක් කලබල වුවත් , ඒ කලබලය පාලයන කර ගනිමින් ආකශ්රා ඇයට තවත් සමීප වූයේ මේ මොහොතේ කලබල නොවිය යුතු යැයි ඇයටම තේරුම් ගිය නිසාවෙනි.

" දෝණී. මගෙ රත්තරන්..."

එක්වරම කමනී , ආකශ්රාව තුරුල් කර ගත්තේ මේ මොහොතේ හිතට දැනෙන්නට වූ වේදනාවද සමඟිනි.

" අඩන්නේ නැතුව මට ඇයි කියලා කියන්නකො ඉතිං. අම්මා ඔහොම අඩනවා බලන් ඉන්න මං ආස නෑ නේ ඒක අම්මත් දන්නවනේ"

කමණීගේ තුරුළට තව තවත් ළංවෙමි ආකශ්රා උත්සාහ කළේ ඇයව සැනසීමට වුණත් ආකෂ්රා ගේ වචනයක් වචනයක් පාසා කමණීගේ හිතට එක් කළේ වේදනාවක් පමණී.

දෙවියනේ මාත් අම්මෙක් නේද ?
මගේ ලේ කිරට හැර උනේ වුණේ මේ කෙල්ල වෙනුවෙන් නේද?
මං කවදාවත් ආකශ්රා ට වෙනසක් කළෙත් නෑ.
ඉතිං ,
ඉතින් ඇයි බැරි මට ආකශ්රා ට අම්මා කෙනෙක් වෙන්න.

sinhalaebooks.com

නෑ මං මගේ දුව කාටවත් දෙන්නෙ නෑ. මම තමයි එයාගේ අම්මා.අවුරුදු විසි දෙකක් පුරාවට මේ කෙල්ලව ඇහි තියාගෙන හදුවඩා ගත්තු එයාගේ අම්මා මම තමයි. එයාව කාටවත් දෙන්න බෑ. කවදවත් මම එයාට කාටවත් දෙන්නෙත් නෑ.

තුරුලේ ඉඳගෙන කමණීගේ මූණ දෙස බලාගෙන එකිනෙක ප්‍රශ්න අහන සුද්දිගේ හිස් අතුගාමින් කමනි තනිවම කල්පනා කරන්නට වූයේ මේ සිදු වෙන කිසිවක් ඇයට ප්‍රකාශ කරන්නට තරම් කමනි ගේ හිත ශක්තිමත් නොමැති බැවිනි. එහෙත් සුද්දිගේ ප්‍රශ්න වලට අම්මගෙන් පිළිතුර නැති නිසාම නිසා ම ඇය ද දිගින් දිගටම අම්මගෙන් ප්‍රශ්න අහන්නට පෙළඹුණේ ඇයගේ මවගේ දෑසේ කඳුළු ඉවසන්නට තරම් තරම් සුද්දිගේ හිත ද ශක්තිමත් නොවන බැවිනි.

" ඇයි අම්මෙ මේ අනේ කියන්නකො මොනවා හරි ප්‍රශ්නයක්ද"

" ප්‍රශ්නයක් නෙවෙයි මැණිකේ වෙද සීයා චුට්ටක් සැර වුණා. ඒ හින්දයි මේ ඇස්වල කඳුළු. නැත්තං ඉතින් මට අඬන්න මේ ගෙදර මොන ප්‍රශ්නයක් කියලා ද "

කමනේ උත්සාහ කලේ සුද්දි ගෙන් සියල්ල සැඟවීමට ය.

" හැබැයි මම ගිහිල්ලා සීයා ගෙන් අහනවා හොඳද ඇයි අම්මට බැන්නෙ කියලා.හේතුවක් නැතුව සීයා බනින්නේ නැනේ."

" සිය නපුරු වුනොත් සුද්දි දන්නවනේ සීයගෙ හැටි. ඒ හින්ද ආයෙම ගිහින් සීයව අවුස්සන් නැතුව දූන් හොඳ ළමයා වගේ ගේ ඇතුලට ගිහිල්ලා මට තේ එකක් හදගෙන එන්නකෝ."

සුද්දීගේ නාමයෙන් ඇස් වලට ඉනු කඳුළු බර වැඩි නිසාම ඇයව එතනින් පිටමං කර හරින්නට කමනි උත්සාහ දැරුවේ ඇය සිටින විට ඒ කඳුළු තව තවත් වැඩියෙන් ඇස් වලින් රුරා වැටෙන බැවිනි. කමනි ගේ දෑනුම් දීමත් එක්ක මුළුතැන් ගේ දිහාවට පිය මනින්නට වූ සුද්දී ආපසු වතාවක් ප්‍රධාන දොරටුව දිහා වට හිස හරවා බැලුවේ අම්මා තවමත් අඬනවා දැයි හිතට සැකයක් ඇති වූ බැවිනි.

මේ අතර තුර කමණීගේ තොරතුරු හෙළ කිරීමෙන් පසු වෙද ගෙදරට පැමිණී තරුණයින් දෙදෙනා තමාගේ කාමරයට පැමිණ එකිනෙක අදහස් හුවමාරු කරගන්නට පටන් ගත්තේ මේ කිසිවක් එක්වර විශ්වාස කිරීමට තරම් ඔවුන්ගේ හිත ශක්තිමත් නොවුණු නිසා වෙනි. සත්‍ය පිළිගැනීමට තිදස්ට සෑහෙන්න අමාරු විය

" අකලංක උඹ කියන්නේ මට මේ ඇත්ත පිළිගන්න පිළිගන්න කියලද. මෙච්චර කල් එතකොට මං මේ කෙල්ලට ආදරේ කරලා තියෙන්නේ මේ මගේ නංගිද අකලංක"

" මචං අකමැත්තෙන් උනත් අපිට දැන් ඇත්ත පිළිගන්න වෙනවා"

sinhalaebooks.com

" ඔව් බං ආපු මුල් දවස් වල මට සුද්දි ත් එක්ක මොකක් හරි සංසාර බැඳීමක් තියෙනවා කියලා තේරෙන්නෙ නැත්තේ මේ හේතුව නිසා වෙන්න ඇති. උඹට වුණත් මතකනේ මම කිව්වා මට මේකිව කොහෙදි හරි මොනවට හරි හුරුපුරුදුයි කියලා. ඒත් කවුද හිතුවේ ඒ මගෙ නංගි කියලා."

" මේ ලෝකෙ වෙන හැම දේම අපි හිතන පතන දේවල් නම් කරන්න බැරිද මචං. දැන් ඉතින් දෙන්න ඕන දේවල් වෙලා ඉවරයි. දැන් ඉතින් හිතල බලපන් උඹ මේ දේවල් අම්මාටයි තාත්තා ටයි කියනවද කියලා"

" කිව්වොත් විශ්වාස කරයිද කියලා සැකයක් තියෙනවා. කියා හිටියොත් ප්‍රශ්නයක් වෙයිද කියලා බයකුත් තියෙනවා"

" මචං මං මේ කියන දේ හරි වැරැද්ද නම් මම දන්නෙ නෑ. හැබැයි මං මේක යන්තේ මට හිතෙන දේ. මට වෙලාවකට හිතෙනවා අවුරුදු විසි දෙකක් තිස්සේ මේ හංගගෙන හිටපු රහස ඔය විදිහට හරි තිබ්බොත් හොඳයි කියලා."

අකලංක කියාගෙන යද්දී තිදස් ඔහු දෙස විමතියෙන් බලන්නට විය. ඔහු කියන්නේ කුමක්ද කුමන පදනමක් යටතේද යන්න තිදස්ටම ප්‍රශ්නයක් වූ නිසාවෙන් පුදුමයෙන් මෙන් බැලීම එතරම් ගැටලුවක් නොවීය. නමුත් අකලංක එම තීරණයට හේතුව දැන දැනගැනීමේ වූ දැඩි උවමනාවක් පමණක් තිදස්ට ඇතිවිය.

" ඇයි බං බං එකපාරටම එහෙම කියන්නේ. එතකොට උඹ කියන්නේ මේ රහස මං අපෙ අම්මට කියන්න එපා කියලද"

" තිදස්, මේ අහපන් අවුරුදු විසි දෙකක් තිස්සේ උඹේ අම්මා හිතාගෙන ඉන්නේ ඒ ඉපදුන නිවුන් දරුවා ඉපදෙද්දී ම නැති වුණා කියලා. ඉතිං උඹේ අම්මයි තාත්තයි මේ ගෙවුණු අවුරුදු 22 පුරාවට ඒ සිද්ධි අමතක කරලා ගොඩක් දුරට හිත හදගෙන ඉන්නේ. ඉතිං ආයේ ඒ දේවල් මතක් කරලා යටගිය ඒ ප්‍රශ්න උඩ අදින්න ඕනෙමද"

" අනේ මන්ද බන්. ඇත්තටම අම්මයි තාත්තයි ඒ ප්‍රශ්න නං දැං අමතක කරලා තමයි තියෙන්නේ."

" හරි අපි කිව්වා කියමුකො. එතකොට මොකක්ද වෙන්නෙ. ආකෂ්රා ගේ අම්මා වැරැද්දක් තමයි බං කලේ. එද එයා එහෙම කරන්න කරන්න ඇත්තේ දරු දුක හින්ද වෙන්න ඇති. හැබැයි අවුරුදු විසි දෙකක් විසිදෙකක් ඈගේ පියාගෙන රකපු කෙල්ලව එයාගෙන් වෙන් කරනවා කියන්නේ ඒ අම්මට දරාගන්න බැරි වෙයි නේද මං දැන්."

" ඔබ කියන කතාව ඇත්තක් නැත්තෙම නෑ අකලංක. කොහොමත් තව ටික කාලෙකින් කොහොමත් සුද්දි කසාදයක් බැඳගත්තා හම ගෙදරින් යන්නම වෙනවා නේ"

" හරි මට පුලුවන්ද එහෙනම් උබෙන් එක්කම එක දෙයක් ඉල්ලන්න"

sinhalaebooks.com

අකලංක එක්වරම තිදස් දෙස බලාගෙන කියද්දී ඔහු පුදුමයෙන් අකලංක දිහාවට හැරුනේ එවර ඔහු කුමක් කියන්නට සූදනම් වෙනවා දැයි වෙනවා දැයි හිතට ප්‍රශ්නයක් ඇති වූ නිසාවෙනි.

" උබට මං මෙච්චර කාලෙකට කිසිම දෙයක් බෑ කියලා නැහැනේ අකලංක. උඹ මගේ යාළුවෙක් නෙවෙයි බං උඹ මගේ සහෝදරයෙක්"

තිදස් කිව්වේ අකලංකගේ උරහිසට තට්ටුවක් දමන ගමන් ය.

" මචං උඹ විශ්වාස කරපන් මං කෙනෙක්ට ආදරේ කළා. හැබැයි එක හේතුවක් හින්ද ඒ ආදරේ හැමදම මගේ හිතේ විතරක් ම තිබ්බා"

අකලංක කියාගෙන යද්දී තිදස් ඔහු දෙස පුදුමයෙන් බලන්නට විය.

" මොකක්ද බං උඹ කියන්නේ උඹ කවදවත් කාටවත් ආදරේ කලා කියලා මට කියලා නැනේ "

" කියන්නේ කොහොමද බං. මං ආදරය කරන්න ගත්ත කෙනා ලග මටත් කලින් උඹේ හිත නැවතිලා නේ."

අකලංක කිව්වේ ඇසිපිය නො හෙළා ඇස් පිය නොහෙළා තම යාළුවා දෙස බලමිනි. අකලංක ඒ සියල්ල කියවාගෙන යද්දී තිදස් නිහඬ ඔහු දෙස බලා සිටියා මිස එතනින් එහාට කිසිවක් නොකියා සිටින්නට ඔහු සිතුවේ ඔහුගේ හිත ඒ සියල්ල සමග ගොළු වී ගිය නිසාවෙනි.

" උඹ කියන්නේ උඹත් ආකශ්රාට ආදරේ කලා කියන එකද, ඒත් ඒ ආදරය මං හින්ද හැමදම හිතේ තියා ගත්තා කියන එක ද"

" ඔව් බන් මාත් ආදරේ කලා. හැබැයි ඒ ආදරේ ට වඩා මට මගෙ යාළුවා වටින හින්ද මං හැමදම ඒ දේ හිතේ තියාගත්තා."

" අකලංක.."

තිදස් කියද්දි අකංලක නිහඬ විය.

" හ්ම් ඔව්. මං ආකශ්රා ට ආදරෙයි බන්. උඹේ නංගිට මං ආදරෙයි තිදස්.. මට ඒකිව දියන්"

අකලංක කියද්දී තිදස් පුදුමයෙන් ඔහු දෙස බැලුවේ ඔහුට දිය යුතු උත්තරය කුමක් ද යන්න නොතේරුනු නිසාවෙනි.

sinhalaebooks.com

අකලංක"

" ඔව් බන් අකලංක තමයි. උබ මට ඇත්තම කියපන් මං කියපු දේට උඹේ අකමැත්තක් තියෙනවද"

දිගින් දිගටම අකලංක අසද්දී තිදස් පවා ගොලු වූයේ තාමත් මේ සිද්ධ වෙන දේවල් විශ්වාස කිරීමට නොහැකි නිසාවෙනි. කෙසේ වෙතත් තරුණියින් දෙදෙනාගේ කතා බහ අස්සෙත් ඔවුන්ගේ කාමරය ආකශ්රා එන තුරුම ඔවුන් අයව නොදුටුවේ ඒ තරමට බැරෑරුම් කතා බහක ඔවුන් සිටිය නිසාවෙනි.

" මොනවද දෙයියනේ දෙන්නත් එක්ක මේ ඔලුව ගිනි අරන් වගේ කියවන්නෙ "

එක්වරම ඇසුන ආකෂරා ගේ කටහඬින් විමතියට පත් තරුණියිම් දෙදෙනා ඇය දිහාවට හැරී බැලුවේ එය සිදු වූ සිදුවීම විශ්වාස කිරීමට නොහැකි නිසාවෙනි.

" ඔයා මෙතන. කොහෙ ඉදලා ද මේ එක පාරටම"

" ඔව් ඉතින් මං එනවා කියලා ඔය දෙන්නා කොහේ දකින්නද .දෙන්නත් එක්ක ලෝකේ පෙරලන්න වගේ ලොකු කතාවක නේ හිටියේ. කවදවත් නැතුව දෙන්නට ජනාධිපතිටවත් නැති ප්‍රශ්න ද කොහෙද "

" ඉතින් සුද්දිට ඇහුනේ නැද්ද අපි කතා වුන ඒවා"

අකලංක එක්වරම ඇසුවේ ඔවුන්ගේ කතාබහට ඇයත් සවන් දී සිටියා දැයි දැනගැනීමේ ලොකු බලාපොරොත්තුවකිනි. මේ කතා බහ රහසේ සිදු විය යුත්තක් බැවින් සුද්දි වත් මෙය දැනගන්නවට ඔහු තුළ කැමැත්තක් තිබුනෙම නැති තරම් ය.

" අනේ අපි නම් ඔයා අනුන්ගෙ කතා අහන්නෙ නෑනේ. ඇහුනොත් මිසක්."

" අහ් ඒ කියන්නේ මෙයාට අපි කියපු ඒවා ඇහිලද කොහෙද. ඒ මේ තිදස් බලපන්කෝ බන්. මේකි අපේ කතාව අහගෙන ඉදලා"

අකලංක කෙතරම් කතා කලත් තිදස් හිටියේ ආකශ්රා දෙස බලාගෙනය. වෙනද කෙතරම් සුන්දරත්වයක් ආකශ්රා වෙතින් දුටුවත් දැන් ඇයව ඔහු දකින්නේ ඇයගේ සහෝදරිය ලෙසය. එක් වරම ගොඩනැගුනු ඒ සහෝදරත්වය නිසා අතරමං වූ තිදස් ආකශ්රා දෙස බලා හිටියා මිස වටපිටාවේ වූ කතා බහට අවධානය යොමු නොකලේය.

" මොකක්ද අකලංක අද මෙයාට වෙලා තියෙන්නේ. කෝ කතා. අනිත් එක කවදවත් නැතුව ඇයි දන්නෑ වෙස් පෙරලිලා"

sinhalaebooks.com

ආකශ්රා කිව්වේ සිහින් සිනහවක් මුවේ රඳවා ගනිමිනි.

"සුද්දි. මං දෙයක් අහන්න ද"

එක්වරම තිදස්ගේ මුවින් පිට වූ වචන පේළිය එක්ක අකලංක වගේම ආකශ්රාවත් ගොළු වූයේ කිසිවක් හිතාගත නොහැකි බැවිනි.

" උඹ මොනවාද බන් ඒ පාර කරන්න හදන්නේ. මොනවාද මේ කියවන්නේ. "

" සුද්දි එක්කනේ බන් මං කතා කලේ. උඹ එක්ක නෙවෙයි නේ"

තිදස් කියද්දී අකලංක නිහඬ විය.
සිදු වන දේ පැහැදිලි නොමැති නිසාම සුද්දී ඔවුන් දෙස විමතියෙන් බලන්නට විය.

" අහන්නකෝ බලන්න. මං උත්තරයක් දෙන්නම්."

ආකශ්රා කියද්දි අකලංක පුදුමයෙන් ඇය දෙස බලන්නට විය.

ආකශ්රා ලග තිබුනේ අපූරු සුන්දරත්වයකි. විටෙක ඒ සුන්දරත්වය නගරට නොගැලපේ යැයි තරුණයින්ට නොසිතුනාම නොවේ. මක්නිසාද යත් ගමේ සුන්දරත්වය නගරයේදී වියැකී යන නිසාවෙනි.

උඹ ගමට අයිති මලක් මගෙ නංගියෙ.

තිදස් තනියෙන් ම හිතන්නට විය.

උඹේ ඔය ලස්සනට ඕනම කොල්ලෙක් වශී වෙනවා කියන එක පුදුමයක් නෙවෙයි ඉතින්. ඇත්ත කියන්නම හිතෙනවා හැමෝටම. ඒත් , උඹව හදගත්ත අම්මා වෙනුවෙන් ඒ ඇත්ත හංගාගෙන ඉන්නවා මං

තිදස් හිතුවේය.
තිදස්ට දැනුනේ පුදුමාකාර අමුතු හැඟීමකි.
නමුත් ඒ සියල්ල යටපත් කරගෙන සිනාවෙන් හැසිරෙන්න තරම් ඔහු ඔහුගේ පිරිමි හිත පාලනය කර ගත්තේ ආකශ්රා වෙනුවෙනි.

" ඉතින් කියන්නකෝ අනේ.කියනවා කියලා කල්පනා කරනවා පැත්තකට වෙලා. තිදස් ගේ අම්මයි තාත්තා යි එහෙම මෙතෙන්ට ආවොත් මටත් බනී කොල්ලෝ එක්ක කෝලම් කරනවා කියලා. අනික අම්මත් දැන් කතා කරයි මට. යන්න ඕනෙ නෙ. කියන්නකෝ මොකක්ද කියන්න තියෙන්නේ කියලා "

" ආකශ්රා කැමති නැද්ද ආදරේ කරන්න"

sinhalaebooks.com

තිදස් අහද්දී ඇයගේ මුහුණ වෙනස් වෙන ආකාරය ඔහුද බලාගෙන සිටියේය.
ආකශ්රා යනු තවම පෙති වත් විකසිත නොවූ කැලෑ මලකි. ඒ මලේ සුවඳ මුළු වෙද ගෙදර පුරාම අස්සක් මුල්ලක් නැර විසිරී තිබෙන බවද සැබෑවකි.
ඒත් ඒ මලේ සැබෑ අයිතිය සතු නගරයට බව දැනගත් මොහොතේ පටන් තිදස්ට තමා වගකීම් සහිත පුද්ගලයෙකු සේ දැනෙන්නට විය.

" මොනවාද මේ අහන්නේ.."

" කෙනෙක් ඔයාට ගොඩක් ම ආදරෙයි නම්. ඔයා කැමති නේද එයාට ආදරේ කරන්න මගේ නංගී"

" මං යනවා. අම්මා ආවොත් මට බැනුම් අහන්න වෙනවා."

ආකශ්රා තිදස්ගේ කතාව මග හැර යන්න සූදනම් වූයේ හිතට දැනුනු බියත් සමගිනි. ඒ ඇස් වල තිබුනේ කලබලකාරී ස්වරූපයකි.
ඒ එක්කම ඇය සුලඟක වේගයෙන් එතනින් ඈත්ව යන්න ගියේ තව දුරටත් ඔවුන්ට මුහුණ දීමට නොහැකියාව නිසාවෙනි.

" මොකක්ද තිදසා උඹ ඒ කලේ.ඒකි බය වුනා බන්."

ආකශ්රාගේ පිටව යෑමෙන් පසු අකලංක ඇසුවේය.

" අයියා කෙනෙක් විදිහට නංගි වෙනුවෙන් යුතුකමක් තියනවා බන් ඉටු කරන්න. උඹ මගෙ නංගිව පරිස්සමින් බලාගන්නවා නේද අකලංක. මගේ ඇස් මානේම ඉදී උඹ ලග ඒකී ඉද්දි."

අකලංක ට දැනුනේ ඉහ වහා යන සතුටකි.

" ඒත් බන් කමනී නැන්ද"

" ඒකත් මං බලාගන්නම්..."

තිදස් කියද්දී හිතට දැනුනු සතුට එක්ක අකලංක සිනහවක් පෑවේ උතුරා යන සහෝදර සෙනෙහසිනි.
තරුණයින් දෙදෙනාගෙන් වෙන් වූ ආකශ්රා ඒ පිම්මේම නිවසට දිව යද්දීත් කල්පනා කරන්නට වූයේ තිදස් එක්වරම කියූ දේ සම්බන්දවය. බලාපොරොත්තු වූ හෝ නොවූ දෙයක් සම්බන්ද ව ඔහු කියාගෙන යද්දී ආකශ්රාට හිතට දැනුනු බිය සමග කලබලයක් ද ඇති වෙන්නට විය. ඒ හැඟීම සමග තාමත් ආකශ්රා නොසන්සුන්ය. ආකශ්රා ඒ පිම්මේම දිව විත් ඇදෙන් හාන්සි වූනේ තිදස් කියූ දේ එකින් එක මතක් කරමිනි.

" ආකශ්රා කැමති නැද්ද ආදරේ කරන්න"

sinhalaebooks.com

" මොනවාද මේ අහන්නේ.."

" කෙනෙක් ඔයාට ගොඩක් ම ආදරෙයි නම්. ඔයා කැමති නේද එයාට ආදරේ කරන්න මගේ නංගී"

තාමත් ඒ දෙබස ඇයගේ දෙසවන් මානයේ දෝංකාර දෙන්නට විය.

ඇයි තිදස් එකපාරටම එහෙම දෙයක් කිව්වේ. කවුද මට ආදරේ කරන්නේ. තිදස් වත් ද ?
එතකොට එයාගේ ඒ ඇස් වල ලියවිලා තිබ්බේ ඒ ආදරේ ද ?
තිදස් ආපු දවසේ ඉඳලා මට ඒ හුරු පුරුද්දක් දැනුනේ ඒ ආදරේ එක්කද ?
වෙන්න බෑ. අනික තිදස්ගේ අම්මා කොහොමත් කැමති වෙන එකක් නෑ මට. මං මේ නිකම් ම නිකන් කෙල්ලෙක් විතරයි නේ. එහෙම එකේ මං වගේ කෙනෙක් ට තිදස් ආදරේ කරයිද.
එයා ආදරේ කරත් එයාගෙ ගෙදර අය මට කැමති වෙයිද ?
මටත් පිස්සුනේ. මං මේ විකාර හිතනවා.

ආකශ්රා තනිවම කල්පනා කරන්නට වූයේ මීට මිනිත්තු කිහිපයකට පෙර වූ ඒ සිදුවීම ගැනය.
වැඩිදුර නොහිතුවත් ආකශ්රා ගේ හිතේ කොනකද තිදස්ගේ රුව මැවෙන්නට විය. නමුදු ඒ සියළු හැඟීම් යටපත් කරගන්නට දැඩි උත්සහයක යෙදුනෙ එය හීනයක් ම පමණක් බැවිනි.
සුළු මොහොතක් ඇඳේ හාන්සි වී සිටි ආකශ්රාට නොදැනෙන්න ට එතැනට පැමිණි කමනී බොහෝ වේලාවක් ඇය දෙස බලා හිඳ තත්පර කිහිපයකට පසු කතා කලේ හිතේ බියඥ සමගිනි.

" මොනවාද සුද්දියේ උඹට ඔච්චර ම කල්පනා කරන්න තියෙන්නේ."

" මොකුත් නෑ අම්මේ. මං මේ නිකන් ඇඳට වෙලා හිටියේ. "

" උඹට අර කොල්ලෝ දෙන්නා එහෙම මොනවාහරි කිව්වද"

ඒ එක්කම ආකශ්රා ගැස්සී ගියාය.

අම්මා ඇයි එහෙම දෙයක් අහන්නේ. මොකක්ද මට නොදැනෙන්න මේ වෙන්නේ. මොනවාහරි දෙයක් වෙනවා කියලා නම් පැහැදිලි. ඒත් මොකක්ද ඒ.
ආකශ්රා තනියෙන් ම හිතුවාය.

" මොනවා කියන්නද අම්මේ මට එයාලා. ඇයි අම්මා නිතරම එයාලා ගැනම කියව කියව මගෙන් ප්‍රශ්න අහන්නේ අනේ. මට එයාලා එක්ක කිසිම ගණුදෙනුවක් නෑනේ"

sinhalaebooks.com

අම්මාගේ වෙනස නිසාත් ආකශරා නෝක්කාඩුවෙන් කීවාය. ආකශරා දැන් සිටින්නේ නිදස් කියූ දේ ගැන කල්පනාවෙනි. ඒ නිසාම අම්මාගේ කතා බහද දැන් ඇයට පෙනෙන්නේ හරහටය.
ආකශරා අම්මා හා වචන හුවමාරුවෙන් පසු සයනයෙන් නැගී සිටියේ එළියට යෑමට වුවත් දොර හරස් කර සිටින කමනී නිසා ඇයගේ ගමන නැවතුනේ ආපසු වරක් කමනීගේ මූණ දෙස බලමිනි.

" හුරතල් වෙන්න වෙලාවක් නෑ සුද්දියේ. හන්දියේ කඩේට ගිහින් වරෙන්කෝ නංගිත් එක්ක ගොම්මත් වැටෙන්න කලින්. අර මහත්තුරුන්ට රෑට කන්න මොනවාහරි හදන්නත් ඕනෙ වෙයි නෙ. අඩුපාඩු ටිකක් තියනවා අරන් වරෙන් මයෙ අම්මා"

" අනේ අප්පා තනියම. දැන් වෙලාවත් කීයද අනේ.. අනික අර සුපුන් අයියා හිටියොත් එහෙම. ඊයෙත් වැව් තාවුල්ලේ දි හම්බෙලා අනම් මනම් කිව්වා නෝක්කාඩුවට"

" සුපුනාත් ඕනෑවට වැඩී දැන්. ඌ වුනත් තේරුම් ගන්න ඕනෑ උඹට ඇහැ දාගෙන හිටියට වැඩක් වෙන්නෙ නෑ කියලා.වෙද සීයත් ඕකට දෙතුන් පාරක්ම අවවාද කරනවා මාත් අහගෙන.. අහ් හා හා නංගී එක්ක යමන්කෝ මයෙ අම්මා. ඉතින් ඉක්මනින් කොරපන්."

කමනී කිව්වේ කොළ කැල්ලක ලියූ බඩු ලැයිස්තුව හා මුදල් ආකශරා ගේ අත්ල මත තබමිණි.

"දහම්සා....චූටි දෝණි. අක්කා එක්ක කඩේට ගිහින් වරෙන් මැණිකේ"

ආකශරා ගේ කාමරෙන් පිටත් වී මුළුතැන් ගෙයි දිහාවට ගමන් කරන අතර තුර කමනී දහම්සාට කතා කලේ ආකශරා හා බඩු රැගෙන ඒමට කඩය දිහාවට පිටත් කර හැරිය යුතු බැවිනි. කෙතරම් හිත සනසා ගන්නට උත්සහ කලත් ආකශරා ගැන වූ ප්‍රශ්නය ඇයගේ හිතට තදින් ම වද දෙන්නට විය. ඒ හේතුව නිසාම ආකශරා ගැන හිතනවා ඇරෙන්න ට දැන් කමනීට වෙන වැඩක් නොවීය.

" යමු. හැබැයි මට හුලං විස්කෝතු අරගන්න සල්ලි ඕනා අම්මේ."

"අක්කාට සල්ලි දුන්නා. ඉතුරු වුනොත් ඕන විස්කෝතුවක් ගනින් කෙල්ලේ"

කමනී හඬ ගා කිව්වේ මුළුතැන්ගෙයි සිටය.

අවසානයේ දෙදෙනාන කඩ මණ්ඩිය දිහාවට පියවර මනින්නට වූයේ බොරළු පාර අයිනේ වූ අඹ ගහෙන් කඩා ගත් අඹ ගෙඩි දෙකකද රස විඳින ගමන් ය. ආකශරා මෙන් ම දහම්සාත් මේ ගමේ සුන්දරත්වයට බොහෝ සේ ඇළුම් කරන්නට වූයේ ඒ සුන්දරත්වය ජීවිතයට බද්ධ වී තිබූ නිසාවෙනි.

sinhalaebooks.com

"අක්කේ යද්දී අඹ ගෙඩි ටිකක් කඩාගෙන යමුකො අච්චාරුවක් දාන්න. අර අයියලා දෙන්නත් ගොඩක් ආස වෙයි අච්චාරු කන්න. ගොඩක් කාලෙකින් බැරි වුනා අච්චාරු හදන්න"

" අච්චාරු කාලා බඩේ දැවිල්ල කියලා මහා රෑ තිස්සේ නින්දක් නැතුව කෑ ගහන්නනේ. ඊට පස්සේ මෙතන ගෙදර කාටවත් නිදාගන්න නැති වෙන්න අඩව් අල්ලන්න"

ආකශ්රා කිව්වේ බොරු තරහක් මවා පාමිනි. ආකශ්රා ද අඹ අච්චාරු වලට දක්වන්නේ පෙරේතකමනි. දහම්සා කීවත් නැතත් යන ගමන් අඹ වල්ලකට වැඩක් දීම ආකශ්රා ගේත් එකම බලාපොරොත්තුව විය. නමුත් දහම්සාව අවුස්සා ගැනීමේ ආසාව නිසාම ආකශ්රා බොරු තරහක් මවා ගත්තා මිස දහම්සාව රිදවීමට ඇය කිසි විටකත් උත්සාහ නොකළාය.

"අක්කේ හුලං විස්කෝතු කන්න සල්ලි ඉතුරු කරගන්න බලන්න ඉතින් අහ්. අම්මා හැමදාම මෙහෙම කඩේට එවන්නෙත් නෑනේ. එවපු වෙලාවෙ ඒකෙන් ප්‍රයොජනයක් ගන්න ඕනේ"

" මෙන්න මෙහෙ එන්න චූටි යන්න."

ආකශ්රා , දහම්සාව ඇදගෙන බොරළු පාර දිගේ යන්නට වූයේ ගොම්මන් කළුවරට පෙර ආපසු නිවසට යා යුතු බැවිනි. කෙල්ලන් දෙදෙනා නිවසින් එළි බහින්නේ කලාතුරකිනි. සෙල්ලමට බර වූවත් වෙද සීයාගෙන් බුරුලක් නැති බැවින් නිවසින් පිට සෙල්ලමද අවමය.

" නංගී... දහම්සා."

කියව කියවා ගියෙ ආකශ්රා ගේත් දහම්සාගේත් කතාව නැවතුනේ එක්වරම ආකශ්රා, දහම්සාගේ අතින් ඇද නැවැත්තු බැවිනි.

" අයියෝ අක්කේ දැන් මොකද කරන්නේ. අදත් මොනවාහරි ප්‍රශ්නයක් දයි. ආපහු ගෙදර යනවද අනේ ඔයා ඔන්න කෑ ගහගෙන එහෙම යන්න ලෑස්ති වෙන්න එපා"

දහම්සා කියද්දි ආකශ්රා ඇයවත් අතින් ඇදගෙන කඩයට යන්න වූයේ එක් වරම දුටු රුව නොදැක්කා සේ අඟවමිනි.
 නංගී... දහම්සා."

කියව කියවා ගියෙ ආකශ්රා ගේත් දහම්සාගේත් කතාව නැවතුනේ එක්වරම ආකශ්රා, දහම්සාගේ අතින් ඇද නැවැත්තු බැවිනි.

" අයියෝ අක්කේ දැන් මොකද කරන්නේ. අදත් මොනවාහරි ප්‍රශ්නයක් දයි. ආපහු ගෙදර යනවද අනේ ඔයා ඔන්න කෑ ගහගෙන එහෙම යන්න ලෑස්ති වෙන්න එපා"

දහම්සා කියද්දි ආකශ්රා ඇයවත් අතින් ඇදගෙන කඩයට යන්න වූයේ එක් වරම දුටු රුව නොදැක්කා සේ අඟවමිනි.

sinhalaebooks.com

"අහ් වෙද තෝතේ. දැන් පේන්නෙ නැති ගානට යන්නේ එච්චර රස්නේ වැදිලද ලොකු ඇත්තන්ගේ"

ආකශරාගේ මග හරස් කරමින් ඔහු පවසන්නට විය.

"සුපුන් අයියේ. ප්‍රශ්නයක් ඇති කරන්නෙ නැතුව අයින් වෙනවද. අනිත් එක මෙතන ඔයත් එක්ක කතා කර කර, ප්‍රශ්න කර කර, විසඳුම් හොය හොය ඉන්න තරම් වෙලාවක් මට නැහැ. මට වෙද ගෙදර ඕන තරම් වැඩ තියෙනවා. ඒ හින්ද මං කැමති නෑ පාරවල් ගානේ ප්‍රශ්න ඇතිකරගන්න. කරුණාකරලා අයින් වෙන්න."

"අක්කේ..."

"යමු නංගී."

"මොනවද අප්පේ වෙද ගෙදර ඔච්චර තියෙන වැඩ. අර ආපු හාමු මහත්තයලගේ තෙල් ගාන්න වෙන්න ඇති. උඹලට කොහොමත් හැමදාම ලොකු පිටගංකාරයෝ තේ"

" අනේ පද හදන් නැතුව පැත්තකට වෙනවද සුපුන් අයියේ. මොකද වෙද ගෙදරට මේ මිනිස් එන්නේ අදක ඊයෙක දං මට ඒ මහත්තුරු විතරක් විශේෂ වෙන්නේ මොකොට ද."

" උන් ඇවිල්ලා ඇත්තේ උඹව කැන්දගෙන යන්න වෙන්න ඇති. මාත් එදා දැක්කානෙ නැන්දම්මාටයි මාමටයි ගමේ අසිරිය පෙන්නනවා. "

" මං කොහොම වුනාම උඹට මොකක් වෙනවද බන්"

ආකශරා පවසන්නට වූයේ කේන්තියෙනි. දහම්සා ඉදිරියේ බහින් බස් වීමට අකැමැති නිසා මේ තරම් හෝ ඉවසුවත් සුපුන් කියනා දේවල් සමග තව දුරටත් ඉවසා සිටීමට තරම් යහපත් මානසිකත්වයක් ද ඇයට නොවීය.

"අයියේ. අපේ අක්කට යන්න දෙන්නකො. "

" උඹලෑ අක්කා හිතාගෙන ඉන්නේ සිදදියට දීග යන්න වෙන්ටෑ"

" සිදදියට හරි කොයි ලෝකෙට හරි මං දීග ගිහාම උඹට මොකක්ද බන් සුපුන් අයියෙ ප්‍රශ්නේ"

" උඹට මං කැමති කියන එක තව කී වංගියක් උඹට කියන්න ඕනෙද"

sinhalaebooks.com

"දවල් හීන දකින්න එපා අයියේ. වෙද සීයා වුනත් කී පාරක් උඹට ඕක තේරුම් කලාද. අක්කා ඕවට කැමති නෑ.අනික ඒකිට ඕන එකා එක්කයි ඒකි දීග යන්නේ.මොකද උඹ බලෙන් උස්සන් යන්නයැ"

දහම්සා කියවන්නට වූයේ සුපුන් ගැන හිතේ වූ කේන්තියද සමගිනි. ආකශරාට ඔහු මනාප බව වෙද ගෙදර සියල්ලෝම දන්නා කරුණකි.නමුත් ඔහුට වෙද සීයාවත් , කමනීවත් මනාප නොවූනේ සුපුන්ගේ වූ අක්‍රියාවත් නිසාවෙනි. විටින් විට ඔහුගෙන් එල්ල වන බලපෑම් ද ඉවරක් නොමැති නිසාවත් ආකශරා හිටියේ ඔහු සමග කේන්තියෙනි.

"මට ඕනෙ නම් මං බලෙන් හරි උස්සන් යනවා එච්චරයි. මොකද සුද්දි කොළඹ හාමු මහත්තයෙක් බදින්නයැ. කවදහරි ඒකිත් බදින්න ඕනේ මේ ගමෙන් තේ. මේ ගම් හතකවත් එකියෙක් පිට ගම් ගියෙ නැතේ බන්"

සුපුන් කියද්දී ඔහුව මග හැර කෙසේ හෝ කඩ පිලට ගිය ආකශරා හා දහම්සා විනාඩි කිහිපයක් තුල බඩු බිලෙහි සියල්ල මිලදී ගෙන ආපසු හැරුනත් තාමත් සුපුන් හිටියේ ඔවුන්ව හරස් කරගෙනය.

"සුපුන් කොල්ලෝ. සුද්දී කෙල්ලට යන්න දීපන් උඹට වෙද සීයාගෙන් විසුමක් වෙන එකක් නෑ ඕන් ඕවා දැනගත්තොත්"

මුදලාලි කියන්නට වූයේ මෙතෙක් වේලාවක් බලා සිටියත් සුපුන්ගේ ක්‍රියාවන්ගේ නිමාවක් නොවන බැවිනි.

" වෙද සීයා මාව උල තියන්නද මුදලාලි මාමේ"

සුපුන් තාමත් සිටින්නේ කේන්තියෙනි. සිදු වන සිදුවීම් එක්ක සුපුන් කේන්ති ගත්තත් ආකශරා ට අවැසි වූයේ ඔහුගෙන් බේරි නික්ම යෑමටය.
සුපුන් හා කතා කිරීමටවත් ආකශරා ගේ මනාපයක් නොවූනු නිසාම ආකශරා සෑම විටම උත්සහ කලේ ඔහුව මග හැර සිටීමටය. කෙසේ වෙතත් තිදස්ලාගේ ඇයි හොඳයිය හේතුවෙන් සුපුන් පරල වී යැයි ඇයට සිතෙන්නට විය. නමුත් තිදස් ලා සමග සුපුන් කියනා තරම් සම්බන්දයක් නොමැති බව දන්නේ ආකශරාම පමණී.

"උල තියන්න හරි නොතියන්න හරි ඔය කෙල්ලො දෙන්නට යන්න දීපන් බන්.උඹට ලැජ්ජාවක් නැද්ද කෙල්ලො දෙන්නෙක් වට කරගෙන කෑ ගහන්න."

මුදලාලිගේ දැඩි පෙරැත්ත කිරීම නිසා ආකශරා හා දහම්සා , සුපුන්ගෙන් බේරී එනනින් ඉවත්ව දිව එන්නට වූයේ කේන්තියද සමගිනි. දිගු නිහැඬියාවක සිටි සුපුන් එක්වරම නැවතත් ඇවිස්සීමට හේතුව තිදස්ලාගේ පැමිණීම බව සුද්දීටත් පැහැදිලි විය. ඒ කෙසේ හෝ වේවා සුපුන් ගැන නම් අංශු මාත්‍රයකවත් කැමැත්තක් ඇයගේ හිතේ නොවීය.

sinhalaebooks.com

"අක්කේ. කලබල අස්සේ හුලං විස්කෝතුවක් ගන්නත් බැරි වුනා. අඹ ගෙඩියක් කඩන් යමුකෝ"

අතරමගදී ආයෙම දහම්සාගේ කෙදිරිලිය ඇසෙන්නට විය.

"සුනංගු නොවී ඉක්මන් කරපන් හැබැයි චූටි. අම්මා දැනටත් මග බලාගෙන ඇති. කළුවරත් වැටීගෙන එනවා"

"හා"

දෙදෙනාත් සමගම ගසට නැග අඹ ගෙඩි කිහිපයක් කඩාගෙන බඩු මල්ලටම දගත්තේ පුදුමාකාර ආසාවෙනි. අඹ අච්චාරුවක රස බැලීමේ බලාපොරොත්තුව ඉහ වහා යන්නට විය.

"දහම්සා බහින්න ගහෙන් ඉක්මනින් කරලා. තව පරක්කු වුනොත් වෙද සීයාගෙ කුරටි පාර තමා ඔන්න"

" අනේ තව ගෙඩි දෙකක්."

"ඇති ඇති ඉක්මනින් බහින්න පරිස්සමින්."

ආකශ්රා කීවේ දහම්සා දිහාවට අතක් දිගු කරමිනි.
හෙමින් සීරුවෙන් ගසින් බැසගත් දහම්සා බඩු මල්ලද එල්වාගෙන ආකශ්රා සමග බොරළු පාර දිගේ ගමන් කරන්නට වූයේ පුදුමාකාර සතුටකිනි.
ඒත් එය පැවතුනේ විනාඩි කිහිපයක් පමණී.
එක්වරම ආකශ්රා ගේ මුහුණ දෙස බැලුවේ වෙද ගෙදර වැට මායිමේ හිඳ බලා සිටින රුව දැකීමෙනි.

" අක්කේ...."

"බැනුම් තමා යමු ඉතින්..."

දෙදෙනාම ඉදිරියට ගමන් කරන්නට වූයේ තරමක් බියකිනි.
" අක්කේ...."

"බැනුම් තමා යමු ඉතින්..."

දෙදෙනාම ඉදිරියට ගමන් කරන්නට වූයේ තරමක් බියකිනි.
වෙද සීයාගේ තරම දන්නා නිසාම දෙදෙනාම සිටියේ බියෙනි. සාමාන්‍යයෙන් හවස් යාමේ ගැටිස්සියන්ට ගමන් තහනම් ය. ඒ නිසාම වෙද සීයාගේ ඇහැට වහන් වී එළියට පැන්නා මිසක කවදවත් අවසරයක් නම් ලැබී නොමැත.

sinhalaebooks.com

"ලමිස්සියෝ පාරට බහින්න හොඳම වෙලාවක් වෙන්න ඇති මේක. අම්මපා උඹලට තියා උඹලගෙ අම්මා අප්පටවත් ඕක තේරෙන්නෙ නැනේ. කොහෙද ඉතින් මුත් පාරට බැස්සාමත් වැනි වැනී ගාටනවා ඇරෙන්න ඉක්මන් ගමනකුත් ඇත්තෙම නැතේ"

" වෙද සීයේ. ම් මේ ඉක්මනින් ආවා. ඉතින් මේ"

දහම්සා හා ආකශරා කඩුල්ල පනින ගමන් වෙද සීයාගේ මුහුණ දෙස බැලුවේ තරමක බියකිනි. සාමාන්‍යයෙන් වෙද සීයාගේ කතා බහට හරස් කැපීම දඬුවම් ලැබෙන්න තරම් වරදකි. ඒ කෙසේ වෙතත් ගෑණු ලමයි දෙදෙනාට බැනුම් අසන්නට තරම් සිතක් ද නොවීය.

"සුද්දී"

එක්වරම වෙද සීයාගේ දෑස් ආකශරා දිහාවට යොමු වෙද්දී ආකශරා හිස බිමට පහත් කලේ බියට වඩා ඔහු කෙරෙහි වූ ගෞරවය හේතුවෙනි.

"සීයේ. ම් මේ...."

"සුපුන් කොල්ලා මොනවාද උඹට කිව්වේ"

එක්වරම සීයා අසද්දී ආකශරා ගේ දෑස් විසල් විය.

වෙද සීයා කොහොමද දන්නේ මට සුපුන් ව හම්බුනා කියලා. මං ගෙදර එන්නත් කලින්. ඒ කියන්නේ පිටදි වෙන හැමදේම වෙද සීයාට ආරංචි වෙනවා එහෙනම්. ඒත් කොහොමද.

ආකශරා මදක් නිහඬව කල්පනා කරන්නට විය.ආකෂරාට මෙන්ම දහම්සාගේ ගේ ද හිතට දැනුනු එකම ප්‍රශ්නය නම් වෙද සීයා මේ පිළිබඳව දැන ගත්තේ කුමන ආකාරයකින් දැයි යන්නයි. දෙදෙනාම බොහෝ වේලාවක් නිහඬව ඉද ආයෙම හිස ඔසවා ඔහු දෙස බැලුවෙ තව දුරටත් ඔහු ඉදිරියේ නිරුත්තර විය නොහැකි නිසාවෙනි.

" දෙන්නගෙන් එක්කෙනෙක් කියනවද මොකක්ද වුනේ කියලා"

වෙද සීයා ගේ හඬ දරුණු විය. නමුත් තරුණියන්ට උත්තර දීමට තරම් හිත ශක්තිමත් නොවීය. කල යුතු දෙයක් නොමැති නිසාම ආකශරා කතා කිරීම ඇරඹිය.

"සීයේ"

" ඔව්. මං අහන්නේ මොකක්ද වුනේ කියලා තමා. ඒත් මට බොරු කියන්න තියාගන්න එපා.මොකද මං දෙයක් අහන්නේ ඒ ගැන දැනගෙන."

sinhalaebooks.com

"සුපුන් හම්බුනා. ඉතින් හම්බෙනා වෙනද විදිහටම රණ්ඩුවක් අල්ලගන්න ලෑස්ති වුනේ. එයා දැන් තිදස්ලත් ප්‍රශ්නයක් කරගෙන"

ආකශ්රා සිදු වූ සියල්ල එකින් එක වෙද සීයාට පැහැදිලි කරන්නට වූයේ තවදුරටත් සැඟවීමෙන් පලක් නොමැති නිසාවෙනි. වෙද සීයා යනු සාමාන්‍යයෙන් දෙයක් ගැන හොඳ හැටි දැනගෙන කරුණු විමසන පුද්ගලයෙකි. ඒ නිසා ආකශ්රා ඒ සිදු වූ සියල්ල ගැන වචනයක් නෑර ඔහු හා කියන්නට පටන් ගත්තාය.

"හොඳින් කිව්වට අහන්නෙම නෑ වගේ සුපුන් කොලුවත්. හා සුපුන් ගැන මං බලාගන්නම් උඹලා යමල්ලා ගෙදර. ආයෙ අහුවෙන්නෑ ගොම්මන් වෙලාවෙ එළි බැහැලා. අම්මලා දුවලා ඔක්කෝටම මං හොඳ පාඩමක් උගන්වනවා එහෙම වුනොත්"

වෙද සීයා කිව්වේ දහම්සා හා ආකශ්රා දෙස මාරුවෙන් මාරුවට බලමිනි.

"හ්ම් හා සීයේ"

"ඉක්මනින් ගිහින් අර දරුවන්ට කන්න කෑම ටිකක් හදපන් කෙල්ලේ. ගොඩක් රෑ වෙනකල් අත ගාන්නත් බෑනේ"

ඒ පිම්මේම කෙල්ලෝ දෙදෙනා දිව ගියේ නිවස දිහාවටය. වේගයෙන් දිව යද්දි වෙද සීයාගෙ හඬ ඇසීමෙන් ආයෙමත් නැවතුනේ ඒ ඇයි දැන් හේතුවක් දැන ගැනීමටය.

"දහම්සා දුවේ. වෙද ගෙදර බුදු පහන තියන්න ලෑස්ති කරලම යමන් කෙල්ලේ. අක්කා ගිහින් අම්මට උදව් කරනකල් උඹ ඒක ලෑස්ති කරපන් මයෙ අම්මා"

දහම්සා අතෙහි වූ බෑගය ආකශ්රා ට ලබා දෙමින් හිස වැනුවේ සීයාගේ අදහසට කැමැත්ත ප්‍රකාශ කරමිනි. සාමාන්‍යයෙන් වෙද සීයාගේ වචන වලට පිටුපෑමක් ඔවුන් කිසි විටෙකත් සිදු නොකරති. ඒ නිසාම දහම්සා නැවතෙද්දී ආකශ්රා බඩුත් රැගෙන නිවස දිහාවට ඇදුනේ තනිවමය.
ඒත් එක්වරම ප්‍රධාන දොරටුවෙන් ඇතුල් වෙන්නට පෙර විසිත්ත කාමරය දෙසින් සංවාදයක් ඇසෙන්නට විය. දුර තියාම ඒ හඬ හඳුනාගත් නිසාම ආකශ්රා ඒ දෙස අවධානය යොමු කරන්න වූයේ ඔවුන් කතා කරන්නේ කුමක් ගැනද යන්න දැනගැනීමේ අදහසිනි.

"පුතේ මට තනි තීරණයක් ගන්න බෑ මේ ගැන. වෙද සීයා එක්කත් කතා කරන්න ඕනේ. අනික ආකශ්රා ගේ ලොකු වගකීමක් අරන් ඉන්නේ සීයානේ"

ඒ ආකශ්රා ගේ අම්මා බව ඇයට අඳුනා ගැනීම අපහසු නොවීය. විසිත්ත කාමරයේ කතා බහේ යෙදී සිටියේ කමනී සමඟ තිදස් හා අකලංක බැවින් මෙහි තේරුමක් දැනගැනීමේ වැඩි උනන්දුවක් ආකශ්රා ට විය.

sinhalaebooks.com

" ඔව්. වෙන්න ඇති. ඒත් සීයාව අනිවාර්යයෙන් කැමති කරවගන්න එක ඔයාගෙ වගකීමක් කමතී නැත්දේ. මොකද මේක ලොකු ගැටලුවක් වෙන්න පුලුවන් නැත්නම්"

"ඒ කියන්නේ ආකශරාගේ ඇත්ත...."

"ඔව්. ඔයා මේ දේවල් වලට පස්ස ගැහුවොත් මං ආකශරාගේ ඇත්ත කියනවා හැමෝටම"

තිදස් කියනවා ආකශරා ත් අහගෙනය. ඒ සංවාදය එක්ක ආකශරාට කුතුහලයක් ඇති විය.

මොකක්ද මේ මෙයාලා කතා වෙන්නේ. මගේ ඇත්තක් මොකක්ද. මොනවාද තිදස් මං ගැන දන්නේ. මං නොදන්න මොනවාහරි මෙතන තියනවා ද මන්ද. එතකොට සීයාගෙ කැමැත්ත ඉල්ලලා දෙන්න කියන්නේ මොනවටද

ආකශරා තනිවම කල්පනා කරන්නට වූයේ දොර අසලට වී ය. තවම ඇයව කවුරුත් නොදුටුව බව ඇයට විශ්වාසය. ඇයව දුටුවා නම් මෙවැනි සංවාදයක් නොවන බවත් ඇයට විශ්වාසය. ඒ කෙසේ වෙතත් මේ කතාවේ ඇත්තක් සොයාගන්නට ආකශරා ට උවමනා විය.

" මං ආකශරා ට ආදරෙයි කිව්ව කතාව අමතක කරන්න. එහෙම දෙයක් වෙන්න බෑ කොහොමත්. අකලංක ආකශරා ට ආදරෙයි. ඒක ඇත්තක්. ඒ හින්දු එයාට කැමති වෙන්නම ඕනේ"

තිදස් කියන්නට විය

"තිදස් පුතේ"

"ඔව්..."

කමතීගේ හඬෙහි තිබුනේ තරම බිය මුසු හඬකි. ඒත් ඒ ඇයි ද යන්න ආකශරා ට නොවැටහුණි.

එතකොට මට ආදරේ අකලංක ද. තිදස් නෙවෙයි ද ? මොකක්ද මේ වෙන්නේ...

ආකශරා තව හොඳින් සවන් දෙන්නට විය.

"සීයා අකැමැති වුනොත් දෙවියනේ මං මොකක්ද කරන්නේ"

"එහෙම වුනොත් අපේ අම්මට කියලා කැමැත්ත අරන් දෙන්න වෙනවා මට. මොකද කවදවත් අපේ අම්මලා එයාගෙ දුවෙක් අකලංක ට දෙන්න අකැමැති වෙන්නෑ"

තිදස් කියද්දී ආකශරාව තව තවත් ප්‍රශ්න රාශියක පැටලෙන්න ට විය.

sinhalaebooks.com

තිදස්ගෙ නංගි කෙනෙක්. එයාට එහෙම කවුරුත් නැනෙ. මොනවාද මේ කියවන්නේ

තිදෙනා අතරේ සිදු වෙන දෙබසක් ගානේ ආකශරා තනිවම කල්පනා කරන්න විය.

"මොකක්..අම්මට කියන්න."

"ඔව් ආකශරා මගෙ තිවුත් සහෝදරී කියලා මගේ අම්මට කියන්න සිද්ධ වෙනවා මට. එදා ඔයා හොස්පිටල් එකේදී දරුවො මාරු කරපු එක කියන්න සිද්ධ වෙනවා මට"

එක්වරම ඇසෙන්නට වූ දේ සමග ආකශරා ට දැනුනේ ඔලුව කැරකෙන ගතියකි. ඒ ඇසුනේ කුමක් දැයි ඇයට නොවැටහුණු නිසාම ආකශරා එතනම වූ පුටුවෙන් වාඩි වූයේ කිසිම අදහසක් නොමැතිවය.

"මොකක්ද ඒ සද්දෙ. කවුද ආවේ. කවුරුහරි ආවා නේද"

කලබලයෙන්, අසිහියෙන් ආකශරා පුටුවට වාරු වීමත් සමග ඇසුනු හඬින් කලබලයට පත් කමනී විසිත්ත කාමරයේ සිට ඉස්තෝප්පුවට දුවගෙන ආවේ තරමක කලබලයෙනි. මේ සිදු වෙන දේවල් සමග දැන් පුංචි දේටත් කලබල වෙන කමනීගේ හිත ඇය විසින්ම කෙතරම් දුරට පාලනය කර ගැනීමට උත්සහ කලත් එය කෙතරම් අපහසු දැයි ඇයටම දැනෙන්නට විය.

"දෙවියනේ ආකශරා. මගේ රත්තරන්. කොයි වෙලාවෙද ඔයා ආවේ. කෝ නංගී. සුද්දී ඔයා. ම් මේ අහන්න මැණික ඔයා මේ....."

" ඔව් මං දැන් ආවේ. ඇහුනා හැමදේම මට ඇහුනා"

"අනේ මගෙ රත්තරනේ. නෑ එහෙම මොකුත් නෑ රත්තරන් එහෙම මොකුත් නෑ. ඒ ඇහුන හැමදේම බොරු මැණිකේ. බොරු මාව විශ්වාස කරපන් සුද්දියේ බොරු ඒවා ඔක්කෝම බොරු"

කමනී කියාගෙන යන්නට වූයේ හිතේ තිබුණු වේදනාව ද සමගිනි. ජීවිතයේ මේ තරම් අසරණ වුණු තැනක් තවත් නැති බව ඇයට මේ වන විට පසක් වී හමාර ය. එය කෙසේ හෝ වේවා දැන් ඇයට අවැසි වූයේ ආකෂරා ව මේ ප්‍රශ්න වලින් ගලවා ගැනීමටය. ඒ නිසාම ආකෂරා අසලිශා අසලින් වාඩි වූ කමනී දිගෙන් දිගටම කියවගෙන යන්නට වූයේ හදවතේ කැකෑරෙන අසීමාන්තික මාතෘ ප්‍රේමය ද සමගිනි.

" ආකශරා, නංගි මේ අහන්නකෝ."

" නෑ මට මොකුත් අහන්න ඕනෙ නැහැ. මං හැමදේම දන්නවා. ඔයාව මට මෙච්චර හුරු පුරුදුවට දැනෙන්න ඇත්තේ ඒ ලේ බැඳීම හින්ද වෙන්නැති එහෙනම්. දැකපු මුල් දවසේ

sinhalaebooks.com

ඉඳලා මොකක් හරි බැඳීමක්, මොකක් හරි සම්බන්ධයක් තියෙනවා කියලා මට ඔයාව දකිද්දිම තේරුණා අයියේ. ඒත් මං හිතුවෙ නෑ ඒක මේ වගේ බැඳීමක් කියලා"

" අපි නොහිතන දේවල් කොච්චර නම් වෙනවද සුද්දි. ඒ මොනවා වුණත් මේ තමයි ඔයාගේ අම්මා. අපි මේ දේවල් ඔයාට වත් දැනගන්න තියන්න නෙවෙයි හිටියේ. ඒත් අපි දන්නෙම නැතුව ඒ දේවල් අන්තිමට ඔයාත් දැන ගත්තා"

" තවත් මේ දේවල් හංගන්න දෙයක් නෑ ඉතින්."

" නෑ නංගී මේ දේවල් වල ඇත්ත මුළු ලෝකයම දැනගන්න ඕනෙ නෑ. මේ මෙතන ඉන්න අපි හතර දෙනා විතරයි ඒ දේවල් දන්නේ"

තිදස් බැරෑරුම් ස්වරූපයෙන් කියාගෙන යද්දී ආකෂරා ඔහු දෙස බැලුවේ තරමක් පුදුමයෙනි. ගෙවන තත්පරයක් තත්පරයක් පාසා හිතට මොකක්දෝ හැඟීමක් එකතු කරද්දී ඒ සියල්ල යටපත් කරමින් ආකෂරා කමනී දෙසද ආදරණීය බැල්මක් හෙළන්නට වූයේ මේ මොහොතේ ඇයට වෙන කිසිවක් සිතට නොනැගුණු නිසාවෙනි. මාතෘත්වය නිසා ම කමණීගේ දෑස ද මේ වන විට කඳුළින් අසීමිතව තෙත තිබුණි. බලාපොරොත්තු බිඳී යාම වැනි හැඟීමක් ඇයගේ මුහුණින් දිස් වෙද්දි ආකෂරා වාඩිවී සිටි අසුනින් නැගී සිටියේ කුමක් හෝ දෙයක් පැවසීමේ අරමුණෙනි. නොසිතූ වෙලාවක නොසිතූ මොහොතක නොසිතූ සිදුවීම් එක්ක සියල්ලෝම විමතියෙන් බලා හිඳිද්දී ආකෂරා කමණීගේ මුහුණ දෙස කෙලින් බලන්නට විය.

" මෙතනින් එහාට මේ දේවල් කවුරුත් දන්නෙ නැත්නම් ඒ දේවල් කවුරුත් දැන ගන්න ඕනෙත් නැහැ."

"සුද්දී."

" ඔව් අම්මේ කවුරුත්ම දැනගන්න ඕනෙ නෑ"

"මට උඹ නැතුව ඉන්න බෑ රත්තරන්. ඒත් මං මේ දේවල් හංගගෙන හිටියොත් වෙන්න ලොකු වැරැද්දක්. ඒකයි හැමදේම තිදස්ට කිව්වේ. මට සමාවෙයන් මං උඹට වැරැද්දක් කලා නම්. මං පවුකාර ගෑනියෙක්. උඹ ඉපදුනු ගමන් උඹව උඹේ අම්මගෙන් මං උදුර ගත්තා ආකශරා. මට සමාවෙයන් රත්තරන් මේ හැමදේටම මට සමාවෙයන්."

" ඔව් මට හැමදේම තේරුම් ගන්න පුළුවන්. ගොඩක් දේවල් දරාගන්න මට ශක්තිය දුන්නේ ඔයා නේ අම්මේ"

ආකෂරා කිව්වේ තරමක් සන්සුන් වුනු ස්වරයකිනි.

" එතකොට"

sinhalaebooks.com

" මෙච්චර කාලයක් නැති බැරි කමින් හරි මාව හදගත්තේ ඔයා නේ. දහම්සා නිසා වත් මට මේ වෙනකම් කිසිම අඩුපාඩුවක් ඔයා කරලා නෑනේ. මං ඔයාගෙ නෙවෙයි කියලා ඔයා මට දැනෙන්න දීලා වත් නැහැ. ඉතින් එහෙම වෙද්දී මං මොකටද අවුරුදු ගානකට පස්සේ ගානකට පස්සේ මේ වෙච්ච දේවල් ආයෙ හාරා අවුස්සන්නේ"

" ඒක ඇත්ත නංගී."

ආකෂරා ගේ වචනයට තිදස් ද අනුමැතිය ලබා දුන්නේ මේ ප්‍රශ්නය තව දුරටත් දුර දිග ගෙන යා නොහැකි නිසාවෙනි.

" මගෙ මැණික."

"අම්මේ..... අම්මේ මොකද මේ. ඇයි මේ ඇස් වල කඳුළු.අම්මේ ඇයි ඔයා මේ අඬන්නේ . ඉතින් මොකුත් වුනේ නැනෙ. දැන් අඩන්නෙ නැතුව ඉන්නකෝ"

ආකෂරා උත්සහ කලේ මේ මොහොතේ තම මව සනසාලීමට ය.
ඒ අතරතුර සුද්දීගේ නාමයෙන් ඇස් වලට ඉනු කඳුළු බර වැඩි ඒ කඳුළු නවතා ගැනීමට කමති උත්සාහ දැරුවේ ආකශරා ගේ වචන එක්ක කඳුළු තව තවත් වැඩියෙන් ඇස් වලින් රූරා වැටෙන බැවිනි.
එය කෙසේ වෙතත් මේ ප්‍රශ්නය මෙලෙස නිමා කර ගැනීමට හැකිවීම ගැන කමති දහස් වතාවක් හදවතින් සියල්ලන්ට ස්තුති වන්ත විය.

" ඒ ප්‍රශ්නෙ ඉවර වුනාට වෙන ප්‍රශ්නයක් තියනවා අපිට විසදගන්න"

තිදස් නිශ්ශබ්ද වූ සියල්ලන් අතරින් ඔහුගේ හඬ අවදි කරන්නට වූයේ අනෙක් ප්‍රශ්නය ගැන ද ආකෂරා දැන් යම් ඉඟියක් දන්නා බැවිනි.

" ඔව්. ඒ දේත් මට ඇහුණා අයියේ"

උතුරා යන සහෝදර සෙනෙහසින් ආකශරා තිදස් දිහාවට හැරුණී.

"මොනවද ඇහුනේ මගෙ නංගිට"

තිදස් ආදරයෙන් කිව්වේ හිතේ රැඳි සහෝදර සෙනෙහසිනි.

"අකලංක"

ආකශරා යන්තම් හිස එසවූවා පමණී. ඒ මොහොතේ අකලංක ගේ දෑස් ද තිබුනේ ආකශරා වෙත යා වීය. නොදැනුවත්වම ඒ ඇස් එකතු වෙද්දී නුපුරුදු හැඟීමක් දැනෙන්නට විය.

"ඔව් ඉතින් අකලංක තමයි"

sinhalaebooks.com

තිදස් කිව්වේ කමනී නිශ්ශබ්ද වෙද්දීය. මේ මොහොතේ නිශ්ශබ්දතාවය හොඳම පිළිතුර යැයි සිතුන නිසාම කමනී නිහඬ වෙන්නට තීරණය කලේය.

"කෙල්ල මේ අහන්න මගෙ නංගී. මට ඇත්තම කියන්න ඕනි හැබැයි. කියන්න බලන්න. කැමති ද අකලංක ට"

තිදස් කිව්වේ ආකශරා ගේ හිස අත ගාමිනි.

"අම්මේ...."

"ඔයා තීරණය කරන්න ආකශරා. ඔයා තනියෙන් ඒ ගැන තීරණයක් ගන්න. කාගෙන්වත් බලපෑමක් නෑ ඔයාට. හිතන්නකෝ. හිතලා තීරණයක් ගන්න"

ආකශරා දෙස බලාගෙන තිදස් කියද්දී අකලංක හා කමනී නිහඬව බලා සිටියේ කිව යුතු දෙයක් සිහියට නොනැගුනු නිසාවෙනි.
එදින ආකශරා ගෙන් පිළිතුරක් නොලැබුන මුත් කිසිදු බල කිරීමකින් තොරව සියල්ලෝම විසිර ගියේ මේ වන විට ඇයට දරාගත නොහැකි තරම් වූ පීඩනයක් දැනී තිබුනු බැවිනි. ආකශරා ව තේරුම් ගත් තිදස් , අකලංක මෙන් ම කමනීද තම තමන්ගේ වැඩ වලට පිටත් ව යද්දී ආකශරා පමණක් ඉස්තෝප්පුවේ ඉතිරි වූයේ මොහොතකට පෙර සිදු වූ සිදුවීම් වල මතකයද සමගිනි.

"අම්මා. ඇයි අක්කා අද උයන්නවත් එන්නෙ නැත්තේ"

මුළුතැන්ගෙයි දිහාවෙන් ඇසුනු හඬ ගැන ආකශරා දෙසවන් යොමු කලේ ඉස්තෝප්පුවේ සිටය. තාමත් අඩුවක් නැති හිත රිදීම නිසාම පසෙකට වී සිටි ආකශරා සෑහෙන්න වෙලාවක් නිහඬව සිටියා මිස කා සමගවත් කතා කිරීමට වත් නොගියේ ඒ ළද කම්පනය හේතුවෙනි.

"අක්කා ටිකක් ඔහොම නිදහසේ ඉදී දහම්සා."

කමනී ගේ හඬ ඇසෙත්ම ආකශරාට යම් සහනයක් දැනුනි. මේ සිද්ධ වෙන දේවල් එක්ක හිතට දැනෙන අසීමාන්තික කම්පනය නිසාම දැන් ආකශරා ට අවැසි නිදහස බව ඇයටම තේරුම් යන්නට විය.
තිබූ යන්තම් ආලෝකයත් අඳුර විසින් ගිල ගද්දී ඒ අන්ධකාරය දෙස බලාගෙන සිටියා මිස ඉස්තෝප්පුවෙන් අඩියක් වත් සෙලවෙන්නට ආකශරාට හිතක් නොවීට.

එතකොට මගෙ ඇත්තම පවුලද ඒ. ඒ මොකුත් සීයවත් දන්නේ නැද්ද. මං එතකොට මෙහෙ කෙනෙක් නෙවෙයි ද ? ඒත් මේ මිනිස්සු මට කොච්චර නම් ආදරෙයි ද ?
එහෙම වෙලා තියෙද්දි ඇයි මං අතීතය එක්ක පොර බඳින්නේ.

sinhalaebooks.com

විකල්පයක් නොමැති නිසාම ආකශ්‍රා තව තවත් ඒ ගැනම සිතමින් හිතට සහනයක් ලබා ගන්නට ගත්තේ පුදුමාකාර උත්සහයකි.

ඒ අතරතුර වෙද නිවසට ගිය තරුණියින් දෙදෙනා තිදස්ගේ දෙමාපියන් හමුවෙද්දී ඔවුන් සිටියේද බැරෑරුම් කතා බහකය.

"පුතේ අපි හෙට උදේම පිටත් වෙන්නම්. කොහොමත් ඔයාට එන්න බැරි වෙයි නේ තව දවස් පහ හයකට. ආයෙ ඔයාව එක්කගෙන යන්නම අපි එන්නම්. එතකොට හරි නේ නේද"

"ඔව් තාත්තා. කොහොමත් තව ටික දවසකින් හොඳටම හොඳ වෙයි. දැනටමත් සෑහෙන්න හොඳයි මට නම්"

"අපි හොඳයි කිව්වට බෑ දරුවෝ. ඒක වෙද සීයා තමයි තීරණය කරන්න ඕනේ"

"හ්ම් හා තාත්තා. මේ ඒක නෙවෙයි ආකශ්‍රා එහෙ එක්කගෙන යන වැඩේට මොකක්ද වුනේ. "

"අහ් ඒක හරි. සීයාගෙන් ප්‍රශ්නයක් නෑ. කෙල්ල කැමති නම් එයාවත් ලෑස්ති කරගන්න. එතකොට අපිට පුලුවන් එයාව එහේ එක්කගෙන යන්න. "

තිදස් ට දැනුනේ එහ වහා යන සතුටකි. ආකශ්‍රාව ඔහුගේ දැස් මානයේ තබා පරිස්සම් කරගත යුතුයි යන වගකීම ඔහුට දැඩිව දැනෙන්නට වූ නිසාම ආකශ්‍රාව ඔහුගේ නිවසට රැගෙන යාමේ දැඩි ආශාව තිදස්ගේ ඔලුවෙහි රුදෙන්නට විය.

"හා ඒක අපි කොහොමහරි කරමු. එතකොට එයාට පුලුවන් හොදට ආයුවෙර්ද වෙදකම තව ඉගෙනගන්න"

"ඔය කෙල්ලව ගෙදර එක්කගෙන ගිහින් ඒකෙන් වෙන ප්‍රශ්නයක් වෙයි අන්තිමට"

සුපුරුදු පරිදි තිදස්ට අම්මාගෙන් ලැබුනේ අසතුටුදයක පිළිතුරකි.

"එහෙම වෙන්නෙ නෑ දේදුනු. ඒ ළමයා හරි අහිංසකයි. ඒක ඔයාට පේන්නෙ නැද්ද දැක්කාම"

තාත්තා ගේ සහය තමාට ලැබීම ගැන තිදස් හිතින් දහස් වාරයක් තාත්තා ට ස්තූති වන්ත විය. අම්මා කෙතරම් අකැමැත්තක් ආකශ්‍රා ට දැක්වූවත් ඒ ඇයගේම දුව බව දැනගත්තොත් මොන ආකාරයේ හැසිරීමක් දක්වාවිද්දැයි යන්න තිදස්ටම පුදුමයක් විය. ඒ කෙසේ වෙතත් මේ සිද්ධ වෙන දේවල් මේ ආකාරයෙන් සිද්ධ වීම ඔහුගේ හිතට එක්තරා ආකාරයේ සැනසීමක් ගෙන දුණි. නමුත් මේ සියල්ල දෙස අකලංක බලා සිටියා මිස වචනයක් වත් පිට නොකලේ ඔහුගේ මනස නිරවුල් නොමැති නිසාවෙනි.

sinhalaebooks.com

"තාත්තලා පුතාලා ඕන දෙයක් කරගන්න අනේ."

අවසානයේ දේදුනු එපමණකින් නිහඬ විය.

ඒ සියලු සිදුවීම් අවසානයේ එදින රාත්‍රියද හෝරාවෙන් හෝරාව ගෙවීගෙන යද්දී සියල්ලෝම නින්දට සූදානම් වුවත් තිදස් බලාගෙන හිටියේ ආකශරාගේ පැමිණීම තෙක් ය. ඔහුගේ තත්වය පරීක්ෂා කිරීමට හා ඔහුට අවැසි වෙද කටයුතු කිරීමේ සම්පූර්ණ වගකීම ආකශරා සතු නිසාවෙන් ඇයගේ පැමිණීම මේ මොහොතේ අනිවාර්ය විය. නමුත් වේලාව පසු වීමත් එක්ක තිදස්ට දැනුනේ ඇයගේ නොපැමිණීමේ සේයාවකි.

"අද කෙල්ල එන එකක් නෑ මචං. ඒකි ශොක් වෙලා ඇති. අනික ඉතින් මේ වගේ දෙයක් එකපාරටම වුනාම කවුද ශොක් නොවෙන්නේ"

"ඇත්ත අකලංක. එක අතකට ඒ අහිංසකී පව්"

වෙද ගෙදර මිදුලේ හිඳ තරුණයින් දෙදෙනා කතා බස් කරන්නට විය.

"තාම හොඳටම හොඳ නැති හින්ද තමා මං කිව්වේ රෑ පින්න වැටෙන්න එළියට එන්න එපා කියලා. කියන දේ අහන්නෙ නැත්නම් කවදාවත් ගෙදර යන්න වෙන එකක් නෑ තිදස් මහත්තයෝ"

එක්වරම ඇසුනු හඬින් පුදුමයට පත් තිදස් හා අකලංක හැරී බැලුවේ ඒ හඬ පැමිණි දිසාවය.
ඒ රුව සුන්දරය. නමුත් මුව මදක් මලානිකය.
රාත්‍රියේ පිපි සේපාලිකා මලක් මෙන් පිවිතුරුය. ඒ සිනහව දකින ඕනෑම කෙනෙක් ආයෙම වතාවක් ඇය දෙස බලනවා නොඅනුමානය.

"ආකශරා. මගෙ නංගී"

තිදස් ආදරණීයව කිව්වේ මැලවුනු ඇයගේ වත දෙස බලමිණි.

"දැන් ඉතින් මට වැඩි අයිතිවාසිකමක් තියන හින්ද සැරෙන් කියලා හරි ඔයාව පරිස්සම් කරන්න වෙනවා අයියේ. කියන දේ අහන්න බැරි නම්. යන්න වෙද ගේ ඇතුලට"

ඒ හඬ තුල වූ ආදරණීය ආමන්ත්‍රණය තිදස්ගේ හදවතටම දැනෙන්නට විය. කිසිදක නොලද සහෝදර සෙනෙහසක් ඔහුගේ හිතට ආගන්තුක වුවත් ඒ ආගන්තුක බව ඔහුට දැනුනේ පුදුමාකාර ආදරයක් ලෙසටය.
ඒ නිසාම තිදස්ගේ අත ඇයගේ මුව ස්පර්ශ කලේ කිසිදා නොදක්වපු සහෝදර ප්‍රේමයෙනි.

"ඔහොම පරිස්සම් කරන්න මගෙ නංගී චූටි කාලේ ඉඳලා මගෙ ළඟ හිටියා නම්. කොහෙද ඉතින් මේ අයියට එහෙම වාසනාවක් තිබ්ලා නැනේ"

sinhalaebooks.com

"දුක හිතෙන කතා කියන්න බෑ තිදසා. එහෙම වුනොත් නංගිත් අවුල් යයි ඔන්න"

අකලංක තිහැඬියාව මැද්දෙන් කතා කලේ ආකශර්‍ා නැවත දුක් වේ යැයි බියක් හිතට දැනුනු නිසාවෙනි.

"හරි ඉතින් මෙයා මගේ නංගිනේ"

තිදස් ආකශර්‍ා ව ඔහුගේ පපුවට තුරුළු කරගන්නට විය.

------------------

වචන මුව ගොළු වෙලා හදගින්න ඇවිලුනේ
කඳුළු ඇස් රතු වෙලා පිරිමි හද සසැලුනේ
සුරඟක් ලෙසයි අද මට ඇයව දිස්වුනේ
හද රැඳුනු ආදරේ වාවන්න බෑ අනේ

හයිය නෑ නුඹේ හිත මං ඒක දන්නවා
තාම නුඹ පොඩි කෙල්ල ඒක මට දැනෙනවා
වගකීම් ගොඩක් මැද නුඹ දුරක හිඳිනවා
නුඹ නැතුව නුඹ එක්ක අපේ හිත් හඬනවා

ඇවිලිලා හද ගින්න කඳුළු කැට දිස්වුනේ
අතීතයේ දුක් ගොඩට පිරිමි හිත ගැස්සුනේ
තාම ඇ පොඩි කෙල්ල අයියගේ පණ අනේ
රැකගනිම් මගේ පණ ඇස් වගේ රත්තරනේ

----------------------

තිදස් හිතන්නට විය. ආකශර්‍ා ගේ සහෝදර බැඳීම තිදස්ගේ ලේ වලට පවා දැනෙන්නට වී තිබුණි. ඒ නිසාම පුදුමාකාර ආදරයකින් ඇයව පරිස්සම් කරන්නට ඔහුම හිතට ගත්තේ අවුරුදු විසි දෙකක් පුරා ඒ වගකීම අත් හැරුනු නිසාවෙනි.

නමුත් මේ කිසිවක් නොදත් මිස්ටර් දිසානායක ඔවුන්ට නොදැනෙන්නට මේ සිදුවීම දෙස බලා හිඳින්නට විය. ආකශර්‍ා , තිදස්ට තුරුළු වීම ඔහුගෙ හිතට දැඩි ප්‍රශ්නයක් ගෙන දෙන්නට විය. ඔවුන්ගේ සත්‍ය නොදන්නා නිසා දිසානායක මේ සිදුවීම දුටුවේ වෙනත් ආකාරයකිනි.

"එතකොට අපේ පුතා ආකශර්‍ා ගැන මෙච්චර උනන්දුවක් දක්වන්නේ ඒ කෙල්ලට ආදරේ කරනවා වත් ද"

sinhalaebooks.com

ඔහු ඒ දෙස බලාගෙන මොහොතක් කල්පනා කරන්නට වූයේ ඒ ගැන හරියටම තොරතුරක් දැනගැනීමේ උවමනාවෙනි.

"කොල්ලාගෙන් අහලම දැනගන්න වෙනවා."

ඔහු අවසාන තීරණයකට එළඹෙන්නට වූයේ ඒ දැනුනු කුතුහලයලද සමගිනි.

තිදෙනාගේ කතා බහා අවසානයේ ආකශ්රා පිටව යෑමෙන් අනතුරුව දිසානායක මහතා මිදුලේ සිටින තරුණයින් දෙදෙනා වෙතට ලං වූයේ මෙතරම් වේලාවක් සිදු වූ සිදුවීම් සමග ඇති වූ කුතුහලය හේතුවෙනි. තාමත් ඉවර නොමැති කතා බහා සමග සිටි තරුණයින් දෙදෙනා එක්වරම තිගැස්සී ගියේ දිසානායක මහතාගේ පැමිණීම අරුමයක් වුනු නිසාවෙනි.

"මොකද කොල්ලෝ දෙන්නා තිකත් බය වෙලා වගේ. මොනවාද කතා වුනේ අහ්. ඇයි මං එද්දි කතාව නැවතුනේ"

බලාපොරොත්තු නොවුනු දිසානායක ගේ පැමිණීම් නිසා වචනයක් වත් නොකියා මොහොතක් බලාසිටි තරුණයින් දෙදෙනා මුහුණෙන් මුහුණ බලාගත්තේ කිසිවකුත් නොකියාය.

"මං දැක්කා අර ගෑණු දරුවත් මේ පැත්තේ ඉදලා යනවා. ඇයි මොනවාහරි ප්‍රශ්නයක් වත් ද? හැසිරීම නම් එහෙම දෙයක් වගේමයි. තිදස්"

දිසානායක මහතා තිදස්ව උලුප්පා දක්වන්නට උත්සහ කලේ ඔහු දෑසින් දුටු සිදුවීම ගැන කතා කිරීමට මගක් පාද ගැනීමේ උවමනාවෙනි. නමුත් ඒ ගැන කිසිදු තැකීමකින් තොරව සිටින තිදස් හා අකලංක ගැන ඔහුටම පුදුමයක් හිතුනත් ආයෙම තිදස්ගේ මුහුණ දිහා එක එල්ලේම බලාගෙන ඔහු කියවන්නට විය.

"ඇයි ආකශ්රා මේ රෑ මේ පැත්තේ"

එවර දිසානායක ගේ හඬ තිව්‍රර විය.

"තාත්තා එයා ආවේ අපි එක්ක ටිකක් කතා කරන්න."

"මං අහන්නේ මේ රෑ මොකක්ද තියන කතාව කියලා තමයි ළමයෝ. අනික ගෑණු ළමයෙක්. ? මේ කොල්ලෝ දෙන්නෙක් එක්ක මොකක්ද ගණුදෙනුව"

"තාත්තා"

තිදස් වචන ගලපන්නට විය.
මීට මොහොතකට පෙර සිදු වූ කිසිවක් තාත්තා දුටුවේය යන්න තිදස් නොසිතුවත් දිසානායක වක්‍රව විමසුවේ ඒ සිදුවීම ගැනය. නමුත් තිදස් උත්සාහ කලේ වෙන කතාවකට හරවා ගැනීමටය.

sinhalaebooks.com

"තාත්තා තමයි ළමයෝ. මොකක්ද වුනේ කියලා අහන්නේ"

"සුද්දී මෙහෙ එන එකේ අමුත්තක් නෑනේ තාත්තා ඉතින්. ඒ ළමයා වෙද ගෙදරට එද්දි අපි දෙන්නා මෙතන ඉන්නවා දැකලා කතා කරලා ගියා"

"කතා කරලා විතරක් ගියා නම් ප්‍රශ්නයක් නෑ"

තිදස්ට තාත්තා ගේ වචන වලින් බේරීමට නොහැකි විය. සැබවින්ම ඔහු මේ මොහොතේ කතා කලේ තිදස්ට කතා කිරීමටවත් ඉඩක් නොතියාය.

"තාත්තා. ඔව් මං තාත්තා ට ඇත්තම කියන්නම්කෝ. මං හිතනවා තාත්තා හැමදේම හරියටම තේරුම් ගනී කියලා. තවත් මේ දේවල් හංගාගෙන හිටියා කියලා තේරුමක් නෑනේ"

"තිදස්"

එක්වරම තිදස්ගේ සිදු වූ වෙනස නිසා කලබලයට පත් අකලංක කියන්නට වූයේ ඔහුව නවතාලීමේ බලාපොරොත්තුවෙනි. රහස් , රහස් විදිහටම රැකීමේ දැඩි උවමනාවක් අකලංක ට තිබුණි. නමුත් ඒ රහස සැහෙන්න දුර දිග ගොස් අවසානය.තව දුරටත් එය ප්‍රසිද්ධ වීම තුලින් කමනීට අසාධාරණයක් සිදු වේ යැයි අකලංක ට සිතෙන්නට විය.

"නෑ බන්. මේ දේවල් අම්මලා තාත්තලා දැනගන්න ඕනේ. කවදහරි එයාලා මේක දැනගන්න ම ඕනෙ තේ බන්"

"ඒත්...."

අකලංක කෙතරම් උත්සාහ කලත් ඔහුව නවතාලීමය හැකියාවක් නොතිබුණි. නමුත් එය කිරීමේ දැන් උවමනාවක් තිබුණි.

"දැන් ඇති තේ වටේ ගියා. මං කැමති කෙලින් කතාවට"

තරුණයින් දෙදෙනාගේ කතා බහට හරස් කපමින් දිසානායක කියන්නට විය.

"තාත්තා, ආකශ්රා."

"ඔව් ඉතින්. දැන් කියන්න හදන්නේ ඔයා ආකශ්රා එක්ක සම්බන්දයක් තියනවා කියලා ද?"

"නෑ තාත්තා."

sinhalaebooks.com

තිදස් ට දැනුනේ පුදුමයකි. තාත්තා මේ කියවන දේවල් ගැන ඔහුගේ හිතේ එක්තරා ආකාරයේ ගැටලුවක් පැවතුනත් දැන් ඒ සියල්ල නිරාකරණය කර ගැනීමට වෙලාව යැයි ඔහු නොසිතුනි. නමුත් තාත්තා තමා ගැන සිටින්නේ වැරදි ආකල්පයකැයි ඔහුට සිතුන නිසාම ඒ ගැන කතා කර විසඳ ගැනීමේ දැඩි අවශ්‍යතාවයක් තිදස්ට තිබුණි.

"එතකොට දැන් මං මෙතෙන්ට එන්න කලින් සිද්ධ වුනු දේවල් මොනවාද පුතා. ඒ ගැන මොනවාද කියන්න තියෙන්නේ"

"ඒ කිව්වේ"

" ආකශරා එක්ක කිසිම සම්බන්දයක් නැත්නම් ඔයා ආකශරාව හුරතල් කරන්නේ ඇයි. නෑ බෑ කියලා බොරු විතරක් කියන්න එපා පුතා මං මේ අහන්නෙ මගෙ ඇස් වලින් දැකපු දේ"

තිදස්ට පුදුමයක් දැණිනි. මොහොතකට කලින් සිදු වූ සියල්ල තාත්තා දැක ඇති බව දැන් ඔහුට විශ්වාස ය. දිය යුතු උත්තරයක් සිතාගත නොහැකි නිසාම තිදස් , අකලංක දෙස බැලුවේය.
අකලංක හිස සොලවා කිසිවකුත් නොකියන ලෙස ඇඟවූවද දැන් බොහෝ දේ සිදු වූ හමාර යැයි තිදස්ට දැනුනේ තාත්තා ගේ අදහස් දැක්වීම සමඟය.

"තාත්තා. ඔව් බොරු කියන්න ඕනේ නෑ තමයි. ඒත් මෙතන තියෙන්නේ තාත්තා හිතන දේ නෙවෙයි. ඒක තාත්තා ට කියන එක හොඳයි කියලා හිතුනා."

"දැන් එතකොට ආකශරා ලමයා එක්ක ඔයාගෙ සම්බන්දයක් නෑ කියලා ද කියන්නේ."

"ඔව් තාත්තා."

"ඒකත් එහෙමද. හ්ම්... නෑ ඉතින් ඒ දරුවගේ ඇති වැරද්දකුත් නෑ. එහෙම එකක් නැත්නම් ඉතින් කමක් නෑ."

"තාත්තා ඒත්,,,

"ඇයි ඒත්. මොකක්ද ඒ පාර කියන්න හදන්නේ"

"අකලංක කැමති තාත්තා ආකශරා ට. අපි කතා කලේ ඒක"

නොසිදූ ලෙස තිදස්ගේ කටින් පිට වූ වචන පිලිබඳව විමතියට පත් අකංලක ඔහු දෙස බැලුවේ යමක් කියන්නට සූදනමිනි.

"තාත්තා ඒත්,,,

"ඇයි ඒත්. මොකක්ද ඒ පාර කියන්න හදන්නේ"

sinhalaebooks.com

"අකලංක කැමති තාත්තා ආකශර්‍රා ට. අපි කතා කලේ ඒක"

නොසිදූ ලෙස තිදස්ගේ කටින් පිට වූ වචන පිලිබඳව විමතියට පත් අකංලක ඔහු දෙස බැලුවේ යමක් කියන්නට සූදානමිනි.
එහෙත් අකලංකට පෙර දිසානායක මහතා ඉස්සර විය. ඔහුගේ මුවෙහි වෙනසක් නැතත් ඔහු ගේ ස්වරයේ යම් වෙනසක් ඇති වී තිබුණි. ඒ වෙනස ගැන අකලංක ට බියක් දැනුනත් ඒ කිසිවක් නොපෙන්වා ඔහුට සවන් දීමට පමණක් අකංලක සූදානම් විය.

" ආකශර්‍රා ගේ පැත්තෙත් ප්‍රශ්නයක් නැත්නම් අකලංක පුතාගේ තීරණයට බලපෑමක් කරන්න අවශ්‍යතාවයක් නෑ."

"තාත්තා"

"හරි ඉතින් දැන් ඕක ඔච්චර කියවන්න දෙයක් නැනෙ. කට්ටිය එක්ක කතා කරගෙන හොද දෙයක් කරන්න පුලුවන්."

තාත්තා කියද්දී අකලංක ට වඩා තිදස් ගේ හිතට සතුටක් දැනුණි. බොහෝ දෑ වසන් කරන්නට සිදු වූවත් අවසානයේ තාත්තා ගේ මුවින් ලද ඒ සුන්දර වදන් සමග තිදස් ට අකලංක ව තදින් වැලඳ ගැනීමට තරම් උවමනාවක් තිබුනත් ඊතැවට වඩා සතුට පිට කරන්නට නොගියේ සියල්ල හෙමින් සීරුවේ විසඳිය යුතු බැවිනි.

"මං යනවා නිදගන්න. දෛවය වෙනස් කරන්න අපිට බෑ පුතා"

මිස්ටර් දිසානායකගේ මුවින් පිට වූයේ එපමණකි. සත්‍ය වශයෙන් ම එය බොහෝ සෙයින් සාධාරණ කතාවක් බව තිදස්ටද දැණී තිබුනි. දෛවය ට අභියෝග කල හැක. නමුත් සමහර විටෙක ඒ දෛවය වෙනස් කිරීමට හැකියාවක් අපිට ඇත්තේම නැත.
ආකශර්‍රා ගේ අතීතය මේ විදිහටම වලලා දැමීමට තීරණය කල තරුණයින් දෙදෙනා අවසානයේ හිතට ලද ප්‍රීතිය සමග ඔවුන්ගේ කාමරයට පිටත් වූයේ සිනා මුසු මුහුණෙනි.

--------------------------------

රාත්‍රිය ගෙවීයත් ම තරුණීයන් දෙදෙනා කරා සැපවත් නින්දක් ලඟා වෙද්දී කවදවත් නැති සොඳුරු බවක් ඒ දවසේ නිමාව සමග දැනෙන්නට වූයේ සියල්ල යහපත් ලෙස විසඳී අවසන් වූ හෙයිනි.
පසුද උදෑසන දිසානායක දෙමහල්ලෝ ආපසු ගමනට සැරසෙද්දී කාටත් ප්‍රථම වෙද සීයා ඔවුන් වෙත දැඩි අවධානයක් යොමු කරන්නට විය.

"තිදස් පුතාගෙ වෙදකම් වලට තව දවස් කිහිපයක් මෙහෙ හිටියානම් හොඳටම ඇති වෙයි නේද වෙද මහත්තයෝ"

sinhalaebooks.com

"දැන් කොළුවට සෑහෙන්න සනීපයි නේ. ඒ හින්ද තව දවස් හතරක් හිටියා නම් හොඳටම ඇති ඕන්න"

"මට පණිවිඩයක් දෙන්න පුතා ඔයා. මං එන්නම් ඔයාලව එක්කගෙන යන්න"

පිටත් වීමට මොහොතකට පෙර තිදස් ගේ පියා ඔහු දෙස බලා කියා සිටියේ සුපුරුදු ලෙන්ගතු කමිනි. ඔහුගේ වචන වලට වඩා ඔහුගේ දෑස් වලින් ඒ ලෙන්ගතු කම හරි අපූරුවට තිදස් ට දැණිනි.

"ඔක්කොම වැඩ දාලා ඔයා ආයෙ මෙහෙ එන්න ඕනෙ නැහැ තාත්තා. මට යන්න පුළුවන් වුන දවසට මං මගේ යාලුවෙක්ට කෝල් එකක් දෙන්නම් අපේ වාහනය අරගෙන එන්න කියලා. ඔයා ඒක ගැන හිතලා අමුතුවෙන් ඒකටම කාලේ වෙන් කරන්න ඕන නෑ නෙ එතකොට. "

තිදස් ඔහුගේ අදහස පවසද්දී දිසානායක මහතා ඔලුව සෙලෙව්වේ ඒ අදහසට කැමැත්තක් දක්වමිනි.
අවසානයේ ඒ සියලු කතා බහා අවසන් කර යන්නට සූදානම් වෙද්දී ආයෙම මතක් වූ යමක් හේතුවෙන් දිසානායක මහතා ආපසු හැරුනේය.

"පුතා. ඔන්න අනිවායර්යෙන් ආකශ්රා ලමයාව එක්කගෙන එන්න ඕනෙ. මං ගිහින් ඒ ලමයගෙ අධ්‍යාපනය වැඩ වලට ඕනි දේවල් බලන්නම්කෝ"

"හා තාත්තා ඒත්...."

තිදස් වෙද සීයා දෙස බැලුවේ තරමක ප්‍රශ්නාථර්යක්ද සමගනි.

"අහ්. ඒවා හරි. වෙද සීයා කැමති වෙලා ඉවරයි. මේ පැත්තේ ඔක්කෝම මං ලස්සනට විසඳුවා."

"හා තාත්තේ."

තිදස් පියාගෙ වචනයට ගරු කර අවසානයේ ඔවුන්ට සමු දුන් තිදස් හා අකලංක වෙද නිවස තුලට පැමිණියේ හිතේ සැහැල්ලුවෙනි. මෙතරම් ඉක්මනින් මේ සියල්ල යහපත් අයුරින් විසඳේ යැයි අකලංක හෝ තිදස් නොසිතුවේ එක පිට එක කරදර බොහෝමයක් පැමිණි නිසාවෙනි. නමුත් ඒ සියල්ල දැන් විසඳී අවසානය. ඒ නිසාම හිතට සැහැල්ලුවක් ලැබෙන බව තරුණයින් දෙදෙනාම දන්නා කරුණකි.

"මහත්තයා ඔයා මේ කරන දේවල් කරන්නෙ හොඳ සිහියෙන් කියලා විශ්වාසද?. "

"ඇයි දේදුනු එහෙම අහන්නේ. මං වැරද්දක් කලාද. මං කිසිම වැරදි දෙයක් කරලා නෑ ඒක මට හොඳටම විශ්වාසයි."

sinhalaebooks.com

රියදුරු අසුනේ සිටින දිසානායක මහතා දෙස බලමින් මහත්මිය කියන්නට වූයේ තරමක නෝක්කාඩුවෙනි. මුල සිටම ඇය ආකශ්රා ගැන අන් අය දක්වන ඇල්ම ගැන පැහැදීමක් නොවූනාය. නමුත් ආකශ්රා දෙස බලන වාරයක් ගානේ ඇයට අමුත්තක් දැණුන බව ඇය කාටත් නොකියා සඟවා ගත් රහසකි. ඒ ආගන්තුක හැඟීම නිසාම දේදුනු , ආකශ්රා ව මග හැර සිටින්නට සැම විටම උත්සාහ කලාය.

"ඔයාට පිස්සු මහත්තයා. පුතත් හැදෙන්නේ ඔයාගෙ දේවල් දිහා බලලා. අර කෙල්ලට පුදුම ආදරයක් නේ තියෙන්නේ තාත්තාගෙයි පුතාගෙයි."

"ඔයා වෙද ගෙදර ට ගිය දවසෙ ඉදලා ඒ දැරිවි දිහා අමනාපයෙන් බැලුවා මිසක් මූණ දිහා බලලා කතා කරලා තියනවා ද දේදුනු. එහෙම නැතේ"

"මොනවටද එයාගෙ මූණ දිහා බලලා මං කතා කරන්නේ"

"ඒක තමා කියන්නෙ. කවදාවත් ඔයා එහෙම කරලා නෑ. එහෙම කලා නම් ඔයාටම තේරෙනවා ආකශ්රා කියන්නෙ කොච්චර හොඳ කෙල්ලෙක් ද කියලා.. අනික මට නම් දැනෙන්නෙ ඒ දරුවා මගේම දරුවෙක් වගේ දේදුනු "

"ඔයාට නම් පිස්සු හැදිලා මහත්තයෝ. දැක්කානේ ඒ කෙල්ලව ගෙදර අරන් ගිහින් උගන්වන්න තාත්තා එක්ක පුතත් නටපු නැටිත්ත"

දේදුනු කියවගෙන යද්දි ඒ සියල්ල සම සිතින් විඳ දරගත් දිසානායක මහතා සුන්දර සිනහවකින් පමණක් දේදුනු ට සංග්‍රහ කර ඉවසීමෙන් රිය පදවන්නට වූයේ ඒ වන විටත් ඔවුන් ප්‍රධාන මාගර්යට පිවිස සිටි නිසාවෙනි.
දිසානායක මහතාගේ නිහඬ බව සමග දේදුනු ද නිහඬ විය.

------------------------------

ඔවුන් දෙදෙනාගේ පිටව යෑමෙන් අනතුරුව සුපුරුදු රටාවට වැඩ කටයුතු ආරම්භ කල වෙද ගෙදර සියල්ලෝද එකිනෙකා සමග සියලු කටයුතු සිදු කරද්දී තිදස් , ආකශ්රා සමග කතා බහක පැටළුනේ ඔහුට බෙහෙත් කිරීමට ඇය පැමිණි මොහොතකය.

"මගෙ නංගී"

තිදස් ආදරණීයව කිව්වේ දිලිසෙන ඇයගේ වත දෙස බලමිණි. දැන් ඔවුන් තුල සහෝදර ප්‍රේමය අපූරුවට දළු ලා වැඩෙන්නට පටන් ගෙන තිබුණි.

"අයියෙ ඔයා පරිස්සම් වෙනවා නම් හොඳටම මදි. ආයෙම ඔලුව අමාරුව වැඩි වුනොත් ඔන්න වෙද සීයා ඔයාට තමා බනින්නේ"

sinhalaebooks.com

"එහෙම වෙන්නෑ සුද්දී"

"දැන් ඉතින් මට වැඩි අයිතිවාසිකමක් තියන හින්ද සැරෙන් කියලා හරි ඔයාව පරිස්සම් කරන්න වෙනවා අයියේ. කියන දේ අහන්න ඕනි. එච්චරයි"

ඒ හඬ තුල වූ ආදරණීය ආමන්ත්‍රණය තිදස්ගේ හදවතටම දැනෙන්නට විය. කිසිදක නොලද සහෝදර සෙනෙහසක් ඔහුගේ හිතට ආගන්තුක වුවත් ඒ ආගන්තුක බව ඔහුට දැනුනේ පුදුමාකාර ආදරයක් ලෙසටය.
තිදස් වෙනුවෙන් වෙන් වූ වෙද ගෙදර කුටිය තුල සිටියේ තිදස් හා ආකශ්රා පමණක්ම වූ අතර අකලංක ගේ සේයාව දශර්නය නොවීමද සුද්දීගෙ හිතට විඩාවක් ගෙන දුන්නේය..

"ඇස් කරකවන්නෙ කාව හොයන්නද"

ආකශ්රා ගේ හැසිරීම තේරුම් ගත් තිදස් කිව්වේ ඇය දෙස බලමිනි.

"මොකුත් නෑ"

"ඇයි මට බොරු කියන්නෙ නංගී. ඔය ඇස් කියනවා හොයන්නෙ කාවද කියලා. අකලංක පොඩ්ඩක් එලියට ගියා. මෙන්න මෙහෙත් වාඩි වෙන්නකො මගෙ නංගී"

තිදස් ඇයව ඔහු අසලින් වාඩි කරවා ගත්තේය.

"ඇයි අයියෙ "

"ඇත්ත කියන්න සුද්දී. මගෙ නංගී අකලංක ට ඇත්තටම ආදරෙයි නේද. ඔය ඇස් හොයන්නෙ එයාව නේද "

"අයියේ"

"මං ප්‍රශ්නයක් ඇහුවේ. උත්තරයක් විතරයි මට ඕනේ"

තිදස් කියද්දි ආකශ්රා ගේ හිස බිමට පහත් විය. ඇයගේ හිතට දැනුනේ අමුතු සිතුවිල්ලකි. ඇත්තටම ඇය සෙව්වේ අකලංක ගේ රුව බව ඇයටම විශ්වාසය.
නමුත් ඒ සියල්ල තිදස්ට පවසන්නට තරම් ඇයට ශක්තියක් නොවීය.

"ආකශ්රා"

තිදස්ගේ නැවත ඇමතුම එක්ක තිගැස්සී ගිය ආකශ්රා බිම බලාගත් ගමන් ම හිස සෙලවූයේ තිදස් කියූ දෙය අනුමත කරන්නට මෙනි.

sinhalaebooks.com

"ඇත්ත කියන්න සුද්දී. මගෙ නංගී අකලංක ට ඇත්තටම ආදරෙයි නේද. ඔය ඇස් හොයන්නෙ එයාව නේද "

"අයියේ"

"මං ප්‍රශ්නයක් ඇහුවේ. උත්තරයක් විතරයි මට ඕනේ"

තිදස් කියද්දි ආකශර්‍රා ගේ හිස බිමට පහත් විය. ඇයගේ හිතට දැනුනේ අමුතු සිතුවිල්ලකි. ඇත්තටම ඇය සෙව්වේ අකලංක ගේ රුව බව ඇයටම විශ්වාසය.
නමුත් ඒ සියල්ල තිදස්ට පවසන්නට තරම් ඇයට ශක්තියක් නොවීය.

"ආකශර්‍රා"

තිදස්ගේ නැවත ඇමතුම එක්ක තිගැස්සී ගිය ආකශර්‍රා බිම බලාගත් ගමන් ම හිස සෙලවූයේ තිදස් කියූ දෙය අනුමත කරන්නට මෙනි.

"මං දන්නවා මගේ නංගී අකලංක ට ආදරෙයි කියන්න. හැමදේම හරි ලස්සනට විසඳෙයි. ඔයාට මං ඉන්නවා නේ. බය වෙන්න එපා ඔයාගෙ හීන වලට,බලාපොරොත්තු වලට අඩුවක් වෙන්න මං ඉඩ තියන්නේ නෑ"

තිදස් කියවගෙන ගියේ බැරෑරුම් ස්වරූපයෙනි. කිසිඳු නොලත් සහෝදර ප්‍රේමයක අපූර්වත්වය ආකශර්‍රා වෙතින් තිදස් බලාපොරොත්තු වෙද්දී යුතුකම් වගකීම් යන්නද හිතෙහි රඳවාගනිමින් කතා කරන්නට උත්සහ කලේ අකලංක ගැනද මෙනෙහි කරමිනි.

"මචං"

තිදස් හා ආකශර්‍රා ගේ කතාවට බාධා කරමින් එක් වරම ඇසුනු හඬට ඔවුන් දෙදෙනාම හැරී බැලුවේ ඒ හඬ බොහෝම සමීප බැවිනි. තිදස්ට වඩා ආකශර්‍රා ගේ හිත ගැස්සී යද්දී ඇය වත බිමට හරවා ගත්තේ ලැජ්ජාවෙනි.

"අහ් උඹත් ආවද. ඇහුනෙ එහෙම නැද්ද සුද්දී කියපු දේවල්"

ආකශර්‍රා ගේ ලැජ්ජාව දෙගුණ තෙගුණ කරමින් තිදස් කතා කරද්දී අකලංක ද මුවග පුංචි සිනහවකින් සරසා ගත්තේ ඔවුන් දෙදෙනා අතර වූ කතා බහා සැබවින්ම ම අකංලක ගේ කන වැකුනු නිසාවෙනි. ඒ සිනහව තුලින් බොහෝ දේ තේරුම් ගත් තිදස් ආකශර්‍රා ගේ හැසිරීමට ප්‍රතිචාර දක්වන්නට උත්සහ ගත්තේ මේ මොහොතේ ඔහු ක්‍රියාත්මක වීම අත්‍යාවශ්‍ය නිසාවෙනි.

"ඔන්න.අපේ කැලෑ මල සිදදියේ කොල්ලට මනාපයි ලු."

sinhalaebooks.com

තිදස්ගේ වචන එක්ක ආකශරා ගේ මුව තවත් රක්ත පැහැ ගැන්විණ. නමුත් අපහසුවෙන් වුවත් ආකශරා හිස ඔසවා තිදස් දෙස බැලුවේ මේ කතාව නවතන ලෙස හිසෙන් සලකුණු කරමිනි.

"තිදස් මේ.. මොකක්ද ඔයා මේ කියන්නේ. මේ... මේ..."

" හරි මං එලියට වෙලා ඉන්නම්. දෙන්නා කතා කරගෙන එන්නකෝ"

ආකශරා ගේ බෙහෙත් සාත්තුවෙන් පසු තිදස් කාමරයෙන් පිටව ගියේ අකලංක හා ආකශරා කාමරයේ තනි කරමිනි. මෙතරම් කාලයක් ඇයගේ මුවින් පිට නොකල ප්‍රේමය අකලංක ඉදිරියේ එලියට ගැනීම ඔහුගේ එකම අරමුණ විය.
කිසිදු නොලත් ප්‍රේමයක් ගැන සිතීමට පවා බිය වූ ආකශරාගේ හිතේ එක්වරම අකලංක ගැන ප්‍රේමයක් හට ගැනීමම ඇයටත් පුදුමයක් වුවත් ඒ ප්‍රේමය යටපත් කරගෙන සිටීමට නොහැකියාව නිසා ඇය සියල්ල කියා දැමුවේ තිදස් දැන් ඇයගේම සහෝදරයා බැවිනි. නමුත් ඒ කිසිවක් අකලංක ඉදිරියේ කියා සිටීමට තරම් ශක්තියක් ඇයට නොවීය.
එහෙත් දැන් එයට කාලය එලඹීම ඇයගේ හිතට එක් කලේ අමුතු හැඟීමකි.

"සුද්දී...."

නිහැඬියාව අතරින් අකලංක ඔහුගේ හඬ අවදි කලේය.

"ම්ම්ම්...."

ඇයගේ පිළිතුරු කෙටි විය.

"මට ඇහුන ඒ දේවල් ඇත්තක්ද

"හ්ම්ම්ම්...."

අකලංක කෙතරම් උත්සාහ කලත් ආකශරාගේ මුවින් එතනින් එහාට වචනයක් ගැනීමට අසීරු විය. ඇය තුල වූ ලැජ්ජාව එයට හේතුව බව හොඳ හැටි තේරුම් ගිය නිසාම අකලංක මදක් නිහඬව ආකශරා දෙස බලන්නට වූයේ පුදුමාකාර ආදරයකිනි.

උදෑසන සුපිපිණු මලක් බඳු වූ මුව මදක් ලැජ්ජාවෙන් ඇඹරී ගොස් ඇති බව අකලංක ටද දැණිනි. නමුත් මේ මොහොතේ ඇයගෙන් පිළිතුරක් ලබා ගැනීමේ ලොකු උවමනාවක් ඔහුට තිබුණි.
රක්ත පැහැ ගැන්වුනු වත දෙස බලා මොහොතක් නිහඬව සිටි ඔහු ඇයගේ නිකටින් ඔසවා එක එල්ලේ ඇය දෙස බැලුවේ අසීමාන්තික ප්‍රේමයෙනි.

"කියන්න බැරිද දැන්වත්. ඇත්තටම මට ආදරෙයි ද කියලා"

sinhalaebooks.com

ආගන්තුක හැඟීමක් ආකශ්රා ගේ හදවත පුරා දුවද්දී ඒ හැඟීමට යටපත් වීමට ඉඩක් නොදී හදවත වටා බැඳි බැම් කඩා ඉහිරවා දමා අකලංක වෙනුවෙන් උපන් ප්‍රේමයට එළියට ඒමට ඉඩ දෙන්නට උත්සහ කලේ තාරුණ්‍යයේ හැඟීම් උතුරා යන නිසාවෙනි. මෙපමණ කාලයකට පිරිමියෙක් වෙනුවෙන් සසල නොවූ අවිහිංසක හදවත එක්තරා පිරිමි ආත්මයක් වෙනුවෙන් නොසිතූ ලෙස සසල වෙද්දී ආකශ්රා ට දැනුනේ වචන පවා ගොළු වෙන ස්වරූපයකි.

"මං ආදරෙයි"

ඇයගේ මුවින් පිට වූයේ එපමණකි. නමුත් ඒ වචන දෙක තුල අසීමාන්තික සෙනෙහසක් ගැබ්ව තිබෙන බව අකලංක ට තේරුම් ගියේය.
ඒ සමගම ආකශ්රා ව ඔහු ළඟට ගත් අකලංක ඇයගේ නලලත කුළුදුල් හාදුව සටහන් කලේ හිත් බැඳි ප්‍රේමයෙනි.

---------------------------------

" දැන්වත් හරිද දෙවියනේ කියලා හිතේ තිබුණ ප්‍රශ්නේ"

ආකශ්රාගේ පිටව යෑමෙන් පසු වෙද ගෙදර මිදුලට සේන්දු වූ අකලංක ගේ උරහිස මතින් අත දමමින් තිදස් ඇසුවේ හිනහවක් ද මුවේ රඳවා ගනිමිනි. ඔහුගේ ඒ ආමන්ත්‍රණය සමග හිතට දැනුනු ලැජ්ජාවෙන් ඉවත බලාගත් අකලංක අසීරුවෙන් වුවත් ඒ හැඟීම් යටපත් කර ගනිමින් වචන පිට කරන්නට උත්සහ ගත්තේය.

" අපි යද්දී කෙල්ලවත් එක්කගෙන යන්න පුලුවන් වෙයි නේද බන්"

"ඒ මගෙ නංගි කොල්ලෝ. අනිවායර්යෙන් මං ඒකිව එක්කගෙන යන්නෙ. හැබැයි මං උඹට මගෙ නංගිව දුන්නා වගේ නෙවෙයි පරිස්සම් කරන්න ඕනේ හරිද"

"අනිවාර්යෙන් තිදසා. උඹ මං ගැන දන්නවා නේ බන්."

"දන්න හින්ද තමයි මේ දේවල් මේ විදිහට වෙන්න මං ඉඩ දුන්නෙත්"

අඩුවක් නැති මිත්‍ර ප්‍රේමයෙන් දෙදෙනා සංවාදයේ යෙදෙන්නට වුණි.

ප්‍රේමය යනු කුමක්දැයි අකලංක ටද තාම අත්දැකීම් නොමැති බව සැබෑවකි. කිසිද නොලත් ප්‍රේමයක වත්මන් අයිතිය ඔහුට හිමි වීම ගැන ඔහු සතුටු වූයේ අන් කිසිවකටත් වඩා ආකශ්රා තුල වූ ගති ගුණත්, ඇයගේ අමුතුම සුන්දරත්වයත් නිසාවෙනි.

හිතාගන්න බැරි ආදරේ එක්ක හරි අපූරුවට හසුරවපු වචන,
තනි හිතේ අස්සක් මුල්ලක් නැර උඩු දුවද්දි
ඇත්තටම මට හිතුනා උඹේ උණුහුමේ නවතින්න.

sinhalaebooks.com

පුදුමයි ඒක,
ඒත් ඇත්තක්.

අහඹු හමුවීමක
සදාතනික නැවතුමක්.

ආදරණීය වචන එක්ක
සෙනෙහෙබර ප්‍රේමයක්.

දඩබ්බර පිරිමි පපුවක
ආදරණීය උණුහුමක්

මං උඹේම වෙන්න පතන
ආත්මීය ප්‍රාථර්තාවක්

ඔව්,
උඹේ වචන තනිකරම ඉනාවක්. හිතාගන්න බැරි තරමට ඒ වචන අස්සේ උඹ මාව අතරමං කරන්නේ කොහොමද කියන එක අදටත් මට ප්‍රශ්නයක්.
ආත්මයම සුවපත් කරන උඹේ ආදරේ මට මහමෙරක්...
මේ මං උඹේ වෙන්න පතන එකම එක පැතුමක්...

ඉතින් ඒ කොහොම වුනත්,
මං ආදරෙයි උඹට
ඒක උඹත් දන්න රහසක්.

"තනියම මොනවාද කල්පනා කරන්නේ"

ආකශ්රාගේ ගේ ලොවේ තනිවූ අකලංකගේ දෑහැන බිඳිමින් තිදස් ඇසුවේ තරමක සිනහවක් ද සමගිනි.

"මොකුත් නෑ බන්."

ලැජ්ජාවක් ද දැනුනු නිසාම අකලංක බිම බලාගත්තේ තිදස්ගෙන් යමක් වසන් කිරීමේ අදහසිනි.

"උඹ මේ මටත් කොලේ වහනවද ඒ පාර අහ්. දැන් ඉතින් ඔලුවෙ වැඩ කරන්නෙ සුද්දී නේ. ඔහොම තමා මගෙ මස්සිනේ ලව් සික් ඔලුවට ගහපුවාම"

sinhalaebooks.com

"අනේ බන්..."

"ලැජ්ජා වෙන්න දෙයක් නෑ. ඔහොම දේවල් සාමාන්‍යයයි"

නැවත නැවතත් අකලංක ව අවුස්සන්නට වූ ආසාව නිසාම නිදස් කියන්නට වූයේ කිසිඳු අඩු නොවුනු සහෝදර සෙනෙහස ද හිතේ රඳවා ගනිමිනි.

( දින කිහිපයකට පසු )

" කෙල්ලගේ අනාගතය වෙනුවෙන් මෙහෙම තීරණයක් ගත්තා මිසක් මං තුන් හිතකින් වත් මෙහෙම දෙයක් කරන්න වෙයි කියලා නම් මං හිතුවේ නෑ දරුවෝ"

නිදස්ගේ දෑත තදින් අල්වා ගත්තා ගමන් වෙද සීයා කිව්වේ ලාවට ඇස් අගට ඉනූ කඳුළු ද කාටත් හොරා පිස දමමිනි. කිසිදක ප්‍රියයන්ගෙන් වෙන් නොවූ ආකශ්රා අද ගමටම සමුදීම ගැන නැදෑයින්ගේ මෙන් ම වෙදගෙදරට පැමිණී සියල්ලන්ගේද ඇස් කඳුළින් තෙත් කරන්නට සමත් විය. ඒ තරම් ලබැඳියාවක් ආකශ්රා තුල සියල්ලන් කෙරෙහි තිබිණි.

" ගමේ පිපුණට උඹ ගමට අයිති මලක් නෙවෙයි නේ මැණිකේ"

කමතී සිතන්නට වූයේ යථාර්ථය නැවත නැවතත් සිහි ගන්වමිනි. නමුදු ඇයගේ ලේ, මස්, නහර, ඇට, ඇට මිදුළු දක්වාම විසිරුණු ආකශ්රා ගැන වූ ප්‍රේමය කිසිදක නොබිඳෙන්නක් බව ඇය හොඳ හැටි දැනගෙන සිටියාය.

"ආකශ්රාව පරිස්සම් කරනවා. ඒ ගැන බය වෙන්න එපා"

නිදස් සුපුරුදු වූ දැඩි ස්වරයෙන් කියන්නට වූයේ ඒ තරම් ඇය ගැන වගකීමක් ද දරමිණි. සියල්ලන්ගේම හිත් වල සෙනෙහසට තාවකාලික සමුදීමක් සටහන් කරමින් ආකශ්රා නිදස්ගේ මිතුරා රැගෙන පැමිණී මෝටර් රථයේ ඉදිරිපස අසුනේ අසුන් ගත්තේ සිදදියේ ගමනට සියල්ල සූදනම් කරගනිමිනි.
හිතට දැනෙන වේදනාව මෙතෙකැයි කියා නිම කරන්නට නොහැකි තරමට ආකශ්රා ගේ හිත තදින් ගැහෙන්නට විය. නමුත් දැන් ආපසු හැරීමට වේලාව නොවන බැවින් දෙනෙතින් වැටෙන කඳුලු අත්ලෙන් පිස ද ඉදිරිපසට හැරුනි.
රියදුරු අසුනේ වාඩි වූ නිදස් සුක්කානම ඔහු අතට ගන්නට තීරණය කලේ වැඩි ආරක්ෂාව සඳහා ය. පිටු පස අසුනේ අකලංක හා අනෙක් මිතුරා අසුන් ගද්දී සියලු සමුදීම් අවසානයේ මෝටර් රථය පණ ගැන්වූයේ සැඳෑ කළුවරට පෙර නිවස බලා යෑම අත්‍යවශ්‍ය නිසාවෙනි.

" දුකයිද ගම දලා යන්න"

වෙද ගෙදර පෙනෙන නොපෙනෙන සීමාව තෙක් ඒ දෙසම බලා හුන් ආකශ්රා දෙස හැරී නිදස් කියන්නට වූයේ ආකශ්රා කොහොමත් ගමට ලැදියාවක් දක්වන බව ඔහු දන්නා

sinhalaebooks.com

නිසාවෙනි. ඇයට නගරය නුහුරු බව ඔහුද දන්නා කාරණයක් වුවත් දැන් ඒ නගරයට ඇය හුරු විය යුතු බව තිදස් තරයේ විශ්වාස කලේය.

"දුක වුනත් මං ඒ දේට හුරු වෙන්නම ඕනෙ නෙ අයියේ"

"එහෙනම් ඉතින් යමු"

වෙද ගෙදර සීමාවෙන් එපිටට පැමිණි මෝටර් රථය මදකට නවතා ඔවුහු කතා බයෙහි යෙදුනත් ආකශ්රා තාමත් සිටින්නේ වෙද නිවසේ මතකයන් අතර බව තිදස්ට මෙන්ම අකලංක ටද මැනවින් තේරුම් යන්නට වූයේ ඇයගේ වෙව්ලන වචන හැසිරවීමත් සමඟිනි.

"තිදස්"

මෙතෙක් වේලාවක් නිහඬව හුන් අකලංක එක්වරම කතා කරන්නට පටන් ගද්දී ඉදිරිපස අසුන් වල සිටි තිදස් හා ආකශ්රා ඒ දිහාවට හැරුනේ ඔහුගේ අදහස දැන ගැනීමේ අරමුණද සමඟිනි.

"උඹ මොකක්ද කියන්න හදන්නේ. දැන් ම කෙල්ලව මැරි කරන්න වත් අදහසක් තියනවා කියලා ද. මේ උඹ මගෙ යාළුවා වුනාට කමක් නෑ මස්සිනේ. මගෙ කෙල්ල තාම පොඩි එකී.
"

"එහෙම එකක් නෙවෙයි තිදස්. ආකශ්රා තාම වෙද ගෙදර දාලා යන්න තරම් හිත ශක්තිමත් කරගෙන නෑ. ඒ හින්ද අපි එයාට තව ටික කාලයක් දෙමුද"

හදවතට එකඟව ගත් තීරණයක් නොවුනත් ආකශ්රා වෙනුවෙන් අකලංක කියන්නට වූයේ තිදස්වත් පුදුමයට පත් කරමිනි.
ප්‍රේමය වූ කලී පරිත්‍යාගයකි. අනෙකාගෙ සතුට වෙනුවෙන් තමාට කල හැකි උපරිම කිරීමට උත්සාහ දැරීම ප්‍රේමයේ එක කොටසකි. අකලංකටද එය එසේ සිතෙන්නට විය. ඒ නිසාම ඔහු ආකශ්රා වෙනුවෙන් එම තීරණය ගත්තේ ඇයව තව ටික කලක් වෙද ගෙදර රැඳවිය යුතු යැයි සිතුනු බැවිනි.

"උඹ හොද සිහියෙන් ද මේ කතා කරන්නේ අකලංක"

ආකශ්රා නිශ්ශබ්ද වුවත් තිදස් හා අකලංක අතර සංවාදය දිගින් දිගටම පැවතෙන්නට විය.

"ඔව් බන්. ආකශ්රා අලුත් ජීවිතේට තව ටිකක් හුරු වුනාවේ. අපි ගිහින් එහෙ දේවල් ඔක්කෝම පිලිවලක් කරමු. ගෙවල් එක්ක කතා කරලා ඇවිත් සදහටම කෙල්ලව කැන්දගෙන යමු. මූණෙත් පේනවා වෙද ගෙදර ඉන්න ඕනි කියලා "

sinhalaebooks.com

මෝටර් රථයේ ඉදිපස කණ්ණාඩියෙන් පෙනෙන ආකශ්රා ගේ මුව දෙස බලමින් අකලංක කියන්නට විය.

ඒ මුව සෑහෙන්න මළානිකය. ඒ වෙන්වීමේ දුක බව අකලංක ට හොද ටම පැහැදිලි ය. ඒ වේදනාව අස්සෙන් ඔහුගේ සතුට සොයන්නට ඔහුට සිත් නොවීය. ඒ නිසාම ඔහු එම තීරණය ගත්තේය. ඒ ඇය තව කාලයකට මේ ගමේ රඳවා තැබීමටය.

"තිදස්, මං දන්නවා උඹට තමා මේ කෙල්ලගෙ අයිතිය කියන්න. ඒත් බන් මං මේ කියන්නෙ අපි අපේ සතුට ගැන විතරක් හිතන එක වැරදී කියලා විතරයි.සුද්දී ව එහෙ එක්කගෙන යන්න මං තමා ගොඩක් ම උවමනාවෙන් හිටියෙ. ඒත් මේ කෙල්ලගෙ මේ මූණෙන් පේන දුක එක්ක කොහොමද එහෙම කරන්න හිත හදාගන්නෙ. මොනවා වුනත් මේ එයා හැදුණු පරිසරය නේ. "

වෙනස් වෙමින් තිබූ තිදස්ගේ මුහුණ දෙස දීඝර් වේලාවක් බලාසිටි අකලංක කීවේ යම්තාක් දුරකට හෝ ඔහුව අස්වසාලීමේ අරමුණිනි.

"උඹට හොදයි කියලා හිතෙන දෙයක් කරමු. කොහොමත් ඉතින් අපිට ඕන වෙලාවක ඇවිත් ආකශ්රා ව බලලා යන්න තහනමක් නැනෙ. අනික ඉතින් කොහොමත් උඹ ගෙදරත් එක්ක කතා කරලා මේ වැඩ පිලිවලක් කලාම මගේ අහිංසකී එහෙට කැන්දගෙන යන්නම වෙනවා නේ."

"ඒක හරි. මේ ඔක්කෝම හදිස්සියට වුනු දේවල් නේ. ඒ හින්ද ආකශ්රා මෙහෙම මානසිකත්වයකින් ඉන්න ඇත්තේ. එයා වුනත් යන්න කොච්චර ආසා කලත් යද්දී තමා ඒ අමාරුව හොඳටම දැනෙන්නේ"

"ඔව්. මං ගොඩක් ආසාවෙන් තමා එහෙ යන්න හිටියෙ ඒත් දැන් වෙද ගෙදර දලා යන්න ටිකක් අමාරුයි වගේ. තව චුට්ටක් කල් ගෙදර ඉන්නම හිතෙනවා."

තරුණයින් දෙදෙනාගෙ කතාව මැද්දෙන් කටහඩ අවදි කල ආකශ්රා දුක මිශ්‍ර වූ ස්වරයකින් කියන්නට වූයේ සත්තකින් ම තාමත් හිත නොසන්සුන් බැවිනි.

"හරි කෙල්ලේ. බය වෙන්න එපා. මෙහෙම නෙවෙයි උඹව වැදගත් විදිහට කැන්දගෙන යන්න අපි එන්නම්කෝ නේද අකලංකයා"

"ඔව් බන්. කෙල්ලව අපි එක්කගෙන යනවට වඩා අම්මලාව මෙහෙ එක්කගෙන ඇවිත් කතා කරගෙන ම එහෙ කැන්දගෙන යන එක සෑහෙන්න වටිනවා කියලා මටත් හිතෙනවා"

"උඹ කියන එකක් තමා ඉතින් මස්සිනේ"

තිදස් මුවේ සිනහවක් රඳවා ගනිමින් කියන්නට විය. සිත ඇත්තේ දෙගෙඩියාවෙනි. නමුත් සුද්දී ගේ සතුට වෙනුවෙන් සියල්ල යටපත් කරගන්නට ඔහුට සිදු විය. ඇය තාමත් ඇත්තේ

sinhalaebooks.com

වෙද ගෙදර සිහියෙනි. ඒ බව ඇයගේ මුවේ අපූරුවට සටහන් වී තිබුණි. ඒ නිසාම ඔහුද අකලංක ට එකග විය.

"මම තව ටික දවසක් ගෙදර ඉන්නවා එහෙනම්"

වාහනයෙන් බසිමින් ආකශ්රා කීවාය.

ඒ සමගම වාහනයෙන් බැසගත් තිදස් හා අකලංක ද ඇය දෙස ආදරණීය බැල්මක් හෙළුවේය.

මේ ඇයගේ සතුටය. එය ඇයගෙන් උදුරගැනීම අසාධාරණයක් සේ ඔවුනට සිතුනේය. ඇය නගරයට උරුම වූවත් තව එයට බොහෝ කාලය ඇතැයි ඔවුන් දෙදෙනාටම සිතෙන්නට විය. ඒ නිසාම සුද්දී ව තව ටික කාලයක් වෙද ගෙදර නතර කිරීමට දෙදෙනාම ඒකමතිකව තීරණය කරන ලදී.

"තාත්තාට මොකක්ද කියන්නේ අයියේ"

සුද්දී ඇසුවේ තිදස් දෙස බලමිනි

"එයාලා තේරුම් ගනී මැණික."

"ඒත්..."

"මං ඉන්නවා නෙ. බය නොවී ඉන්න. එහෙ දේවල් මං බලාගන්නම්. අපි එනකල් පරිස්සමින් ඉන්න ඔය හිටියා වගේ"

තිදස් කිව්වේ ආකශ්රා ව තුරුල් කරගනිමිනි.

"අකලංකයා"

තිදස් ඔහු දෙසට හැරෙද්දී අකලංක ඔහුගේ දෑහැනෙන් මිදෙන්නට උත්සහ කලේ සුද්දී ව දමා යෑම ගැන ඔහුට සියුම් වේදනාවක් ද දැනුනු බැවිනි.
තිදස්ගේ ආමන්ත්‍රණය සමග ආකශ්රා අසලට පැමිණි ඔහු ආකශ්රා ගේ හිස සෙමින් පිරි මදින්නට වූයේ හිතේ උතුරන ප්‍රේමය ද සමගිනි.

"ඉක්මනින් එන්නම්. ගෙදර අය එක්කම. පරිස්සමින් ඉන්න"

තිදස්ගෙන් මිදුනු ආකශ්රා ව තම ලයට තුරුළු කර ගනිමින් අකලංක කීවේය.
තුහුරු පිරිමි උණුසුමක් වුවත් ඒ දැනෙන හැඟීම එක්ක හිතට දැනෙන්නට වූ ප්‍රේමය නිසාවෙන් තව තවත් ඔහුගේ උණුසුමට ආකශ්රා තුරුළු වෙමින් හිස ඔසවා අකලංක ගේ මුහුණ දෙසද බැලුවාය.

sinhalaebooks.com

"ඇයි මේ"

"එහෙ ගියාම වෙනස් වෙන එකක් නෑ නේද"

"පිස්සුද මගෙ කෙල්ලේ. ඉක්මනින් එනවා උඹව කැන්දගෙන යන්න. අම්මලා එක්කම"

ඇයගේ හිස අත ගා ඔහු කිව්වේ දයාබර ප්‍රේමයෙනි.

ඒ සමඟම ඔවුනට සමු දුන් ආකශ්‍රා එතැනින් ඈත් වී ආයෙම වෙද ගෙදර දිහාවට පිය මනින්නට වූයේ ප්‍රේමය සමඟ දහසක් බලාපොරොත්තු හිතේ සටහන් කර ගනිමිනි.

කුඩා කල සිට හැදුනු වැඩුනු
කුඩා කල සිට රැකවරණය ලැබුණු
ආකශ්‍රා ගේ ජීවිතය බඳු වූ
ඇයගේ පිය සටහන් වලින් හැඩ වුනු

වෙද ගෙදරට දැන්ම සමුදෙන්නට ඇය සූදානම් නොවුනු නිසා යන්න ගිය ගමනට ටික කාලයකට ඉඩ දෙමින් ආකශ්‍රා නැවතත් ආදරණීය වෙද ගෙදර දිහාවට ඇදෙද්දී ඇය දෙස බලා උන් තරුණයින් දෙදෙනා ඇයගේ ඡායාව නොපෙනී යන තුරුම ඒ දෙස බලා ඉන්නට විය.

"මචං අපි යමු"

ටික වේලාවකින් තිදස් කිව්වේ අකලංක ගේ උරහිසට තට්ටුවක් දමමිනි.

"හ්ම් යමු. ආයෙ ඉක්මනින් එමු"

ඔවුහු මෝටර් රථයට ගොඩ වූහ.

"මං ඉක්මනින් එනවා සුද්දීයේ උඹව බලන්න ආයෙම. ඒ එනකල් පරිස්සමින් ඉන්න"

හිතේ පිරුණු ආදරය හා ඒ ආදරය එක්ක රුඳුනු බලාපොරොත්තු එක්ක අකලංක හිතද්දී ඒ සුන්දර ගමේ ගත කරපු ආදරණීය කාලයට සමු දෙමින් නැවත පැමිණෙන බලාපොරොත්තු එක්ක හිතට සැනසුමක් ලබා දෙද්දී තිදස් සුක්කානම අතට ගත්තේ දිගු සුසුමක් වා තලයට මුසු කරමිනි.

නිමි......